# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2447/50 - 2025 ජූලි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2025.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

**ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ අනාවරණය කර ගැනීම, හඳුනාගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටිය**

ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ අනාවරණය කර ගැනීම, හඳුනාගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම පිළිබඳව ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටිය අදාළ සියලු පාර්ශවයන්ට විධිමත්ව ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි මෙසේ ප්‍රකාශයට පත් කරමි.

**ආනන්ද විජේපාල (පා.ම),**
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය.

ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ අනාවරණය කර ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය නීතිය ක්‍රියාත්මක කිරීමට සහ ළමා ආරක්ෂාවට අදාළ විවිධ විෂයයන් හා සම්බන්ධ බොහෝ පාර්ශ්වකරුවන්, විශේෂඥයින් සහ ප්‍රවීණයින් සමග සහයෝගයෙන් යුතුව මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් සකස් කරන ලදී.මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය අනාගතවාදී වන බව පමණක් නොව, සන්දර්භානුකූලව ක්‍රියාත්මක කළ හැකි වන බව ද සහතික කිරීම සඳහා දැඩි කැපවීමෙන් සහ වගකීමෙන් යුතුව කටයුතු කරමින් ලබා දෙන ලද ඉමහත් සහයෝගය වෙනුවෙන් පොලිස් කාන්තා හා ළමා කාර්යාංශය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විවිධ ඒකක වැනි සියලුම පොලිස් ඒකක සහ අංශවලට අපගේ කෘතඥතාවය පළකර සිටින්නෙමු. එමෙන්ම, සාර්ථකව මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අමාත්‍යාංශය සමග මහත් උද්‍යෝගයෙන් යුතුව කටයුතු කළ අපගේ ප්‍රධාන තාක්ෂණික හවුල්කරුවන‘සේව් ද චිල්ඩ්‍රන්’සංවිධානයට ද අපගේ හද පිරි ස්තුතිය පුදකර සිටින්නෙමු. එයට අමතරව, මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය සකස් කිරීම සඳහා කැඳවන ලද තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම, මේ සඳහා පරිපූර්ණ සහ උපදේශාත්මක ක්‍රියාවලියක් සහතික කිරීම පිණිස වෙහෙස නොබලා කටයුතු කළහ. මෙම තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමේ බොහෝ සාමාජිකයින් මිනිස් වෙළෙඳාම් වලට එරෙහි කාර්ය සාධක බලකායේ නියෝජිතයන් වූ අතර, මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය සකස් කිරීම සඳහා ඔවුන් විසින් ලබා දෙන ලද සහයෝගය ඉතා අගය කොට සලකන්නෙමු.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම සම්මත මෙහෙයුම් පටිපාටි වල සයිබර් අපරාධ අංග සඳහා ප්‍රධානම තාක්ෂණික සම්පත ලෙස භාවිතා කරන ලද්දේ ඉන්දියාවේ දත්ත ආරක්ෂණ කවුන්සිලය විසින් සකස් කරන ලද සයිබර් අපරාධ විමර්ශන අත්පොතය. මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය සැකසීමේ දී එම සම්පත් මූලාශ්‍රය විසින් සපයා දෙන ලද තාක්ෂණික මග පෙන්වීම සහ මාර්ගෝපදේශ අපි ගෞරවයෙන් යුතුව පිළිගැනීමට ලක් කරන්නෙමු.

ඉතා උසස් උපදේශන ක්‍රියාවලියක් සහතික කරමින් මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය ලේඛනගත කිරීම සඳහා කාලය කැප කරමින් ඉටු කළ මහගු කාර්යය වෙනුවෙන් අපගේ උපදේශකයින්ට අපි කෘතඥතාවය පළ කරන්නෙමු. අවසාන වශයෙන්, මෙම සම්මත මෙහෙයුම් පටිපාටියය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා සන්නිවේදන, සම්බන්ධීකරණ, පරිපාලන ආදී කටයුතු සඳහා සහාය දැක්වූ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට ද අපගේ හෘදයාංගම ස්තූතිය පුද කරන්නෙමු.

එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ 'මිනිස් වෙළෙඳාම මර්දනය කිරීම සඳහා වන කාර්යාලය' විසින් සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය හරහා මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය සකස් කිරීමට අවශ්‍ය මූල්‍ය ආධාර නොමසුරුව සපයා දෙන ලදී.

| | | |
|---|---|---|
| ඩී.ඩබ්.ආර්.බී. සෙනෙවිරත්න | - | ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය |
| ජූලියන් වෙල්ලප්පා | - | මෙරට කටයුතු භාර අධ්‍යක්ෂ, සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා. |

තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම :

| | | |
|---|---|---|
| වියානි ගුණතිලක | - | තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමේ ප්‍රධානී, හිටපු ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය |
| ටී.වී.ඩී. දමයන්ති එස්. කරුණාරත්න | - | තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමේ සම-ප්‍රධානී, අතිරේක ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය |
| චෛතිය ගුණසේකර | - | අතිරේක සොලිසිටර් ජෙනරාල්, නීතිපති දෙපාර්තමේන්තුව - ළමා ආරක්ෂක ඒකකය |
| ගයානි කෞෂල්‍යා විජේසිංහ | - | කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| නියෝජ්‍ය පොලිස්පති රේණුකා ජයසුන්දර | - | ශ්‍රී ලංකා පොලීසියේ කාන්තා හා ළමා අපචාර විමර්ශන ඒකකයේ ප්‍රධානී |
| මහේෂිකා සිල්වා | - | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්, නීතිපති දෙපාර්තමේන්තුව |
| මයුරි ආර්. පෙරේරා | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය |
| ප්‍රීතිකා සකලසූරිය | - | අධ්‍යක්ෂ/නීති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය |
| දිමුතු අබේවර්ධන | - | මේජර්, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය, සම්බන්ධීකරණ කමිටුවේ සාමාජික, ජාතික මිනිස් වෙළෙඳාම් මැඩලීමේ කාර්ය සාධක බලකාය, ආරක්ෂක අමාත්‍යාංශය |
| අධ්‍යක්ෂ | - | අපරාධ කොට්ඨාසය, ශ්‍රී ලංකා පොලීසිය |
| අධ්‍යක්ෂ | - | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID), ශ්‍රී ලංකා පොලීසිය |
| අධ්‍යක්ෂ/නීති | - | ශ්‍රී ලංකා පොලීසිය |
| අධ්‍යක්ෂ | - | මිනිස් වෙළෙඳාම්, වෙළෙඳාම් විමර්ශන සහ සමුද්‍රීය අපරාධ විමර්ශන කොට්ඨාසය, ශ්‍රී ලංකා පොලීසිය |
| අධ්‍යක්ෂ | - | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නීතිවිරෝධී දේපළ හා වත්කම් විමර්ශන කොට්ඨාසය, ශ්‍රී ලංකා පොලීසිය |
| අධ්‍යක්ෂ | - | පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය, ශ්‍රී ලංකා පොලීසිය |
| අධ්‍යක්ෂ | - | ත්‍රස්තවාදය වැළැක්වීමේ සහ විමර්ශන අංශය, ශ්‍රී ලංකා පොලීසිය |
| අජිත් තෙන්නකෝන් | - | ප්‍රධානී, අධිකරණ වෛද්‍ය සහ විෂවේද ආයතනය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය (හිටපු අධිකරණ වෛද්‍ය නිලධාරි) |
| වී.ජේ.බී. බණ්ඩාරනායක | - | රජයේ ජ්‍යෙෂ්ඨ රස පරීක්ෂක අධිකරණ වෛද්‍ය මස්තු විද්‍යා හා ඩී.එන්.ඒ., රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව |
| ජේ.එම්.ආර්. ජයතිලක / කේ.කේ. අප්සරා | - | සැකකටයුතු ලේඛන පරීක්ෂක, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව |
| අධ්‍යක්ෂ ජනරාල් | - | අපරාධවලට වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ ජාතික අධිකාරිය |
| එම්.ආර්. ලතීෆ් | - | විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, අපරාධ සහ සංවිධානාත්මක අපරාධ කොට්ඨාසය සහ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය, සහ සේනා විධායක - විශේෂ කාර්ය බලකාය, ශ්‍රී ලංකා පොලීසිය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| අමිල පෙරේරා | - | කළමනාකරණ අධ්‍යක්ෂ - ෆීනික්ස් අයි.ටී. ලංකා (ඩිජිටල් සයිබර් වෝහාරික විශේෂඥ) |
| රනීෂා ද සිල්වා | - | මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහාය විශේෂඥ සහ ව්‍යාපෘති කළමනාකරු, ශ්‍රී යෙසිඩි ෆවුන්ඩේෂන්, ඉරාකය |
| මිනෝලි පී. දොන් | - | ප්‍රධානී ආරක්ෂණ ඒකකය, සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOM) - ශ්‍රී ලංකාව |
| මිෂෙල් බර්මන් | - | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති සම්බන්ධීකාරක - වෙළෙඳාම් මැඩලීම්, ආරක්ෂණ ඒකකය, සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOM) - ශ්‍රී ලංකාව<br>මිනිස් වෙළෙඳාම් සහ සංක්‍රමණිකයන් වෙළඳාම් කිරීම පිළිබඳ ඒකකය, ජාත්‍යන්තර පොලීසිය, ලියොන්, ප්‍රංශය |
| බුද්ධිනී විතාන | - | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ උපදේශක - ළමා ආරක්ෂාව සහ ව්‍යාපාර තුළ ළමා අයිතිවාසිකම්, සේව් ද චිල්ඩ්‍රන් ඉන්ටර්නැෂනල් - ශ්‍රී ලංකාව |
| ජනනී චන්ද්‍රමෝහන් | - | තාක්ෂණ උපදේශක - මානසික සෞඛ්‍ය, මනෝ-සමාජීය සහාය සහ ළමා සහභාගීත්වය, සේව් ද චිල්ඩ්‍රන් ඉන්ටර්නැෂනල් - ශ්‍රී ලංකාව |
| සුෂේතා ගොපල්ලව | - | ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වෙළෙඳාම් මැඩලීම්, සේව් ද චිල්ඩ්‍රන් ඉන්ටර්නැෂනල් - ශ්‍රී ලංකාව |

**කෙටි යෙදුම්**

| | | |
|---|---|---|
| AGD | - | නීතිපති දෙපාර්තමේන්තුව |
| CCID | - | පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය |
| CID | - | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| CRC | - | ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (1989) |
| CSAM | - | ළමයින් ලිංගික අපයෝජනයට ලක්කරන ද්‍රව්‍ය |
| CSEM | - | ළමයින් ලිංගික සූරාකෑමට ලක්කරන ද්‍රව්‍ය |
| CSO | - | සිවිල් සමාජ සංවිධාන |
| CYPO | - | ළමයින් සහ තරුණ තැනැත්තන් ආඥාපනත |
| CWB | - | ළමා හා කාන්තා කාර්යාංශය |
| EU | - | යුරෝපා සංගමය |
| FIR | - | පළමු තොරතුරු වාර්තා කිරීම |
| HC | - | මහාධිකරණය |
| HRC | - | මානව හිමිකම් කවුන්සිලය |
| ICSE | - | ජාත්‍යන්තර ළමා ලිංගික සූරාකෑම (දත්ත සංචිතය) |
| ILO | - | ජාත්‍යන්තර කම්කරු සංවිධානය |
| INTERPOL | - | ජාත්‍යන්තර අපරාධ පොලිස් සංවිධානය |
| IO | - | විමර්ශන නිලධාරි |
| IOM | - | සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය |
| JMO | - | අධිකරණ වෛද්‍ය නිලධාරි |
| MLEF | - | වෛද්‍ය-නීතික පරීක්ෂණ ආකෘතිපත්‍රය |
| MLR | - | වෛද්‍ය-නීතික වාර්තාව |
| MoPS | - | මහජන ආරක්ෂක අමාත්‍යාංශය |
| NAHTTF | - | මිනිස් වෙළඳාම් වලට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය |
| NCMEC | - | අතුරුදහන් වූ සහ සූරාකෑමට ලක් වූ ළමයින් සඳහා වන ජාතික මධ්‍යස්ථානය |
| NCPA | - | ජාතික ළමාරක්ෂක අධිකාරිය |
| NGO | - | රාජ්‍ය නොවන සංවිධානය |
| PO | - | පරිවාස නිලධාරි |
| SAARC | - | දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමය |
| SC | - | ශ්‍රේෂ්ඨාධිකරණය |
| SOCO | - | අපරාධ ස්ථාන විමර්ශන නිලධාරියා |
| SOP | - | සම්මත මෙහෙයුම් පටිපාටිය |

| | | |
|---|---|---|
| TIP | - | පුද්ගලයන් වෙළඳාම් කිරීම |
| UN | - | එක්සත් ජාතීන්ගේ සංවිධානය |
| UNHCR | - | සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් |
| UNICEF | - | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල |
| UNCRC | - | එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය |
| UNDHR | - | මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය |
| UNODC | - | මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය |
| UNTOC | - | දේශාන්තර සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය |
| VoT | - | වෙළෙඳාම්වල වින්දිතයා |
| WHO | - | ලෝක සෞඛ්‍ය සංවිධානය |

පටුන


පෙරවදන
විධායක සාරාංශය

1. හැඳින්වීම ........ 8
 1.1 පසුබිම
 1.2 ළමයින් වෙළෙඳාම් කිරීමේ අපරාධය
 1.3 පුද්ගලයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති රාමුව ........ 10
 1.4 පුද්ගලයින් වෙළෙඳාම් කිරීම පිළිබඳ නෛතික රාමුව ........ 11

2. සම්මත මෙහෙයුම් පටිපාටිය ........ 12

 2.1 පළමුවෙනි අදියර - අනාවරණය කර ගැනීම සහ ගලවා ගැනීම
  2.1.1 පළමු තොරතුරු වාර්තා කිරීම / පැමිණිලි
  2.1.2 ගලවා ගැනීම ........ 13
  2.1.3 මූලික පරීක්ෂා කිරීම ........ 15
  2.1.4 හදිසි අවශ්‍යතා හඳුනා ගැනීම / වින්දිතයින්ට සේවා (වාසස්ථාන ඇතුළු) සපයන්නන් වෙත තොරතුරු සපයා දීම ........ 17
  2.1.5 සෞඛ්‍ය සේවා වෙත යොමු කිරීම ........ 18
  2.1.6 ළමයා අධිකරණයට ඉදිරිපත් කිරීම
  2.1.7 යෝග්‍ය පුද්ගලයෙකුගේ භාරයට පත්කිරීමේ නියෝගය ........ 19
  2.1.8 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය සමග සම්බන්ධීකරණය කිරීම

 2.2 දෙවෙනි අදියර - විමර්ශනය කිරීම ........ 20
  2.2.1 විමර්ශනය සැලසුම් කිරීම
  2.2.2 ළමා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සමග සම්මුඛ සාකච්ඡා කිරීම ........ 21
  2.2.3 විමර්ශන සැලැස්ම සමාලෝචනය කිරීම ........ 22
  2.2.4 වැඩිදුර විමර්ශන සිදු කිරීම
   2.2.4.1 වත්කම් අත්හිටුවීම / රාජසන්තක කිරීම ........ 23
   2.2.4.2 වැරදි හඳුනා ගැනීම - ළමයින් වෙළෙඳාම් කිරීමේ මූලික ලක්ෂණ තහවුරු කර ගැනීම
   2.2.4.3 සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම සහ ඔවුන් අත්අඩංගුවට ගැනීම ........ 26
   2.2.4.4 සාක්ෂිවල සාරාංශයක් සහිත ‘බී’ වාර්තාව සකස් කිරීම ........ 27
   2.2.4.5 මහේස්ත්‍රාත් හමුවට පැමිණවීම (‘බී’ වාර්තාව සමග)
   2.2.4.6 රිමාන්ඩ් භාරයේ තැබීම සහ ඇප දීම
   2.2.4.7 විදේශ රටවල සිටින සැකකරුවන් සොයා ගැනීම සහ අත්අඩංගුවට ගැනීම

 2.3 තුන් වෙනි අදියර - විභාග කිරීම ........ 30
  2.3.1 චෝදනා ගොනු කිරීම - නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීම

2.3.2 අධිචෝදනා ගොනු කිරීම ........ 31
2.3.3 පුද්ගලික නීති නියෝජනය / නීති ආධාර
2.3.4 විභාග කිරීමේ ක්‍රියාවලිය ........ 32
2.3.5 ශ්‍රී ලංකාවේ සිට සහ ශ්‍රී ලංකාවට වින්දිත ළමයින් ආපසු යැවීම / ගෙන ඒම ........ 34
2.3.6 වින්දිත ළමයින් නැවත වින්දතභාවයට පත්වීම සහ තවදුරටත් හිංසනයට ලක්වීම වැළැක්වීම ........ 35

**3. ළමයින්ට එරෙහි සයිබර් අපරාධ ........ 36**

3.1 ළමයින්ට එරෙහි සයිබර් අපරාධ වර්ග

3.2 සයිබර් අපරාධ පිළිබඳව ශ්‍රී ලංකාවේ පවතින නීති රාමුව ........ 37

3.3 සයිබර් අපරාධ විමර්ශනයක අදියර ........ 38
3.3.1 පළමු තොරතුරු
3.3.2 පූර්ව-විමර්ශන ඇගයීම
3.3.2.1 අපරාධය හඳුනාගැනීම ........ 39
3.3.2.2 තාක්ෂණික ඇගයීම
3.3.3 සාක්ෂි රැස්කිරීම ........ 42
3.3.3.1 අපරාධ ස්ථානයට ආරක්ෂාව සැලසීම
3.3.3.2 සිද්ධිය / අපරාධය සීමා කිරීම ........ 43
3.3.3.3 සාක්ෂි ලේබල් කිරීම සහ ලේඛනගත කිරීම ........ 44
3.3.3.4 සාක්ෂි වෙනස් කිරීම වැළැක්වීම
3.3.3.5 උපාංග අත්අඩංගුවට ගැනීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම
3.3.3.6 දත්ත ගබඩා කරන උපාංග හැසිරවීම ........ 45
3.3.3.7 වෝහාරික පිටපත් කිරීම
3.3.4 අපරාධ ස්ථානයේ දී සිදු කරන මූලික සම්මුඛ සාකච්ඡා
3.3.5 ඩිජිටල් වෝහාරික විශ්ලේෂණය ........ 46

3.4. විශේෂඥ සයිබර් අපරාධ විමර්ශනය කිරීමේ ආයතන

4. සම්මත මෙහෙයුම් පටිපාටිය ක්‍රියාත්මක කිරීම ........ 48
4.1 සම්බන්ධීකරණය
4.2 යාවත්කාලීන කිරීම සහ සමාලෝචනය
4.3 හැකියා සංවර්ධනය කිරීම
4.4 සම්මත මෙහෙයුම් පටිපාටිය ක්‍රියාත්මක කිරීම, සහාය දීම සහ අධීක්ෂණය කිරීම

ඇමුණුම්

ඇමුණුම 1 - ළමයින් වෙළෙඳාම් කිරීමේ අපරාධයේ මූලිකාංග අවබෝධ කර ගැනීම
ඇමුණුම 2 - ප්‍රධාන පාරිභාෂික වචන ........ 53
ඇමුණුම 3 - පුද්ගලයින් වෙළෙඳාම් කිරීම සහ ළමයින් වෙළෙඳාම් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සහ ජාතික නීති රාමුව ........ 56
ඇමුණුම 4 - මහජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිණිස නීතිය ........ 64
බලාත්මක කිරීමේ බලධාරීන් සඳහා වන ශ්‍රේෂ්ඨාධිකරණයේ මාර්ගෝපදේශ (ශ්‍රේෂ්ඨාධිකරණය (මූ.අ.)
අයැදුම් අංක 677/2012 - 11/06/2019)

## පෙරවදන

ළමයින් වෙළෙඳාම් කිරීම සහ ළමයින්ට එරෙහි සංවිධානාත්මක අපරාධ වඩාත්ම බරපතල ම මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට අයත් වන අතර, ඒ සඳහා ඒකාබද්ධ, උපායමාර්ගික සහ සහයෝගීත්වයෙන් යුතු ප්‍රතිචාර දැක්වීමක් අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව තුළ මෙම අපරාධවලින් ඇතිවන විනාශකාරී බලපෑමහඳුනා ගැනීම වැඩිදියුණු වීමත් සමග ළමයින් වෙළෙඳාම් කිරීම ඵලදායී ලෙස මැඩපැවැත්වීම සඳහා ශක්තිමත් රාමුවක හදිසි අවශ්‍යතාවයක් නිර්මාණය වී තිබේ. ‘ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ අනාවරණය කර ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටිය’නැමති මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය එම අභියෝගවලට මුහුණ දීමේ ඉතා වැදගත් ඉදිරි පියවරක් වේ.

‘සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා’ සංවිධානය සමග එක්ව මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් සකස් කරන ලද මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය, පුද්ගලයින් වෙළෙඳාම් කරනු ලැබීමට එරෙහිව සටන් කිරීමේ පුළුල් ජාතික උපාය මාර්ගයෙහි මූලික පදනම සකස් කරයි. මෙම ලියවිල්ල ශ්‍රී ලංකාවේ මිනිස් වෙළෙඳාම් මැඩපැවැත්වීමේ යාන්ත්‍රණවල තිබෙන අඩුපාඩු පියවා ගැනීම සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් එකට එක් කරන සාමූහිකයක් වන මිනිස් වෙළෙඳාම් මැඩලීමේ ජාතික  කාර්ය සාධක බලකාය විසින් දරනු ලබන ප්‍රයත්නයන්හිඅතිශය වැදගත් අංගයක් වේ. මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය සකස් කිරීම ‘මිනිස් වෙළෙඳාම් වල වින්දිතයන් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ යොමු කිරීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය (2014)’ සහ ‘වෙළෙඳාම්වල වින්දිතයන් වන ළමයින් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ යොමු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සටහන (2021)’ සකස් කිරීම ඇතුළුවීමේ සම්බන්ධයෙන් පූර්වයෙන් ගෙන ඇති පියවර වලට අතිරේක ක්‍රියාමාර්ගයක් වේ.

ශ්‍රී ලංකා පොලීසියේ මූලික ම සම්බන්ධීකරණ ආයතනය වන මහජන ආරක්ෂක අමාත්‍යාංශය ළමයින් වෙළෙඳාම් කරනු ලැබීම පිළිබඳ සිද්ධීන් හඳුනා ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා රට පුරා තිබෙන නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සියල්ල ම විසින් ඒකාබද්ධ හා කාර්යක්ෂම ප්‍රවේශයක් අනුගමනය කරනු ලබන බව සහතික කිරීම සඳහා අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය සහ පුද්ගලයින් වෙළෙඳාම් කරනු ලැබීමේ අපරාධ විමර්ශනය කරන අනෙකුත් පොලිස් ඒකක සවිබල ගැන්වීම මගින් අමාත්‍යාංශයළමා අයිතිවාසිකම් තහවුරු කිරීමට සහ වින්දිතයන්ට යුක්තිය ඉටුවන බව සහතික කිරීමට ඇති ස්වකීය කැපවීම තවත් ශක්තිමත් කරයි. විමර්ශන සිදු කිරීමේ දියුණු තාක්ෂණික ක්‍රම ඒකාබද්ධ කිරීම, සියලු අංශ අතර සහයෝගිත්වය වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ කාර්යපටිපාටිය ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූල කිරීම මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය යටතේ දරනු ලබන සහයෝගීත්වයෙන් යුතු ප්‍රයත්නයන්හි අරමුණ වේ.

මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය මගින් ළමයින් වෙළෙඳාම් කිරීම් ළමයින්ට එරෙහි වෙනත් ආකාරවල අපරාධවලින් වෙන්කර හඳුනා ගැනීමේ වැදගත්කම ද අවධාරණය කරයි. බඳවා ගැනීමේ උපක්‍රමවල සිට නවාතැන් දීම සහ උපායට හසුකර ගැනීමේ ක්‍රම දක්වා වූ ළමයින් සූරාකනු ලැබීමේ විවිධ තත්ත්වයන් අනාවරණය කර ගැනීම සඳහා විශේෂිත විමර්ශන උපාය මාර්ග අවශ්‍ය කරන බව එමගින් හඳුනා ගනු ලබයි. නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් ස්වකීය ප්‍රතිචාර මෙම විශේෂිත තත්ත්වයන්ට යෝග්‍ය වන ආකාරයට සකස් කර ගැනීම සඳහා අවශ්‍ය කරන මෙවලම් වලින් සන්නද්ධ කිරීම මගින් අපට වෙළෙඳාම්කරුවන්ව හඳුනා ගැනීම සහ සිරභාරයට ගැනීම වැඩිදියුණු කළ හැකි අතර, මෙම සාහසික අපරාධවලට එරෙහිව නඩු පැවරීම ශක්තිමත් කළ හැක.

රාජ්‍ය නොවන සේවා සපයන්නන් සමග එක්ව, මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ එයට අනුබද්ධ ආයතන, සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි සාමාජිකයන් වන අපගේ ළමයින්ව ආරක්ෂාකර ගැනීමේඅතිශය වැදගත් අවශ්‍යතාවය හඳුනා ගෙන ඇත. මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය සැලසුම් කර ඇත්තේ අපරාධකරුවන්ව යුක්තිය ඉදිරියට ගෙන ඒම සඳහා පමණක් නොව, වින්දිතභාවයට පත්වන සෑම ළමයෙකුටම මෙම ක්‍රියාවලිය පුරාවට ආරක්ෂාව සහ සහාය සපයා දෙනු ලබන බව සහතික කිරීම සඳහා ය. මෙම ක්‍රියාමාර්ග මගින් ව්‍යුහගත, ප්‍රමිතිකරණය කළ සහ ළමා අයිතිවාසිකම්වලට අනුකූල වූ ප්‍රවේශයක් හරහා සෑම විමර්ශනයක දී ම සහ නඩු පැවරීමකදීම ළමයාගේ උපරිම යහපතට ප්‍රමුඛත්වය ලබා දෙන පරිසරයක් නිර්මාණය කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

අපි මෙම වැදගත් ඉදිරි පියවර තබනා මෙම අවස්ථාවේ, එවකට මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම් වියානි ගුණතිලක මහතාට සහ අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්) දමයන්ති එස්. කරුණාරත්න මහත්මියට සහ සංවර්ධන අංශයේ සේවය කරන එතුමියගේ කණ්ඩායමටත්,ශ්‍රී ලංකා පොලීසියේ කාන්තා හා ළමා අපයෝජන විමර්ශන දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති රේණුකා ජයසුන්දර මහත්මියට සහ විශේෂයෙන් ම කාන්තා හා ළමා කාර්යාංශයේ ඇයගේ කණ්ඩායමටත් මාගේ හෘදයාංගම කෘතඥතාවය පුදකර සිටිමි. එමෙන්ම, සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා සංවිධානයට සහ එහි කණ්ඩායමට, සේව් ද චිල්ඩ්‍රන් ඉන්ටර්නැෂනල් - ශ්‍රී ලංකා සංවිධානයේ, ළමා ආරක්ෂාව සහ ව්‍යාපාර තුල ළමා අයිතිවාසිකම් පිළිබඳ ජ්‍යෙෂ්ඨ තාක්ෂණ උපදේශක බුද්ධිනී විතාන මහත්මියට, සේව් ද චිල්ඩ්‍රන් ඉන්ටර්නැෂනල් - ශ්‍රී ලංකා සංවිධානයේ, වෙළෙඳාම් මැඩලීම පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමණාකරු සුෂේත ගොපල්ලව මහත්මිය සහ මෙම වැඩසටහන සඳහා දායකත්වය දැක්වූ සියලුම පාර්ශවකරුවන්ට ද මාගේ විශේෂ ස්තුතිය පුද කරමි. මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය වින්දිතයින්ට බලාපොරොත්තුවේ ආලෝකයක් වේවා යන්න සහ ශ්‍රී ලංකාවේ ළමයින් වෙළෙඳාම් කරනු ලැබීමේ

උවදුර මර්දනය කිරීමට සටන් කරන නීතිය ක්‍රියාත්මක කරන බලධාරින්ට ප්‍රබල මෙවලමක් ලෙස උපකාරී වේවා යන්න මාගේ පැතුම වේ.

ඩී.ඩබ්.ආර්.බී. සෙනෙවිරත්න,
ලේකම්,

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රී ලංකාව.

විධායක සාරාංශය

ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ අනාවරණය කර ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටිය"පුද්ගලයන් වෙළෙඳාම් කිරීම මර්දනය කිරීම සහ වැඩි බලපෑමක් ඇති කිරීම සඳහා රජයේ සහ සිවිල් සමාජ සංවිධානවල ශක්‍යතාව වැඩිදියුණු කිරීම" නැමති ව්‍යාපෘතිය යටතේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ සහ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහ මූල්‍ය සහයෝගය මත සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා සමග එක්ව මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් සකස් කරන ලදී. මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය මිනිස් වෙළෙඳාම ට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය සහ එහි රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන්ගේ එකමුතුව එකට එක්ව කටයුතු කරමින් පුද්ගලයන් වෙළෙඳාම් කිරීමට එරෙහි වැඩපිළිවෙළවල හඳුනාගන්නා ලද අඩුපාඩු විසඳීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වල ප්‍රධාන අංගයක් වේ.

මෙම සම්මත මෙහෙයුම් පටිපාටියයි, දැනට තිබෙන, 2014 වර්ෂයේ දී රජය විසින් සකස් කර අනුමත කරන ලද **"වෙළෙඳාම් වල වින්දිතයන් වූවන් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ යොමු කිරීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටියට සහ 2021 වර්ෂයේ දී සකස් කර** අනුමත කරන ලද "වෙළෙඳාම් වල වින්දිතයන් වූ **ළමයින් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ යොමු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සටහනට"** අනුපූරක වේ.

වෙළෙඳාම් අපරාධ හඳුනා ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම, ළමයින් වෙළෙඳාම් කිරීම ළමයින්ට එරෙහි වෙනත් අපරාධවලින් වෙන්කර හඳුනා ගැනීම සහ ළමයින් වෙළෙඳාම් කිරීම විමර්ශනය කිරීම සඳහා ඵලදායී හා යාවත්කාලීන වූ කාර්ය පටිපාටියය හඳුන්වාදීමේ අවශ්‍යතාවය වැඩි කිරීමේ ප්‍රයත්නයන්හි කොටසක් ලෙස, ශ්‍රී ලංකා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය සහ පුද්ගලයින් වෙළෙඳාම් කිරීම පිළිබඳ විමර්ශන සිදු කරන අනෙකුත් පොලිස් ඒකක, ළමයින් වෙළෙඳාම් කිරීමේ සිද්ධීන් පිළිබඳ පරීක්ෂා කිරීමට සහ හඳුනා ගැනීමට, විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට නීතිය ක්‍රියාත්මක කරන බලධාරින්ට උපකාර කිරීම පිණිස මෙවැනි සම්මත මෙහෙයුම් පටිපාටිය සකස් කර තිබීමේ අවශ්‍යතාවය නැවත අවධාරණය කළහ.

වෙනත් රටවල ළමයින්ට එරෙහි සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් පවතින විමර්ශන කාර්ය පටිපාටියය පිළිබඳ කෙටි සමාලෝචනයක් මගින් ද මෙම අපරාධ මැඩලීම සඳහා මෙන්ම ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පටිපාටියයවල පවතින අඩුපාඩු විසඳීම සඳහා ද තාක්ෂණයේ දියුණුවට සමගාමීව දියුණු හා සංකීර්ණ විමර්ශන ක්‍රම හඳුන්වාදීමේ අවශ්‍යතාවය ගෝලීය වශයෙන් හඳුනාගෙන ඇත.

සමස්ත ක්‍රියාවලිය පුරාම, අවදානමට ලක්විය හැකි ළමයින් ආරක්ෂා කිරීමත්,පුද්ගලයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ නීති යටතේ අපරාධකරුවන්ට නඩු පැවරීමත් සහතික කරමින්, ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත ළමයින් වෙළෙඳාම් කිරීම් ඵලදායී ලෙස හඳුනා ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා පැහැදිලි ක්‍රියාවලියක් සහ කාර්ය පටිපාටියක් ඉදිරිපත් කිරීම මෙහි අවසාන ඉලක්කය වේ.

ළමයින් සූරාකෑමේ සෑම ස්වරූපයකම විවිධ වූ බඳවා ගැනීමේ උපක්‍රම, පුහුණු කිරීමේ ක්‍රියාවලීන් සහ උපායට හසුකර ගැනීමේ උපක්‍රම තිබෙන බැවින්, නීතිය ක්‍රියාත්මක කරන බලධාරින්ට මෙම විශේෂිත ලක්ෂණ අනුව විමර්ශන උපාය මාර්ග සකස් කිරීම මගින්වෙළෙඳාම් කරුවන් හඳුනා ගැනීමේ සහ අත්අඩංගුවට ගැනීමේ අවස්ථා වැඩි දියුණු කර ගත හැක.

මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය තුළ මූලික කාර්යභාරය පැවරෙනුයේ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයට ය. කෙසේ වෙතත්, සාර්ථක හා කාර්යක්ෂම විමර්ශන කාර්යයක් ඉටු කිරීම පිණිස, කාන්තා හා ළමා කාර්යාංශය ප්‍රමිතිගත කරන ලද, අපරාධ විමර්ශනය පාලනය කෙරන නීති ප්‍රකාර වූ,ළමා අයිතිවාසිකම්වලට අනුකූල වූ සහ ජාත්‍යන්තර යහ පරිචයන් පිළිබිඹු කරන්නා වූ, ව්‍යුහගත සහ

ලේඛනගත මෙහෙයුම් කාර්ය පටිපාටියයකට අනුව ක්‍රියාත්මක විය යුතු වේ. එමෙන්ම, ළමා හා කාන්තා කාර්යාංශය විමර්ශනවල, නඩු පැවරීමෙහි සහ අපරාධයේ වින්දිතයා වන ළමයාගේ උපරිම යහපත සැලසීමෙහි සාර්ථකත්වය සහතික කිරීම සඳහා අනෙකුත් අදාළ පොලිස් ඒකක, රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන, සහ රාජ්‍ය නොවන සේවා සපයන්නන් සමග සමීප සහයෝගයෙන් යුතුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

හැඳින්වීම

**1.1 පසුබිම**

පුද්ගලයින්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් සහ අභිමානය යටපත් කරන ක්‍රියාවන් වූ ශ්‍රමය ලබා ගැනීම සහ වාණිජ ලිංගික සූරාකෑම, ඉන්ද්‍රිය ඉවත් කිරීම, සිඟමන, දාසකම, වහල්භාවය වැනි භාවිතයන් සඳහා පුද්ගලයින් වෙළෙඳාම් කිරීම, නැතහොත් මිනිස් වෙළෙඳාම නූතන වහල්භාවයේ ස්වරූපයක් ලෙස සලකනු ලැබේ. විශේෂයෙන් ම, තාක්ෂණය භාවිතය වැඩිවීම, ගෝලීය මූල්‍ය අස්ථාවරත්වය සහ කොවිඩ් වැනි වසංගත පැතිරීම හේතුවෙන් මිනිස් වෙළෙඳාම සංකීර්ණ සංසිද්ධියක් බවට පත්ව ඇත. විවිධ ක්‍රියාකාරීන් සහ අපරාධකරුවන්ගේ ජාල මිනිසුන්ව සූරාකෑමේ තත්වයන්ට හසුකර ගැනීම පිණිස මෙම අස්ථාවරත්වය සහ මිනිසුන්ගේ ඉහළ ගොස් තිබෙන අවදානම්සහගත භාවය යොදා ගනු ලැබීම තුළින්නව ස්වරූපවල වෙළෙඳාම් ඉස්මතු වී ඇත.

මිනිස් වෙළඳාමෙහි වඩාත් අඳුරු පැත්ත වනුයේ ළමයින් වෙළෙඳාම් කිරීම වන අතර, ළමයින් ඉහළ අවදානම් සහගත තත්ත්වයක සිටින බැවින් ළමයින්ට අපරාධ ජාලයන්හි ඉලක්ක බවට පත්ව ඇත. ප්‍රමුඛත්වය දිය යුතු සහ හදිසි අවශ්‍යතාවයක් ලෙස ළමයින් වෙළෙඳාම් කිරීම වැළැක්වීම කෙරෙහි රටවල් දැන් අවධානය යොමු කරමින් සිටින අතර, වින්දිතභාවයට පත්වීම වැළැක්වීම, වින්දිතයන්ව ආරක්ෂා කිරීම සහ වින්දිතයන්ට උපකාර කිරීම, සහ එවැනි අපරාධ පිටුපස සිටින අපරාධකරුවන්ට එරෙහිව නීතිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම ඇතුළු ක්‍රියාමාර්ග ගැනීම එයට ඇතුළත් වේ.

පහත විස්තර කර ඇති සම්මත මෙහෙයුම් පටිපාටිය මගින් විමර්ශන නිලධාරින් විසින් අනුගමනය කළ යුතු නිශ්චිත පියවර සහිත සම්මත කාර්ය පටිපාටිය ස්ථාපනය කිරීමට සහ ළමයින් වෙළෙඳාම් කිරීමේ සිද්ධීන් සාර්ථක ලෙස හඳුනා ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා භාවිතා කළ යුතු යොමු කිරීම් සහ සහයෝගී ක්‍රියාවලි සහ යාන්ත්‍රණ සැකෙවින් විස්තර කිරීමට අරමුණු කර ඇත. ළමයින් අපයෝජන සහ සූරාකෑමේ තත්වයන්ට හසුකර ගැනීම සඳහා එම අපරාධ සිදු කරන පුද්ගලයින් සහ කණ්ඩායම් විසින් තාක්ෂණය වැඩි වැඩියෙන් භාවිතා කරනු ලබන තත්ත්වය සැලකීමේ දී මෙය විශේෂයෙන් වැදගත් වේ.

**1.2 ළමයින් වෙළෙඳාම් කිරීමේ අපරාධය**

ළමයින්වෙළෙඳාම් කිරීම ලෝකයේ සෑම කලාපයකම පවතින බරපතල අපරාධයක් වන අතර, එමගින් ළමයකුගේ සෑම අයිතියක්ම පාහේ උල්ලංඝනය වෙයි. ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් ලබා දෙනු ලබන ඉහළ යමින් පවතින ප්‍රමුඛතාවය සහ ළමයින් වෙළෙඳාම් කිරීමේ ගැටලුව විසඳීමේ හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, ළමයින් වින්දිතයින් බවට පත්වීම වැළැක්වීම, ළමයින් ආරක්ෂා කිරීම සහ ළමයින්ට උපකාර කිරීම සඳහාත්,එම අපරාධවලට එරෙහිව නීතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහාත් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ළමයින් වෙළෙඳාම් කිරීමෙහි සූරාකෑමේ අරමුණු බොහෝ විට බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම, ලිංගික ක්‍රියාවලට යොදා ගැනීම සහ ළමා ලිංගික අපයෝජන ද්‍රව්‍ය නිපදවීම, ළමයින් සජීවී මාර්ගගත ලිංගික ප්‍රවර්ධන වේදිකාවලට යොදා ගැනීම ඇතුළු වෙනත් ආකාරයේ ලිංගික සූරාකෑම්වලට යොදා ගැනීම, සිඟමනෙහි යෙදවීම සහ දරුකමට හදා ගැනීම වේ.ළමා ශ්‍රමය ලබා ගැනීම ගෘහ සේවය, කෘෂිකාර්මික කටයුතුවල යෙදවීම, කුඩා පරිමාණ කර්මාන්තශාලා සහ සාප්පු වල සේවයෙහි යෙදවීම ඇතුළු බොහෝ ස්වරූප ගත හැක. ළමා ශ්‍රමය ලාභදායී සහ පාලනය කළ හැකි යැයි සලකනු ලබන බැවින් ඒ සඳහා ඇති ඉල්ලුම ද ඉහළ ය.

ළමයින්ව මත්ද්‍රව්‍ය වෙළෙඳාම ට ද යොදා ගනු ලබන අතර, එහිදී ඔවුන් මත්ද්‍රව්‍ය බෙදාහරින්නන් ලෙස හෝ වෙළෙන්දන් ලෙස යොදා ගනිමින් සූරාකෑමට ලක් කරනු ලබන අතර,ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි කර සූරාකෑමේ වෙළෙඳාම් චක්‍රයට තවදුරටත් හසු කර ගැනීම පිණිස ඔවුන් බලහත්කාරයෙන් මත්ද්‍රව්‍ය භාවිතා කිරීමට ද යොමු කරනු ලැබේ. මත්ද්‍රව්‍ය වෙළෙඳාම නීතිවිරෝධී වීම හේතුවෙන් බොහෝ විට ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වන ළමයින් අපරාධකරුවන් ලෙස සලකනු ලබන අතර,ඔවුන් වින්දිතයන් ලෙස හඳුනා නොගැනීම නිසා ඔවුන් නැවතත් වින්දිතභාවයට පත් වේ.

වයස අවුරුදු දහඅටට (18 ට) අඩු පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් මානසික හා ශාරීරික වශයෙන් බිය ගන්වා බලහත්කාරයෙන් සිඟමන් යැදීමට සැලැස්වීම ළමයින් සිඟමනෙහි යෙදවීමට අයත් වේ. පවුලේ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් සිඟමන් යැදීමෙහි නිරත

වන බව සහතික කර ගැනීම සඳහා දෙමව්පියන් විසින් ළමයාට බලකරනු ලබන තත්ත්වයන් තිබෙන බැවින් මෙය විශේෂයෙන් ම නියාමනය කිරීම දුෂ්කර ගැටළුවක් වේ. සිහමන් යැදීම සඳහා පුද්ගලයන් යොදවා, වින්දිතයාට ආදායමෙන් සුළු ප්‍රතිශතයක් ලබාදී විශාල ලෙස ලාභ උපයන 'යාචක හිමිකරුන්'ආදායම් ඉපැයීමේ මාර්ගයක් ලෙස සංවිධානාත්මක සිහමන යොදා ගැනීම සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතියි.

තවද, දරුකමට හදාගැනීම සඳහා ළමයින්ව මිලදී ගැනීම සහ/හෝ වෙළෙඳාම් කිරීම සිදුකළ හැක. ළමයින්ව බොහෝ විට ළමා නිවාසවලින් ලබාගැනීම, රෝහල්වලින් ලබා ගැනීම හෝ පැහැරගෙන යාම සිදු කරනු ලැබේ; *නැතහොත්* ළමයා සූරාකෑමේ අරමුණ ඇතිව ළමයාගේ භාරකාරත්වය අත්හැරීමට දෙමව්පියන්ව රැවටීම, පෙළඹවීම හෝ බියවැද්දීම සිදුකරනු ලැබිය හැක.

පුද්ගලයින්ව, විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමයින්වවෙළෙඳාම් කරනු ලැබීම වැළැක්වීම, මර්දනය කිරීම සහවෙළෙඳාම් කරුවන්ට දඬුවම් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (2000)[1] පුද්ගලයින්වෙළෙඳාම් කිරීම මෙසේ අර්ථ දක්වා ඇත:

"... තර්ජනය කිරීම හෝ බලය හෝ වෙනත් ආකාරයේ බලහත්කාරකමක් යොදා ගැනීම,පැහැරගැනීම, වංචාව, රැවටීම, බලය හෝ අවදානම් තත්ත්වය අනිසි ලෙස භාවිතා කිරීම හෝ වෙනත් පුද්ගලයෙකු පාලනය කරන පුද්ගලයෙකුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා මුදල් ගෙවීම හෝ ප්‍රතිලාභ ලබා දීම හෝ ලබා ගැනීම මගින් සූරාකෑමේ කාර්යය සඳහා පුද්ගලයන් බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, ස්ථානවලට මාරු කිරීම, නවාතැන් දීම හෝ භාර ගැනීම.සූරාකෑම යන්නට අවම වශයෙන්, අන් අයව ගණිකා වෘත්තියේ යෙදවීම හෝ වෙනත් ආකාරවල ලිංගික සූරාකෑම, බලහත්කාරයෙන් ශ්‍රමය හෝ සේවා ලබා ගැනීම, වහල් සේවය හෝ වහල් සේවය හා සමාන පිළිවෙත්,දාසකම හෝ අවයව ඉවත් කර ගැනීම ඇතුළත් විය යුතුය."

මෙය පුද්ගලයන් වෙළෙඳාම් කිරීම පිළිබඳව වඩාත් පුළුල් ලෙස පිළිගෙන ඇති නිර්වචනය වේ. බොහෝ රටවල් පුද්ගලයින් වෙළෙඳාම් කිරීමමර්දනය කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස මෙම නිර්වචනයට අනුකූලව ස්වකීය දේශීය නීති හඳුන්වා දී ඇත. පුද්ගලයෙකු ඇත්ත වශයෙන්ම පුද්ගල වෙළඳාමෙහි වින්දිතයෙක් වූ ළමයෙක්ද යන්න තීරණය කිරීම සඳහා "ළමයා" යන්නෙහි නීතිමය නිර්වචනය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. ඉහත සඳහන් කළ ප්‍රඥප්තියෙහි 3(ඈ) වගන්තිය මගින් 'ළමයා' යන්න "වයස අවුරුදු දහඅටට අඩු ඕනෑම පුද්ගලයෙක්"ලෙස නිර්වචනය කර ඇත.

**එම ප්‍රඥප්තියේ 3(ඇ) වගන්තිය මගින් ළමයින් වෙළෙඳාම් කිරීම පහත සඳහන් පරිදි අර්ථ දක්වා ඇත:**
"මෙම වගන්තියේ (අ) උප ඡේදයේ දක්වා ඇති කිසිදු ආකාරයක් මෙයට සම්බන්ධ නොවුවත්, සූරාකෑමේ අරමුණ ඇතිව ළමයෙකු බඳවා ගැනීම, ප්‍රවාහනය, ස්ථානවලට මාරු කිරීම, නවාතැන් දීම හෝ භාරගැනීම "පුද්ගලයින් වෙළෙඳාම් කිරීම" ලෙස සලකනු ලැබේ".

| ක්‍රියාව | අරමුණ | |
|---|---|---|
| | * පහත සඳහන් ක්‍රියා ඇතුළු සූරාකෑම: | |
| * බඳවා ගැනීම | * ගණිකා වෘත්තීයේ යෙදවීම | |
| * ප්‍රවාහනය කිරීම | * ලිංගික සූරාකෑම | = ළමයින් වෙළෙඳාම් කිරීම |
| * ස්ථානවලට මාරු කිරීම | * බලහත්කාරයෙන් වැඩ ගැනීම | |
| * නවාතැන් දීම | * වහල් සේවයේ යෙදවීම හෝ ඒ හා සමාන පිළිවෙත් | |
| * පුද්ගලයින් භාර ගැනීම | * අවයව ඉවත් කර ගැනීම | |
| | * වෙනත් ආකාරවල් සූරාකෑම් | |

ඉහත සඳහන් නිර්වචනයට අනුව, ළමයින් වෙළෙඳාම් කිරීමේ සිද්ධියක් නිශ්චය කිරීම පිණිස 'ක්‍රියාවෙහි' සහ සූරාකෑමේ 'අරමුණෙහි' අංග එකක් හෝ කිහිපයක් තිබෙන බව තහවුරු කිරීම පමණක් අවශ්‍ය වන බව සඳහන් කිරීම වැදගත් වේ. වෙළෙඳාම් කිරීමේ අපරාධයක් තහවුරු වී ඇත්නම්, වින්දිත ළමයෙකුගේ කැමැත්ත ලබාගෙන තිබීම අදාළ නොවන බැවින්, වැඩිහිටියන් සම්බන්ධයෙන් වන විට මෙන් නොව, කැමැත්ත ලබාගැනීම සඳහා භාවිතා කරන ලද 'ක්‍රම'තහවුරු කිරීම අවශ්‍ය නොවේ.

මිනිස් වෙළෙඳාම් සිද්ධියක් හඳුනා ගැනීමට උපකාරකර ගැනීම සඳහා එය පෙන්නුම් කරන ඇඟවීම් තිබේදැයි බැලීම ප්‍රයෝජනවත් වන අතර, ඒවායින් සමහරක් වින්දිතයින් විසින්ම ප්‍රකාශ කරන ලද පැහැදිලි සහ දෘශ්‍ය සලකුණු වේ. ඇතැම් විට අනෙකුත් ඇඟවීම් පැහැදිලිව පෙනෙන්නට නොතිබිය හැකි අතර, වැඩිදුර විමර්ශනය කරන තුරු ඒවා අනාවරණය නොවනු ඇත. වින්දිතයෙකු වෙළෙඳාම්

1. https://www.ohchr.org/en/instruments-mechanisms/instruments/protocol-prevent-suppress-and-punish-trafficking-persons

කරනු ලැබ තිබේද යන්න තීරණය කිරීම සඳහා හෝ මිනිස් වෙළෙඳාම් තත්වයන් තිබේදැයි නිලධාරියා සැක කරන්නේද යන්න තීරණය කිරීම සඳහා මෙම ඇඟවීම් මුල් අවස්ථාවේ දී ම හඳුනාගැනීම වැදගත් වේ. මුල් අවස්ථාවේ දීම මෙම ඇඟවීම් තිබීම හෝ නොතිබීම මගින් මිනිස් වෙළෙඳාම තහවුරු වන බව හෝ තහවුරු නොවන බව අදහස් නොවිය යුතු ය. කිසිදු ඇඟවීමක් තනිව එම තහවුරු කිරීම සිදු නොකරන බැවින් සියලුම දර්ශක සාමූහික ලෙස සලකා බැලිය යුතුය. මෙම නිර්වචන සමග එක් කර සැලකූ විට මෙම ඇඟවීම්මිනිස් වෙළෙඳාම් අපරාධ සහ ඒවායෙහි වින්දිතයන් හඳුනාගැනීමේ ක්‍රියාවලියට උපකාරීවෙයි.

මිනිස් වෙළෙඳාම බහු-මාන වන බැවින්, වෙළෙඳාම් කිරීමේ ක්‍රියාවලියේ ඕනෑම ක්‍රියාවක් තුළ වැරදිකරුවන් සහ වෙළෙඳාම් කරුවන් කිහිප දෙනෙකු එයට සම්බන්ධවී තිබිය හැක. මෙම අපරාධයේ දී පහත සඳහන් අයගෙන් ඕනෑම අයෙක් වැරදිකරුවෙක් විය හැක:

- බඳවා ගැනීම සිදුකරන පුද්ගලයා
- බඳවා ගැනීම සිදුකරන පුද්ගලයාගේ නියෝජිතයන්
- වෙළෙඳාම් කරන ලද පුද්ගලයෙකු විකුණන පුද්ගලයන්
- වෙළෙඳාම් කරන ලද පුද්ගලයෙකු මිලදී ගන්නා පුද්ගලයන්
- ප්‍රවාහනය කරන පුද්ගලයන්
- වෙළෙඳාම සඳහා කුමන්ත්‍රණය කරන පුද්ගලයන්
- වෙළෙඳාම සඳහා අනුබල දෙන පුද්ගලයන්
- ගනුදෙනුකරුවන් / සේවාදායකයින්
-

වෙළෙඳාම ට සම්බන්ධ වී සිටිය හැකි / සම්බන්ධ වී ඇති සියල්ලන් ම හඳුනා ගැනීමට හැකි වනු පිණිස විමර්ශන නිලධාරියා විසින් වෙළෙඳාම් ක්‍රියාවලිය පරීක්ෂා කර බැලිය යුතුය.

## 1.3 පුද්ගලයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති රාමුව

ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් ජාත්‍යන්තර නීති සහ ප්‍රතිපත්ති, *විශේෂයෙන්ම ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය 1989* [2] පදනම්කර ගෙන සකස් කර ඇත. මෙම මූලධර්ම ළමයින්ගේ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා රටෙහි ඇති කැපවීමට මග පෙන්වයි. එමෙන්ම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම මගින් ළමයින්ගේ සහ තරුණයින්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය දිය යුතු බවට රජයට නියම කිරීම මගින් මෙම කැපවීම තහවුරු කරයි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් **ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2009** [3] සකස් කරන ලදී. මෙම ප්‍රතිපත්තිය මගින්ළමයින්ට එරෙහිව සිදුකරනු ලබන ප්‍රචණ්ඩත්වය, සූරාකෑම, නොසලකා හැරීම, යුතුකම් පැහැර හැරීම සහ ළමයින්ට සිදුවන සියලු ආකාරයේ මානසික, කායික හා ලිංගික අපයෝජන වැළැක්වීම සඳහා පුළුල් රාමුවක් සපයා දෙයි. ළමයින්ගේ ආරක්ෂාව සැලසීමේ දී සහ මෙම ප්‍රතිපත්තියේ දක්වා ඇති මූලධර්ම සහ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේ දී රජය විසින් මෙහෙයවනු ලබන බහු-ආංශික සහ බහු-පාර්ශ්වික ප්‍රවේශයක අවශ්‍යතාවය මෙම ප්‍රතිපත්තිය මගින් අවධාරණය කරයි.

ඒ හා සමානව, වෙළෙඳාම් වල වින්දිතයින් වූ ළමයින් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ යොමු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සටහන [4] මගින් ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පිළිපැදිය යුතු මූලධර්ම සහ මාර්ගෝපදේශ ඉදිරිපත් කර ඇති අතර, වෙළෙඳාම්වල වින්දිතයින් වූ ළමයින් සම්බන්ධයෙන් සියලුම පාර්ශවකරුවන් විසින් පිළිපැදිය යුතු නිශ්චිත පියවර දක්වා ඇත. මෙම මාර්ගෝපදේශ සටහන වෙළෙඳාම්වල වින්දිතයන් වූ ළමයින් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පොලිස් නිලධාරීන්, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරීන්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්, පරිවාස නිලධාරී, කම්කරු නිලධාරීන්, කාන්තා සංවර්ධන නිලධාරීන් සහ අනෙකුත් අදාළ සංවර්ධන නිලධාරීන් ඇතුළු පළමු ප්‍රතිචාර දක්වන්නන්ට මාර්ගෝපදේශයක් ලෙස ක්‍රියා කරයි.

එයට අමතරව,මිනිස් වෙළෙඳාමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය විසින් සකස් කරන ලද, **මිනිස් වෙළෙඳාම පිළිබඳව පරීක්ෂාවෙන් සිටීම සහ එය මැඩලීම සඳහා වන ජාතික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (2021 - 2025)**[5] මගින් ළමයින් වෙළෙඳාම් කිරීම ආමන්ත්‍රණය කිරීම ඇතුළුව සියලු ස්වරූප වලින් තිබෙන සහ විද්‍යමාන වන මිනිස් වෙළෙඳාම මැඩ පැවැත්වීම සඳහා ගත යුතු උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රයත්නයන් දක්වා ඇත.

2 https://www.ohchr.org/en/instruments-mechanisms/instruments/convention-rights-child
3 chrome-extension://efaidnbmnnnibpcajpcglclefindmkaj/https://childprotection.gov.lk/images/pdfs/acts-guidelines/2020.12.31%20National%20Policy%20on%20Child%20Protection.pdf
4 Backup_of_Backup_of_save the children Adhil edit.cdr (nahttf.gov.lk)
5 Microsoft Word - Final__NATIONAL ACTION PLAN_2021-2025.docx (nahttf.gov.lk)

1.4 පුද්ගලයින් වෙළෙඳාම් කිරීම පිළිබඳ නෛතික රාමුව

වර්තමානයේ ශ්‍රී ලංකාවට ළමා ආරක්ෂාව සම්බන්ධ විවිධ පැති ආමන්ත්‍රණය කරන නීති තිබේ. එයට අමතරව, හිංසනයෙන්, අපයෝජන වලින්, සූරාකෑමෙන් සහ නොසලකා හැරීම් වලින් ළමයින්ව ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් නීතිමය රාමුවක් ඇති කරවන ප්‍රධාන ජාත්‍යන්තර ගිවිසුම් සහ සම්මුතීන් ද ශ්‍රී ලංකාව විසින් අනුමත කර තිබේ. එමෙන්ම, 2003 අංක 16 දරන *දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 360(ඇ) වගන්තිය* මගින් ළමයින් වෙළෙඳාම් කිරීම ඇතුළු පුද්ගලයන් වෙළෙඳාම් කිරීම අපරාධයක් ලෙස හඳුන්වා දී ඇත.

මෙයට පෙර,1995 වර්ෂයේ අංක 22 දරන පනත මගින් 360(අ) වගන්තිය අවලංගු කරන ලද අතර, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත හෝ ගණිකා වෘත්තීයේ යෙදවීමේ අරමුණින් කැමැත්ත ඇතිව හෝ නැතිව ඕනෑම වයසක පිරිමි හෝ ගැහැණු පුද්ගලයෙකු ප්‍රසම්පාදනය කරනු ලැබීම මගින් කුට්ටනය නැමති වරද සිදු වන්නේය යනුවෙන් විධිවිධාන සලසන ‘කුට්ටනය’ නැමති වරද හඳුන්වා දුන්නේ ය.

එම පනතෙහි 360(ආ) වගන්තියෙහි“යම් ළමයෙකු ලිංගික අපයෝජනයකට පාත්‍ර කිරීමේ කාර්යය සඳහා හෝ කවර වුවද ආකාරයක ලිංගික ක්‍රියාවකට හෝ යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයකට නැතහොත් දර්ශනයකට ළමයෙකු සහභාගී කරවා ගැනීම සඳහා යම් පරිශ්‍රයක රැඳී සිටීමට එම ළමයාට ඉඩදෙන” කවර හෝ තැනැත්තෙක්ලිංගික සූරාකෑමේ අරමුණු සඳහා ළමයින් සපයන්නෙක් ලෙස ක්‍රියා කරන්නේය යනුවෙන් විධිවිධාන සලසන ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම යන වරද දක්වා ඇත.

1998 අංක 29 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත මගින් ළමයින්ට එරෙහි වැරදි සම්බන්ධයෙන් තවදුරටත් විධිවිධාන සලසා ඇත.

2021 අංක 01 දරන අන්තරායකාරී රැකියා නියෝගවල (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රය*, අංක 2254/35) ළමයෙකු (අවුරුදු 18 ට අඩු) සේවයේ යෙදවිය නොහැකි රැකියා ලැයිස්තුවක් දක්වා ඇත. 2021 අංක 2 දරන ස්ත්‍රීන්,තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම (සංශෝධන) පනත මගින් ළමයින් සේවයෙහි යෙදවිය හැකි අවම වයස අවුරුදු 16 දක්වා ඉහළ නංවා ඇත.

කෙසේ වෙතත්, ළමයින් සම්බන්ධ නීතිමය රාමුව යල්පැන ගොස් ඇති බව නිරීක්ෂණය වන බවත්, නීතියේ ඇතැම් විධිවිධානවල ළමයින්ට වෙනස් කොට සලකන ආකාරයේ ඇඟවීම් තිබිය හැකි බවත් සැලකිල්ලට ගත යුතු වේ. ළමයින් සම්බන්ධ ප්‍රධාන කාර්ය පටිපාටියමය ප්‍රඥප්තිය වන ළමයින් හා තරුණ තැනැත්තන් ආඥාපනත යටත් විජිත යුගයට අයත් 1939 වර්ෂය තරම් පැරණි නීතියක් වන අතර, එතැන් පටන් සීමිත සංශෝධන සංඛ්‍යාවකට පමණක් භාජනය වී ඇත. අනාථ නිවාස ආඥාපනත, දරුකමට හදාගැනීමේ ආඥාපනත, සහ අයාල ආඥාපනත වැනි අනෙකුත් නීතිවල ද මෙවැනිම යල්පැන ගිය බවක් නිරීක්ෂණය වන අතර, සමූහයක් ලෙස ගත් කල එම නීති ළමයින්ට අහිතකර බලපෑම් ඇති කරයි.

ළමයින් වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන ජාත්‍යන්තර නීති රාමුව සකස් වීමට පදනම් වී ඇති ප්‍රධානම ලියවිලි වන්නේ ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය 1989, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ළමා ශ්‍රමයේ නරකම ස්වරූප පිළිබඳ සම්මුතිය (C182) 1999[6], ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අවම වයස පිළිබඳ සම්මුතිය (C138) 1973[7] , සහ පුද්ගලයින්ව, විශේෂයෙන් ම කාන්තාවන් සහ ළමයින්ව වෙළෙඳාම් කරනු ලැබීම වැළැක්වීම, මර්දනය කිරීම සහ වෙළෙඳාම් කරුවන්ට දඬුවම් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (2000) වේ. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට ළමයින් වෙළෙඳාම් කිරීමස ම්බන්ධයෙන් වන අමතර කෙටුම්පතක් ද ඇත: එය 2000 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් විධිමත් ලෙස සම්මත කරගන්නා ලද ළමයින් විකිණීම, ළමයින් ගණිකා වෘත්තියේ යෙදවීම සහ ළමා අසභ්‍ය දර්ශන පිළිබඳ අමතර කෙටුම්පත[8] වේ. මෙම අමතර කෙටුම්පත මගින් ප්‍රධාන වශයෙන් ම ළමයින් විකිණීම, ළමයින් ගණිකා වෘත්තියේ යෙදවීම සහ ළමා අසභ්‍ය දර්ශන තහනම් කළ යුතු යැයි රජයන්ට නියම කර තිබේ.

---

6 https://normlex.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:C182

7 https://normlex.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:C138#:~:text=The% 20minimum%20age%20 for%20admission%20to%20any%20type%20of%20employment,be%20less%20than%2018 %20years.

8 https://www.ohchr.org/en/instruments-mechanisms/instruments/optional-protocol-convention-rights-child-sale-children-child

2. සම්මත මෙහෙයුම් පටිපාටියය.

ළමයින් වෙළෙඳාම් කිරීම තථ්‍ය සහ අතථ්‍ය යන පරිසරයන් දෙකෙහි ම සිදු වේ. ඒවා හඳුනා ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා වන කාර්ය පටිපාටියවල කැපී පෙනෙන වෙනස්කම් ඇත. පහත විස්තර කර ඇති සම්මත මෙහෙයුම් පටිපාටිය ළමයින්ට එරෙහි සියලු ආකාරයේ වෙළෙඳාම් කිරීම් සම්බන්ධ සංවිධානාත්මක අපරාධ වලට අදාළ වේ. යම් අපරාධයකට අතථ්‍ය/ඩිජිටල් පරිසරය සම්බන්ධ වන්නේ නම්, මෙහි දක්වා ඇති කාර්ය පටිපාටියයවලට අමතරව '6.3 ඡේදය - ළමයින්ට එරෙහි සයිබර් අපරාධ විමර්ශනය කිරීම'යටතේ දක්වා ඇති කාර්යපටිපාටියය ද අනුගමනය කළ යුතුය.

අරමුණු

- වර්තමාන නීති, ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටියයවලට අනුකූල වන, ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සිද්ධීන් සඳහා ඵලදායී විමර්ශන කාර්ය පටිපාටියයක් හඳුන්වා දීම.
- ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සිද්ධීන් හි දී අපරාධකරුවන් වරදකරුවන් කිරීම ඇතුළුව කඩිනම් සහ ඵලදායී ලෙස නීතිය බලාත්මක කිරීම.
- ළමයින් වෙළෙඳාම් කරනු ලැබීම පිළිබඳ සිද්ධීන් හඳුනා ගැනීමේ දී, විමර්ශනය කිරීමේ දී සහ නඩු පැවරීමේදී ඵලදායී සම්බන්ධීකරණය සහතික කිරීම සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් අනුගමනය කළ යුතු නිශ්චිත පියවර ආයතනික කරණය කිරීම.
- වින්දිතයන් නැවත වින්දිතභාවයට පත්වීම වැළැක්වීම සහ වින්දිත ළමයින්ගේ රැකවරණය සහ ආරක්ෂාව සඳහා සුදුසු පියවර ගනුලබන බව සහතික කිරීම.

සම්මත මෙහෙයුම් පටිපාටියයවල අදියර

1 වෙනි අදියර - හඳුනා ගැනීම සහ ගලවා ගැනීම
2 වෙනි අදියර -විමර්ශනය කිරීම
3 වෙනි අදියර -නඩු විභාගය

2.1 පළමු අදියර - අනාවරණය කර ගැනීම සහ ගලවා ගැනීම

ළමයින් වෙළෙඳාම් කිරීමක් විය හැකි සිද්ධියක් අනාවරණය කර ගැනීම සඳහා පළමු ප්‍රතිචාර දක්වන ආයතනයක් හෝ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් වෙත 'පළමු තොරතුරු වාර්තාවක්' හෙවත් පැමිණිල්ලක් ලැබිය යුතු වේ. පොලීසිය විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරී විමර්ශන හෝ සෝදිසි මෙහෙයුම් ද ළමයින් වෙළෙඳාම් කිරීම් විය හැකි සිද්ධීන් හඳුනා ගැනීම සඳහා උපකාරී වනු ඇත.

2.1.1 පළමු තොරතුරු වාර්තාකිරීම / පැමිණිලි

පළමු තොරතුර හෝ පැමිණිල්ල ළමයින් වෙළෙඳාම් කිරීමක් විය හැකි සිද්ධියක් හඳුනා ගැනීමේ මූලික පියවර වන අතර,වෙළෙඳාම හඳුනා ගැනීම සහ වැඩිදුර විමර්ශන සිදු කිරීම සඳහා අවශ්‍ය කරන ඉතා වැදගත් තොරතුරු වාර්තා කර ගනු ලබන බව සහතික කිරීම සඳහා එය විධිමත් කළ යුතු වේ.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 109 වෙනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව,වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් වාචිකව හෝ ලිඛිතව ලබා දෙන ලද පළමු තොරතුරු පොලිස් නිලධාරියෙකු විසින් සටහන් කර ගත යුතු ය.

ළමයෙකුට එරෙහිව සිදු කරන ලද වරදක් පිළිබඳ තොරතුරු දන්නා ඕනෑම පාර්ශ්වයකට ළමයින් වෙළෙඳාම් කිරීමක් විය හැකි එම සිද්ධිය පිළිබඳ තොරතුරු හෝ පැමිණිල්ලක් වාචිකව හෝ ලිඛිතව ඉදිරිපත් කළ හැක. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ දිස්ත්‍රික් මට්ටමෙන් ස්ථානගත කර සිටින පළමු ප්‍රතිචාර දක්වන නිලධාරීන් හරහා ද පළමු තොරතුරු භාර ගැනීම සිදු කළ හැක.

පහත සඳහන් දත්ත සංචිතවල දෛනික අධීක්ෂණයෙහි කොටසක් ලෙස එම දත්ත සංචිත මගින් ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ / සූරාකෑමට ලක් වූ ළමයින් පිළිබඳ පළමු තොරතුරු ලබාගත හැකි අතර, තොරතුරු ඉල්ලීම් එම දත්ත සංචිත පවත්වාගෙන යන ආයතන වෙත ඉදිරිපත් කළ හැක:

(1) අතුරුදහන් වූ සහ සූරාකෑමට ලක් වූ ළමයින් පිළිබඳ ජාතික මධ්‍යස්ථානය (NCMEC)
(2) ජාත්‍යන්තර ළමා ලිංගික සූරාකෑම් පිළිබඳ රූප සහ වීඩියෝ දත්ත ගබඩාව - ජාත්‍යන්තර පොලීසිය

පළමු තොරතුරු වාර්තාකර ගැනීමේ වගකීම පැවරී ඇති නිලධාරින්:

පොලීසිය - පොලිස් ස්ථානයක ඕනෑම නිලධාරියෙකුට පළමු තොරතුරු වාර්තා කර ගත හැක. කෙසේ වෙතත්, ළමයෙකුට හෝ කාන්තාවකට එරෙහි අපරාධයකට අදාළ තොරතුරු ලැබෙන අවස්ථාවක ළමා හා කාන්තා කාර්යාංශයට අනුයුක්ත නිලධාරියෙකු විසින් එම තොරතුරු වාර්තා කර ගැනීම සුදුසු යැයි දැඩි ලෙස නිර්දේශ කරනු ලැබේ. පළමු තොරතුරු වාර්තා කර ගෙන අවසන් වූ විට එය පැමිණිලිකරු සඳහා පැමිණිලිකරුට අවබෝධ වන භාෂාවෙන් කියවිය යුතුය. අවශ්‍ය විට භාෂා පරිවර්තකයන්ගේ සහාය ලබා ගත යුතුය.

පැමිණිල්ල සහ වරද පිළිබඳව පොලිස් ස්ථානාධිපතිවරයා වෙත දැනුම් දිය යුතු අතර, ඉන් පසුව සහකාර පොලිස් අධිකාරීට දැනුම් දිය යුතුය.
**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය** - පොලිස් ඒකකයේ ස්ථානාධිපතිවරයාට සහ නීතිය බලාත්මක කිරීමේ ඒකකය භාර අධ්‍යක්ෂවරයාට පළමු තොරතුරු වාර්තා කර ගත හැක. මෙම පොලිස් ඒකකය ළමා හා කාන්තා කාර්යාංශයේ ශාඛාවක් වේ.

*සටහන* :
මෙම පියවර අපරාධ විමර්නශනයක ඉතාමත් තීරණාත්මක අදියරවලින් එකක් ලෙස සලකනු ලැබේ. සාක්ෂි සොයා ගැනීමට හැකි වන උපරිම අවස්ථාවන් උදාවන මෙම අදියරේ දී පොලීසිය වහාම ක්‍රියාත්මක විය යුතු වේ. කාලය ගතවීමත් සමග, සාක්ෂි සොයා ගැනීම සඳහා තිබෙන අවස්ථා අඩු වනු ඇත. සාක්ෂිකරුවන් විය හැකි පුද්ගලයින් සොයා ගැනීමට නොහැකි වනු ඇත. අපරාධ ස්ථාන විමර්ශනයට උපකාරී නොවන තත්ත්වයට හැරෙනු ඇත. සැකකරුවන් පලා යනු ඇත.

මෙම අදියරේ දී සාමාන්‍යයෙන් පළමු තොරතුරු හෙවත් පැමිණිල්ල ළමයින් වෙළෙඳාම් කිරීමේ අපරාධයක තොරතුරු ලෙස හඳුනා නොගනු ඇත.'පෙනෙන්නට තිබෙන ආකාරයට' එය ළමා ලිංගික සූරාකෑමක්, ලිංගික අපයෝජනයක්, ස්ත්‍රී දූෂණයක්, ශාරීරික අපයෝජනයක්, ළමා ශ්‍රමය යොදා ගැනීමක් හෝ ළමයෙකු සම්බන්ධ වෙනත් ඕනෑම අපරාධයක් ලෙස හඳුනා ගනු ලැබිය හැක. එය ළමයින් වෙළෙඳාම් කිරීමේ අපරාධයක් ලෙස පැමිණිලි කිරීම සඳහා වෙළෙඳාමක් සිදුවී ඇති බව ළමයාට හෝ පැමිණිලිකරුට හෝ බොහෝ විට වැටහෙන්නේ නැත. පළමු තොරතුරු හෙවත් පැමිණිල්ල ලබා ගන්නා අවස්ථාවේ දී, ළමයා සන්නිවේදනයට බාධා කරන ආකාරයේ ආබාධයකින් පෙළෙන බව නිලධාරියාට පෙනෙන්නට තිබේ නම් (වර්යාමය හෝ සංවර්ධන ආබාධ/සංවේදන හෝ කථන දුර්වලතා ආදිය හේතුවෙන් තේරුම් ගැනීමට හා තේරුම් කරනු ලැබීමට අපහසු වන්නේ නම්) අවශ්‍ය සහාය ලබා දිය යුතු අතර,සිද්ධියට අදාළ තොරතුරු ලබා දීම සඳහා ළමයාට සාධාරණ කාලයක් ලබා දිය යුතුය.

එමෙන්ම, 1939 අංක 48 දරන ළමයින් හා තරුණ තැනැත්තන් ආඥාපනතේ 20වෙනි වගන්තිය මගින් යම් නීතිමය ක්‍රියාමාර්ගයකට සහභාගීවන ඕනෑම ළමයෙකු හෝ තරුණ අයෙකු හඳුනා ගැනීමට හේතු විය හැකි ආකාරයෙන් එම ළමයාගේ හෝ තරුණ අයගේ ලිපිනයන්, පාසල, ඡායාරූප හෝ වෙනත් තොරතුරු ප්‍රසිද්ධ කිරීම තහනම් කරයි. සිද්ධිය පිළිබඳ විස්තර නීතිය ක්‍රියාත්මක කරන බලධාරින්ට වාර්තා කළ පසු ළමයා නැවත වින්දිතභාවයට පත්වීම වැළැක්වීම සඳහා මෙය වැදගත් වේ.

ලැබෙන පළමු තොරතුරු ළමා ශ්‍රමය ලබාගැනීම පිළිබඳ සිද්ධියක් සම්බන්ධයෙන් නම්, එම ළමා ශ්‍රමය යොදා ගැනීමේ සිද්ධිය සම්බන්ධයෙන් තොරතුරු සටහන් කර ගනු ලබන බව සහතික කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරින් දැනුවත් කළ යුතු අතර,එය ශ්‍රමය සූරාකෑම සඳහා සිදුකරන ලද ළමයින් ජාවාරම් කිරීමක්ද යන්න හඳුනා ගැනීම සඳහා කම්කරු නිලධාරින්ට පොලීසිය සමග සහයෝගයෙන් කටයුතු කළ හැක.

2.1.2 ගලවා ගැනීම

ගලවා ගැනීමක් යනු වින්දිතයෙකු සූරාකෑමේ තත්ත්වයකින් ඉවත් කර එම පුද්ගලයාව වෙළෙඳාම් කරනු ලැබීමේ තත්ත්වයක් නැති කිරීම සඳහා සිදුකරනු ලබන ඕනෑම මැදිහත්වීමකි. වෙළෙඳාම් කිරීමක වින්දිතයන් විය හැකි පුද්ගලයන් පිළිබඳ තොරතුරු ලැබුණු විගස,විශේෂයෙන් ම ඔවුන් ළමයින්වන්නේ නම් සහ/හෝ ඔවුන් අනතුරට ලක්වීමට ආසන්න තත්ත්වයක සිටින්නේ නම්වහාම ඔවුන් ඉන් ගලවා ගත යුතු ය. වින්දිතභාවයට පත් විය හැකි ළමයෙකු ගලවා ගැනීමට තිබේ නම්, පොලීසිය එම ළමයා ගලවා ගැනීමේ සැලැස්ම සිතියම්ගත කර, අදාළ නිලධාරින් සමග සම්බන්ධීකරණය කිරීමට කටයුතු කළයුතු ය.

වින්දිතයෙක් හෝ සාක්ෂිකරුවෙක් සෘජුව ම හෝ භාරකරුවෙක් හරහා පොලීසිය සම්බන්ධ කර ගෙන පැමිණිල්ලක් ඉදිරිපත් කළ හොත් ගලවා ගැනීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක කරනු ලැබිය හැක. ගලවා ගැනීමේ මෙහෙයුමක මූලික ම පරමාර්ථය වන්නේ වින්දිතයාව සූරාකෑමේ තත්ත්වය අවසන් කර වින්දිතයාට සහාය දීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමයි. වින්දිතයෙක් විය හැකි පුද්ගලයෙකුට හදිසි ජීවිත තර්ජනයක් තිබේ නම්, ඒ සම්බන්ධයෙන් වහාම මැදිහත් විය යුතු වේ. වින්දිතයෙක් විය හැකි පුද්ගලයෙකුට හදිසි තර්ජනයක් නොමැති අවස්ථාවක, අදාළ ස්ථානය හඳුනා ගෙන පොලීසියට නිරීක්ෂණ සිදු කළ හැකි අතර, එමගින් අවශ්‍ය සාක්ෂි ලබා ගත හැකි වනු ඇත.

වෙළෙඳාම්වල වින්දිතයන් වූ ළමයින් හඳුනා ගැනීම, ඔවුන් ආරක්ෂා කිරීම සහ යොමු කිරීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය මාර්ගෝපදේශ සටහන අනුව, පොලීසිය විසින් ක්‍රියාකාරි ගලවා ගැනීමේ සැලැස්මක් සකස් කර ගලවා ගැනීමේ මෙහෙයුම් සිදු කළ යුතු අතර, අදාළ විමර්ශන ඒකකවල නියෝජිතයින් සමග සහ නවාතැන්, වෛද්‍ය සහ නීති උපදෙස් වැනි සේවාවන් සපයා දෙන ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග සම්බන්ධීකරණය කළ යුතු වේ.

**ගලවා ගැනීමේ මෙහෙයුමක් සිදු කළ යුතු වන අවස්ථාවක, පහත සඳහන් පියවර අනුගමනය කළ යුතු ය:**

*ගලවා ගැනීමේ කණ්ඩායම* :

1. ළමා හා කාන්තා කාර්යාංශයේ කාන්තා නිලධාරිනියක් සහිත විය යුතුය.
2. ආසන්නයේ ම සිටින පොලිස් ජංගම කණ්ඩායමට දැනුම් දිය යුතු ය.
3. විශේෂිත සාක්ෂි එකතු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් SOCO කණ්ඩායමේ නිලධාරින් ගෙන්වා ගත යුතු ය.
4. කණ්ඩායම කොටස් දෙකකට බෙදිය යුතු ය - එක් කණ්ඩායමක් වින්දිතයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු අතර තවත් කණ්ඩායමක් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

*ගලවා ගැනීමේ මෙහෙයුම සැලසුම් කිරීමේ දී, ළමයා සම්බන්ධයෙන් සහාය ලබාගැනීම සඳහා පොලීසිය පහත සඳහන් නිලධාරින් දැනුවත් කළ යුතු ය:*

පොලිස් ස්ථානාධිපතිගේ අනුමැතිය ඇතිව:

- ළමා ශ්‍රමය සූරාකෑමේ සිද්ධියක් සම්බන්ධයෙන් වන විට අදාළ කම්කරු නිලධාරියා දැනුවත් කළ යුතු ය.
- අදාළ පරිවාස නිලධාරියා දැනුවත් කළ යුතු ය. (1939 ළමයින් හා තරුණ තැනැත්තතන් ආඥාපනතේ 17 වෙනි වගන්තිය ප්‍රකාරව).
- තොරතුරු තාක්ෂණ දැනුම තිබෙන එක් පොලිස් නිලධාරියෙක්.
- අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් (ළමයින් සම්බන්ධයෙන් කටයුතු කරන) උදා. -ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරි, ළමා ආරක්ෂක නිලධාරි
- ආසන්නතම රජයේ රෝහල
- ගිලන් රථය (අවශ්‍ය වන්නේ නම්)
- ළමා මනෝවිද්‍යාඥයා අවශ්‍ය අවස්ථාවල දී, සැලසුම් කර ඇති ගලවා ගැනීමේ මෙහෙයුම පිළිබඳ තොරතුරු පහත සඳහන් අය සමග බෙදා ගත යුතු ය:
- අධිකරණ වෛද්‍ය නිලධාරි
- පොලීසියේ ව්‍යවහාරික ඇඟිලි සලකුණු විශේෂඥවරයා
- රජයේ රස පරීක්ෂක
- පොලිස් මූල්‍ය බුද්ධි අංශයේ ප්‍රධානියා (මුදල් විශුද්ධිකරණය, නීතිවිරෝධී වත්කම් ආදිය සම්බන්ධයෙන් සැක සහිත ව්‍යාපාරික ස්ථානයක් නම්)

*ගලවා ගැනීමේ මෙහෙයුමක පියවර* :

1. හැකි ඉක්මනින් අදාළ ස්ථානය හඳුනාගෙන එම ස්ථානයට යාම.
2. කණ්ඩායමට අවම වශයෙන් එක් කාන්තා නිලධාරිනියක් ඇතුළත්කර ගැනීම සහ උප පොලිස් පරීක්ෂක (SI) හෝ ඉන් ඉහළ නිලයක නිලධාරියෙක් විසින් කණ්ඩායම මෙහෙයවීම.
3. අවශ්‍ය අවස්ථාවල දී උපාය දූතයෙකු යෙදවීම.
4. පැමිණෙන්නන්ගේ ලේඛනයක් තිබෙන්නේ නම් සහ අදාළ වන්නේ නම් එය පරීක්ෂා කිරීම (හෝටලයක, ලැගුම්හලක, සම්බාහන මධ්‍යස්ථානයක ආදියෙහි).
5. වින්දිතයන් සහ අදාළ සැකකරුවන් හඳුනා ගැනීම.

6. ආරක්ෂාව සඳහා ළමයා පොලිස් භාරයට ගැනීම.
7. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම.
8. අපරාධ සිදු වූ ස්ථානය ආරක්ෂා කිරීම සඳහා හැකි ඉක්මනින් සියලු පුද්ගලයන් අපරාධ ස්ථානයෙන් ඉවත් කිරීම සහ දෘශ්‍යමය වශයෙන් හෝ වාචිකව යම් වින්දිතයෙකු බිය ගැන්වීමට වෙළෙඳාම් කරුවන්ට ඇති අවස්ථා අවම කිරීම.
9. වින්දිත ළමයින් අනෙකුත් වැඩිහිටි සැකකරුවන් / වැරදිකරුවන්ගෙන් වෙන්කර රැගෙන යාම /ප්‍රවාහනය කිරීම.
10. සෑම විටම ළමයාගේ සහ ඔහුගේ/ඇයගේ පවුලේ අනන්‍යතාව මහජනතාවගෙන් සහ මාධ්‍යවලින් දැඩි ලෙස වසන් කර තිබෙන බව සහතික කර ගන්න.
11. ළමයා සමග ඔහුගේ/ඇයගේ දෙමව්පියන් හෝ භාරකරුවන් සිටින්නේ නම්, වෙළෙඳාම ට හෝ සූරාකෑමට එම දෙමව්පියන්ගේ/ භාරකරුවන්ගේ සම්බන්ධයක් ඇතැයි සැක කිරීමට හේතු තිබේ නම් මිස, ළමයා ඔවුන්ගෙන් වෙන් නොකරන්න. දෙමව්පියන්ගේ/භාරකරුවන්ගේ සම්බන්ධයක් ඇතැයි සැක කිරීමට හේතු තිබේ නම්, ළමයා එම සැකකාර දෙමව්පියන්/ භාරකරුවන් ගෙන් වෙන් කළ යුතු ය.

*සටහන* :
කිසියම් පරිශ්‍රයක ළමා අපයෝජනයක් සිදු වෙමින් පවතින්නේ යැයි විශ්වාස කිරීමට හේතු තිබෙන සහ අධිකරණයෙන් සෝදිසි වරෙන්තුවක් ලබාෙගැනීම සඳහා ඉල්ලුම් කිරීම මගින් එම ළමා අපයෝජනය පිළිබඳව සිදු කරන විමර්ශනයට අගතියක් විය හැකි අවස්ථාවක, වරෙන්තුවක් නොමැතිව ඕනෑම පරිශ්‍රයකට ඇතුළු වී එය සෝදිසි කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ බලයලත් නිලධාරියෙකු පත් කිරීමට 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 33 වෙනි වගන්තිය මගින් එම අධිකාරියේ සභාපතිවරයාට බලය ලබා දී ඇත. මෙම සෝදිසි කිරීම ද වින්දිත ළමයෙකු බේරා ගැනීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමට හේතු විය හැක.

*ගලවා ගැනීමේ මෙහෙයුම අවසානයේ දී පහත සඳහන් පියවර අනුගමනය කළ යුතු ය* :

- නිවැරදි ක්ෂේත්‍ර සටහන් සකස් කිරීම, ඡායාරූප ගැනීම, වීඩියෝ සාක්ෂි පටිගත කර ගැනීම
- ළමයාගේ දෙමව්පියන් හෝ නීත්‍යානුකූල භාරකරුවන් හඳුනාගෙන, ළමයා සමග පොලිස් ස්ථානයට යන්න
- අවශ්‍ය නම් ළමයාව තැබීමට තාවකාලික ආරක්ෂිත නවාතැනක් / ආරක්ෂිත ස්ථානයක් සූදානම් කිරීම. (බොහෝ විට හොඳම ආරක්ෂිත ස්ථානය වන්නේ ආසන්නතම රෝහලයි)
- වින්දිත ළමයා වෛද්‍ය පරීක්ෂණ/වෛද්‍ය ආධාර සඳහා අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යොමු කිරීම.
- ආබාධ සහිත ළමයින් ගේ විශේෂ අවශ්‍යතා/වුවමනා ඇතුළුව ළමයාගේ වෙනත් අවශ්‍යතා/වුවමනාසොයා බැලීම.
- විශේෂයෙන් ම, ළමයා තනිව සිටින්නේ නම්, අදාළ වරදට දෙමව්පියන් / භාරකරුවන් සම්බන්ධ බව විශ්වාස කිරීමට හේතුවක් නොමැති නම්, ළමයාගේ පවුල සොයා ගැනීමට සහ ළමයා දෙමව්පියන් / භාරකරුවන් සමග නැවත එක් කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම.ළමයා යම් ස්ථානයක තැබීම හෝ ළමයාගේ දෙමව්පියන්ට/භාරකරුවන්ට භාරදීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී සැමවිටම ළමයාගේ උපරිම යහපත පිළිබඳව සලකා බැලීම, සහ ළමයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.
- ළමයාගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සහතික කිරීමට පියවර ගැනීම (පරිවාස නිලධාරී / ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරී / අපරාධවල වින්දිතයන් සහ සාක්ෂිකරුවන් පිළිබඳ ජාතික අධිකාරිය සමග සාකච්ඡා කර)

*ගලවා ගැනීමේ මෙහෙයුමෙන් පසුව පහත සඳහන් ආයතන වෙත සිද්ධිය පිළිබඳ තොරතුරු දැනුම් දීම:*

- ළමයා හඳුනාගත් වහාම, පරිවාස හා ළමාරක්ෂක සේවා අධිකාරිය,
- මූලික පරීක්ෂණ සහ විමර්ශන සඳහා අවශ්‍ය උපදෙස් සහ මාර්ගෝපදේශ ලබාගැනීම සහතික කිරීම පිණිස, ළමා හා කාන්තා කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය,
- පොලිස් මූලස්ථානයේ අපරාධ කොට්ඨාසය,
- අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,
- 2020 අගෝස්තු 31 දිනැති අංක CRTM1978 දරන පොලිස් චක්‍රලේඛය ප්‍රකාරව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.

### 2.1.3 මූලික පරීක්ෂා කිරීම

පළමු තොරතුරු වාර්තා කරගැනීමෙන් පසුව මූලික පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ. මෙය ළමයින් වෙළෙඳාම් කිරීමෙහි වින්දිතයන් වූ ළමයින් සඳහා හැකි තරම් සරල, පරිපූර්ණ සහ කෙටි විය යුතු ය. මෙහි අරමුණ වන්නේ සාමාන්‍යයෙන් වින්දිත ළමයින් නැවත වින්දිත භාවයට පත්වීමට හේතු වන ආකාරයෙන් බහුවිධ සම්මුඛ සාකච්ඡා සිදු කිරීම / සිද්ධිය පිළිබඳ විස්තර අඛණ්ඩව සැපයීමට සිදුවීම

වැළැක්වීමයි. වෙළෙඳාම් කිරීමේ සිද්ධියක් පිළිබඳ මූලික හඳුනාගැනීම සඳහා උපකාරී වන ඇඟවීම් සහිත සම්මත පිරික්සුම් ආකෘතියක් භාවිතා කරමින් මෙම පරීක්ෂා කිරීම සිදුකළ යුතු ය.

*සලකා බැලිය යුතු වැදගත් කරුණු* :

- ළමයින් වෙළෙඳාම් කිරීමේ සිද්ධියක් පිළිබඳ මූලික හඳුනා ගැනීම සිදු කිරීම සඳහා පළමු තොරතුරු වාර්තා කර ගන්නා සහ මූලික පරීක්ෂණය සිදු කරන නිලධාරීන් ප්‍රමාණවත් පුහුණුව සහිත සහ පරීක්ෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය කුසලතාවලින් සහ සම්මත පරීක්ෂණ මෙවලමකින් සමන්විත විය යුතු ය. සිද්ධියෙහි ස්වභාවය අනුව සහ ළමයාගේ උපරිම යහපත සැලසීම සඳහා අවශ්‍ය වන පරිදි, විමර්ශන නිලධාරියා නිලධාරිනියක (කාන්තා) හෝ නිලධාරියෙකු(පිරිමි) විය යුතු ය. අවශ්‍ය අවස්ථාවල සහ අවශ්‍ය තැන්හි දී, ස්ථානාධිපතිවරයා විසින් පොලිස් නිලධාරීන්ට උපදෙස් / මග පෙන්වීම ලබා දිය හැක.

- ළමයා සන්නිවේදනයට බාධා කරන ආකාරයේ ආබාධයකින් පෙළෙන බව පෙනෙන්නට තිබේ නම් (චර්යාමය හෝ සංවර්ධන ආබාධ/සංවේදන හෝ කථන දුර්වලතා ආදිය හේතුවෙන් තේරුම් ගැනීමට හා තේරුම් කරනු ලැබීමට අපහසු වන්නේ නම්) පළමු තොරතුරු ලබා ගන්නා අවස්ථාවේදී / පරීක්ෂණය සිදු කරන අවස්ථාවේ ළමයාට සාධාරණ සහායක් ලබා දිය යුතු ය. උදාහරණ ලෙස :
- ළමයා වෙනුවෙන් ළමයාගේ විශේෂ අවශ්‍යතා සන්නිවේදනය කිරීමේ හැකියාව සහිත, ළමයාට රැකවරණය සැලසිය හැකි සහ ළමයා අධීක්ෂණය කළ හැකි භාරකරුවෙකුගේ හෝ විශ්වාසවන්ත වැඩිහිටියෙකුගේ සහාය සැමවිටම ළමයාට ලබා දිය යුතු ය.
- භාවිතා කළ යුතු භාෂාව තෝරා ගැනීම ඇතුළුව සන්නිවේදනය සඳහා ළමයාගේ මනාපයන් තේරුම් ගැනීමට උත්සාහ කළ යුතු ය.
- පළමු තොරතුරු ලබා ගැනීමේ දී, සම්මුඛ සාකච්ඡාව අතරතුර දී හෝ අදියරගත සම්මුඛ සාකච්ඡා වලදී තොරතුරු සටහන් කර ගන්නා අතරතුර ළමයාට විවේකයන් ලබා දිය යුතු ය.
- ව්‍යුහ විද්‍යාත්මක බෝනික්කන්, ව්‍යුහ විද්‍යාත්මක රූප සටහන් සහ චිත්‍ර අඳින ද්‍රව්‍ය වැනි සම්මුඛ සාකච්ඡා ආධාරක ද්‍රව්‍ය භාවිතා කිරීම.
- ළමයින් වෙළෙඳාම් කිරීමක වින්දිතයෙක් බවට පත්ව තිබිය හැකි ළමයෙකුගෙන් පළමු තොරතුරු වාර්තා කර ගන්නා / මූලික පරීක්ෂණය සිදු කරන නිලධාරියෙක් ළමයා සමග කටයුතු කිරීමේ දී, තොරතුරු සපයන/පරීක්ෂණයට භාජනය වන අවස්ථාවේ දී ළමයා චිත්තවේගීය වශයෙන් පීඩාවට පත්ව සිටින බව සැලකිල්ලට ගෙන, වින්දිතයා/නොනැසී සිටින්නා කේන්ද්‍ර කරගත් ප්‍රවේශයක් අනුගමනය කිරීම වැදගත් වේ. ළමයාගේ අයිතිවාසිකම් සැලකිල්ලට ගනිමින් සහ ළමයා නැවත වින්දිතභාවයට පත්වීම වළක්වා ගනිමින් සැමවිටම ළමා හිතකාමී ආකාරයෙන් ළමයාව සම්මුඛ සාකච්ඡාවට භාජනය කරන බව සහතික කිරීම සඳහා, ළමයින් වෙළෙඳාම් කිරීම්වල වින්දිතයන් සම්මුඛ සාකච්ඡාවට ලක්කිරීම පිළිබඳ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මාර්ගෝපදේශ බලන්න. [9]
- තව ද, මූලික හඳුනාගැනීම මගින් වින්දිතළමයාගේ තත්ත්වය පිළිබඳ මූලික ඇඟවීමක් සපයා දිය යුතු අතර, එමගින් විමර්ශනයක් සඳහා ආරම්භය සහ වැඩිදුර සහාය සහ ආරක්ෂාව සඳහා ප්‍රවේශය ලබා දෙනු ඇත.
- මූලික පරීක්ෂා කිරීම අවසානයේ දී, වැඩිදුර පරීක්ෂණ සඳහා සහාය වන පරිදි විමර්ශන සැලැස්ම සකස් කළ යුතු ය.

**පරීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය**

*මූලික පරීක්ෂණය අදියර දෙකකින් සිදු කළ හැක:*

**පළමුවෙනි අදියර :**
ඇඟවීම් පදනම් කර ගෙන පරීක්ෂණ සිදු කිරීම

**දෙවන අදියර :**
පරීක්ෂණ සිදුකිරීමේ ප්‍රශ්න

**පළමුවෙනි අදියර :** ඇඟවීම් පදනම් කරගෙන පරීක්ෂණ සිදු කිරීම

වෙළෙඳාම් කිරීමක් සිදුවී තිබිය හැකි ඕනෑම තත්ත්වයක දී සෑම විටම සැලකිල්ලට ගත යුතු "බැලූ බැල්මට පිළිගත හැකි සේ පෙනීයන"ඇඟවීම් තිබේ. පුද්ගලයෙක් වින්දිතයෙක් වී තිබිය හැකි ද යන්න තහවුරු කරන්නේ මෙම ඇඟවීම්වලින් වන බැවින් ඒ පිළිබඳව වැඩිදුර පරීක්ෂණ සිදු කිරීම අවශ්‍ය වේ. [10] එම ඇඟවීම් මෙසේය:


9 Guidelines for Law Enforcement Officials on Interviewing Child Victims of Trafficking.pdf (savethechildren.net)

10 සංක්‍රමණ සහාය පිළිබඳ සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ අත්පොත
https://publications.iom.int/system/files/pdf/iom_handbook_assistance.pdf

- *අපයෝජනයෙහි සලකුණු* : සාමාන්‍යයෙන්, වෙළෙඳාම් කරුවන් ඔවුන්ගේ වින්දිතයන්ව නිරන්තරයෙන් කායික හා මානසික හිංසනයට ලක් කරති. එහි සලකුණු පෙනෙන්නට තිබෙනවාහෝ නොතිබෙනවා (මනෝවිද්‍යාත්මක) විය හැකි අතර, ඇතැම් අවස්ථාවලදී ඒවා ස්වයංව සිදුකරගත් ඒවා විය හැක.
- *ළමයා අදාළ ප්‍රදේශයේ අයෙකු නොවන බව ඇඟවෙන සලකුණු* : වින්දිතළමයින් බොහෝ විට ඔවුන්ව හමුවූ ප්‍රදේශයට අයත් පුද්ගලයන් නොවේ.
- *සන්දර්භය* : වින්දිතයන් හමුවන සන්දර්භය හොඳින් පරීක්ෂා කර බැලීම වැදගත් වේ. සියලුම වින්දිතයන් පැහැරගැනීමට ලක්වූ අය වන්නේය යන්නමිත්‍යාවකි. ඇතැම් අයව බලහත්කාරයෙන් රැගෙන යනු ලැබුව ද, බොහෝ වින්දිතයන්ව සැබවින්ම කැමැත්තෙන් යමෙකු සමග යාමට පොළඹවා ගනු ලැබේ;එහෙත් එය බොහෝ විට ව්‍යාජ මවාපෑම්මත සිදු කරනු ලැබේ (උදාහරණ වැඩිහිටි"පෙම්වතුන්")
- *ලියවිලි* : හඳුනාගැනීමේ ලියවිලි නොමැතිවීම හෝ ව්‍යාජ ලියවිලි තිබීම.

සටහන : මෙම සලකුණු එකක් හෝ කිහිපයක් තිබීම මගින් පුද්ගලයෙකු වෙළෙඳාම ක වින්දිතයෙක් බවට පත්වී ඇති බව තහවුරු නොවේ. තවදුරටත් පරීක්ෂණ සිදු කළ යුතු බව එයින් සරලව අදහස් කෙරෙයි.

දෙවන අදියර : පරීක්ෂණ සිදු කිරීමට යොදා ගත හැකි ප්‍රශ්න




ළමයින් වෙළෙඳාම් කිරීමේ අපරාධයක මූලික ලක්ෂණ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා ඇමුණුම 1 බලන්න.

2.1.4 හදිසි අවශ්‍යතා හඳුනා ගැනීම / වින්දිතයින්ට සේවා (වාසස්ථාන ඇතුළු) සපයන්නන් වෙත තොරතුරු සපයා දීම

පළමු තොරතුරු භාර ගන්නා හෝ ගලවා ගැනීමේ මෙහෙයුමක් සිදු කරන පොලිස් නිලධාරින් මූලික පරීක්ෂණ ක්‍රියාවලිය අතරතුර දී කිසියම් හදිසි සහායක් අවශ්‍ය නම් එය ලබා දෙන බව සහතික කර ගැනීම පිණිස වින්දිතයන්ගේ හදිසි අවශ්‍යතා ඇගයීමක් සිදු කළ යුතු ය. මූලික පරීක්ෂණ ක්‍රියාවලියේ දී පොලිස් කාන්තා හා ළමා කාර්යාංශයේ නිලධාරින්ට මෙම හදිසි අවශ්‍යතා තක්සේරුව සිදු කළහැක. මෙම අවශ්‍යතාවලට ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සහ ශාරීරික හෝ මානසික අවශ්‍යතා ඇතුළු අනෙකුත් අවශ්‍යතා ඇතුළත් වේ. වින්දිත ළමයා විදේශිකයෙක් නම් හෝ පොලිස් නිලධාරින්ට නොතේරෙන භාෂාවක් කතා කරන්නේ නම්, කථා පරිවර්තකවරුන්ගේ සේවාව ලබා ගැනීමට අවශ්‍ය විය හැක. වින්දිත ළමයා ආබාධ සහිත අයෙකු නම්, සමාජ සේවා දෙපාර්තමේන්තුව වැනි අදාළ සේවා සපයන්නන්ගේ සහාය ඇතිව අවශ්‍ය සේවා සහ නවාතැන් පහසුකම් සපයා දිය යුතු වේ.

හැකි සෑම අවස්ථාවක දී ම වින්දිත ළමයින්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම පොලිස් නිලධාරියෙකු විසින් පරිවාස නිලධාරියෙකු සමග සාකච්ඡා කර සිදු කළයුතු ය. අවශ්‍යතා තක්සේරුව ප්‍රධාන වශයෙන් ම පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තන්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන,ළමයාගේ පසුකාලීන රැකවරණ සැලැස්මෙහි පදනම වීම එයට හේතුව වේ. මෙම මූලික පරීක්ෂණ ක්‍රියාවලිය වින්දිතයාට යම් ක්ෂණික අවදානමක් හෝ ආරක්ෂාව සම්බන්ධ අවශ්‍යතා තිබේද යන්න පිළිබඳ ඇගයීමක් කිරීමට සහ ඒ අනුව ඒවා ආමන්ත්‍රණය කිරීමට උපකාරී වේ.

රැකවරණයක් නොමැති සහ පවුලෙන් වෙන් වූ ළමයින් ඇතුළු අවදානමට ලක්ව සිටින ළමයින් සම්බන්ධ පසුකාලීන ක්‍රියාමාර්ග සහ තීරණ ළමයාගේ ආරක්ෂාව පිළිබඳව සිදු කරනු ලබන ගැඹුරු ඇගයීමක් මත පදනම් විය යුතු ය.සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් තනිව සිටින ළමයින්ගේ ආරක්ෂාව සඳහා 'උපරිම යහපත ඇගයීම' යනුවෙන් හඳුන්වනු ලබන ඇගයීම් මෙවලමක් හඳුන්වා දී ඇත. [11] ඒ හා සමාන'උපරිම යහපත පිළිබඳ ඇගයීමක්' මගින් ළමයා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග ළමයාගේ උපරිම යහපතට අනුකූල වන බව සහතික කිරීමට ළමා ආරක්ෂක ක්‍රියාකාරීන්ට සහාය සහ මග පෙන්වීම ලබා දෙනු ඇත.

තීරණ ගැනීමට පෙර 'උපරිම යහපත පිළිබඳ ඇගයීමක්' සිදු කිරීම අවශ්‍ය කරන තීරණ කිහිපයක් තිබේ :

- ළමයාගේ පවුල පිළිබඳ සෙවීම ආරම්භ කිරීම
- තාවකාලික රැකවරණය සැපයීම
- අවදානම් සහගත තත්ත්වයන්හි සිටින ළමයින් සඳහා රැකවරණ සැලැස්මක් සකස් කිරීම
- ළමයා ආපසු භාර දීම සහ සමාජගත කිරීම

අවදානම් සහගත තත්ත්වයක සිටින ළමයෙකු හඳුනා ගත් වහාම, හැකි ඉක්මනින් ළමයාගේ 'උපරිම යහපත පිළිබඳ ඇගයීමක්' සිදු කළයුතු ය. අනතුරට ලක්වීමේ ආසන්න අවදානමක් ඇති ළමයෙකු සම්බන්ධයෙන් වන විට, අදාළ පරිවාස නිලධාරියා සහ අනෙකුත් ළමා ආරක්ෂක නිලධාරීන් සමග එක්ව කටයුතු කරමින් වහාම මෙම ඇගයීම සිදුකර ළමයාගේ ආරක්ෂාව සහතික කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතු ය.

### 2.1.5 සෞඛ්‍ය සේවා වෙත යොමු කිරීම

පොලීසිය විසින් ළමයින් වෙළෙඳාම් කිරීමක වින්දිතයෙකු වූ පුද්ගලයෙකු හඳුනාගත් හෝ මුදාගත් පසු අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීම හෝ වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම පිණිස එම වින්දිතයාව ළඟම ඇති රජයේ රෝහලට හෝ අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත යොමු කළ යුතු ය.

අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් වින්දිත ළමයාගේ මූලික වෛද්‍ය පරීක්ෂණය සිදුකරනු ඇත. වින්දිත ළමයාව පරීක්ෂා කළ පසුව, වෛද්‍ය-නීතික පරීක්ෂණ පෝරමයක් (MLEF) සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.ඉන් පසුව, අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් අධිකරණ කටයුතු සඳහා අවශ්‍ය වන වෛද්‍ය-නීතික වාර්තාවක් නිකුත් කරනු ලැබිය යුතු ය. අප්‍රමාදව එම වෛද්‍ය නීතික වාර්තාව අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් ලබා ගැනීම සඳහා නියෝගයක් නිකුත් කරන ලෙස පොලීසිය අධිකරණයෙන් ඉල්ලා සිටිය යුතු ය.

ළමයා රෝහල්ගත කර සිටින්නේ නම්, එම රෝහල සහ අධිකරණ වෛද්‍ය නිලධාරි, මනෝ වෛද්‍යවරයා, ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයා සහ අනෙකුත් සායනික වෛද්‍යවරුන් ඇතුළු අදාළ වෛද්‍ය නිලධාරීන් විසින් සායනික සිද්ධි සාකච්ඡාවක් පවත්වනු ලැබේ. ළමයාගේ හදිසි වෛද්‍ය අවශ්‍යතා සපුරාලීම මෙහි අරමුණ වේ. සායනික සිද්ධි සාකච්ඡාව අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් මෙහෙයවනු ලැබේ. [12]

ඉන් අනතුරුව, ළමයාගේ රැකවරණය සහ ආරක්ෂාව සහ ළමයාගේ සමස්ත යහපැවැත්ම සහතික කිරීම සඳහා අවශ්‍ය පරිදි, පොලීසිය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස නිලධාරියා සහ වෛද්‍ය නිලධාරීන් වැනි ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග ආයතනික සිද්ධි සම්මන්ත්‍රණයක් පවත්වනු ලැබේ. ආයතනික සිද්ධි සම්මන්ත්‍රණයේ ප්‍රතිඵලය වනුයේ ළමයාගේ මනෝවිද්‍යාත්මක, වෛද්‍ය, සමාජීය සහ අධ්‍යාපනික අවශ්‍යතා හඳුනා ගනු ලබන බව සහතික කිරීම සඳහා ළමයා පිළිබඳ පරිපූර්ණ තක්සේරුවක් සිදු කිරීමයි. එකී සිද්ධි සාකච්ඡාවල වාර්තා අදාළ මහේස්ත්‍රාත්වරයා විසින් සලකා බලනු ලැබීම පිණිස අධිකරණයට ඉදිරිපත් කරනු ලැබේ. ළමයා 'යෝග්‍ය පුද්ගලයෙකුගේ භාරයට පත් කිරීමේ' නියෝගයක් නිකුත් කිරීම ඇතුළුව ළමයාගේ රැකවරණය සහ ආරක්ෂාව පිළිබඳ තීරණ ගැනීමේදී මහේස්ත්‍රාත්වරුන් විසින් මෙම සිද්ධි සාකච්ඡා වාර්තා දැඩි සැලකිල්ලට ගත යුතු ය.

11 https://www.unhcr.org/media/unhcr-guidelines-determining-best-interests-child

12 Chromeextension://efaidnbmnnnibpcajpcglclefindmkaj/https://medicine.kln.ac.lk/depts/forensic/images/LearningMaterials/Guidelines/National_Guideline_on_Child_Abuse_and_Neglect.pdf

2.1.6 ළමයා අධිකරණයට ඉදිරිපත් කිරීම

විමර්ශන අදියරේදී ළමයෙකු හෝ තරුණයෙකු මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කළ යුතුව තිබෙන අවස්ථාවක,ළමයින් හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනතේ 17(1) වෙනි වගන්තිය මගින් නියම කර ඇති පරිදි පොලිස් නිලධාරීන් විසින් අදාළ පරිවාස නිලධාරි වෙත දැනුම් දිය යුතු වේ.එකී ආඥාපනතේ උපලේඛනය අනුව පරිවාස නිලධාරි වෙත පහත සඳහන් තොරතුරු ලිඛිතව හෝ දුරකථනය ඔස්සේ වාචිකව දැනුම් දියයුතු ය.

(1) ළමයාගේ නම
(2) වයස
(3) ළමයාගේ ස්ත්‍රී-පුරුෂ භාවය
(4) වරද

පොලිස් 'ඒ' වාර්තාව සමග ළමයා අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය.

සැලකිල්ලට ගත යුතු විශේෂ කරුණු:

- සෑම විටම ළමා හිතකාමී කාර්ය පටිපාටිය අනුගමනය කළ යුතු ය.එමෙන්ම, ආබාධ සහිත ළමයින්ගේ විශේෂ අවශ්‍යතා/වුවමනා ද සැලකිල්ලට ගත යුතු ය.
- අදාළ සිද්ධියේ/ තත්ත්වයේ බරපතලකම සැලකිල්ලට ගනිමින්, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන ශ්‍රේෂ්ඨාධිකරණයේ නියමයන්ට (ඇමුණුම 4) අනුව සහ ළමයින් හා තරුණ තැනැත්තන් ආඥාපනත ප්‍රකාරව,ස්ථානාධිපතිවරයා විසින් වින්දිතයින්ට අදාළ කරුණු සම්බන්ධයෙන් නියම කර ඇති අදාළ මාර්ගෝපදේශ අනුගමනය කළයුතු ය. පරිවාස නිලධාරිගේ වාර්තාව ලැබීමෙන් පසුව අධිකරණය විසින් ළමයාගේ භාරකාරත්වය පිළිබඳව තීරණය කළ යුතු ය.

සටහන: ළමයින් සහ තරුණ තැනැත්තන් ආඥාපනතෙහි 17(2)වගන්තිය ප්‍රකාරව, පොලිස් නිලධාරියෙකුගෙන් දැනුම් දීමක් ලැබීමෙන් පසුව, පරිවාස නිලධාරි විසින් ළමයාගේ පසුබිම විමර්ශනය කර, අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් සකස් කළ යුතු වේ. රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය කරන වින්දිත ළමයින්ට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව හරහා විශේෂිත සහාය ලබා දෙනු ලබන බව සහතික කිරීම සඳහා මෙම ක්‍රියාවලිය ඇතුළත් කිරීම අතිශය වැදගත් වේ.

2.1.7 යෝග්‍ය පුද්ගලයෙකුගේ භාරයට පත්කිරීමේ නියෝගය

වින්දිත ළමයෙකු ආරක්ෂිත සහ පරිවාස නිලධාරියෙකුගේ අධීක්ෂණ බලතල යටතේ තිබෙන ස්ථානයක තැබීම සඳහා ළමයින් හා තරුණ තැනැත්තන් ආඥාපනතේ 35 - 38 වෙනි වගන්ති මගින් විධිවිධාන සලසා ඇත.

35 වෙනි වගන්තිය - ළමයෙකුට හෝ යොවුන් තැනැත්තෙකුට රැකවරණය අවශ්‍ය වන බවට බාලාපචාර අධිකරණයක් ලෙස ක්‍රියාකරන මහේස්ත්‍රාත් අධිකරණයක් සෑහීමකට පත්වන්නේ නම් සහ ළමයාට වයස අවුරුදු 12 සම්පූර්ණ වී ඇත්නම්, පහත සඳහන් පියවර අනුගමනය කළ යුතු ය.;

- ළමයාගේ රැකවරණය භාර ගැනීමට කැමති, ළමයාගේ ඥාතියෙකු හෝ භාරකරුවෙකු වන යෝග්‍ය පුද්ගලයෙකුගේ රැකවරණය යටතට ළමයා පත්කරන්න.
- ළමයා පිළිබඳ නිසි සැලකිල්ල දැක්විය යුතු බවට දැඩි උපදෙස් සමග ළමයාව දෙමව්පියන්ට හෝ භාරකරුට භාර දීම.
- ළමයා වසර තුනකට (3) නොවැඩි කාලයක් පරිවාස නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ තැබීම.
- ළමයාව අනුමත කළ හෝ සහතික ලත් පාසලකට යැවීම.

වින්දිත ළමයාගේ උපරිම යහපත තහවුරු කිරීම පිණිස සහ ආයතනගතව සිටින ළමයින්ට ආරක්ෂාව සැපයීම සහතික කිරීම පිණිස, විමර්ශන නිලධාරීන් පරිවාස නිලධාරීන් සමග සහ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ අදාළ නිලධාරීන් සමග එක්ව කටයුතු කළ යුතු වේ.

2.1.8 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය සමග සම්බන්ධීකරණය කිරීම

වින්දිත ළමයාට හෝ එම ළමයාගේ පවුලට තර්ජනයක් හෝ ආරක්ෂාව සම්බන්ධ අවදානමක් ඇති අවස්ථාවලදී 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ විශේෂ පොලිස් කොට්ඨාසය විසින් විමර්ශන නිලධාරීන්ට සහාය ලබා දෙනු ඇත.

එකී පනතේ iv වෙනි කොටසේ 27 සහ 28 වෙනි වගන්ති මගින් අපරාධයක වින්දිතයෙකුට හෝ සාක්ෂිකරුවෙකුට ආරක්ෂාව ඉල්ලා සිටීමට ඇති අයිතිය පිළිබඳ විධිවිධාන සලසා ඇත. මෙම පනත යටතේ අපරාධයක වින්දිතයෙකු හෝ සාක්ෂිකරුවෙකු වූ ඕනෑම අයෙකුට සපයා දිය හැකි ආරක්ෂාවෙහි ස්වභාවය පහත සඳහන් පරිදි විය හැක:

- අදාළ තැනැත්තාට හෝ දේපළවලට ආරක්ෂාව සැපයීම;
- නඩත්තුව සඳහා වන පහසුකම් ඇතුළුව තාවකාලික නවාතැන් සැපයීම;
- අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ කැමැත්ත ඇතිව ස්ථිරව හෝ තාවකාලිකව නැවත ස්ථානගත කිරීම;
- සම්පූර්ණ නඩු කටයුත්ත හෝ එහි කොටසක් හෝ අප්‍රසිද්ධියේ පැවැත්වීම;
- අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ අනන්‍යතාවය වසන් කිරීම;
- ළමයාගේ උපරිම යහපත සහතික කිරීම සඳහා සහ අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ඇතුළුව ළමයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂ පියවර ගැනීම;
- චූදිතයා මුණගැසීම මගින් අපරාධයේ වින්දිතයාට හෝ සාක්ෂිකරුට සිදුවිය හැකි හිරිහැර කිරීම්, බිය ගැන්වීම්, බලකිරීම් හෝ බලපෑම් වැළැක්වීම;
- මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය ඇතුළු මාධ්‍යවල අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ අනන්‍යතාව සහ පසුබිම් තොරතුරු හෙළිදරව් කිරීම වැළැක්වීම;
- අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු විසින් ලබා දිය හැකි සාක්ෂි අනාවරණය කිරීම වැළැක්වීම සඳහා සුදුසු පියවර අනුගමනය කිරීම.

වින්දිත ළමයින්ට අවශ්‍ය ආරක්ෂාව සහ සේවා ලැබෙන බව සහතික කිරීම සඳහා විමර්ශන නිලධාරින් අපරාධවල වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නිලධාරින් සමග සහ අපරාධවල වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහායදීම පිළිබඳ පොලිස් කොට්ඨාසයේ නිලධාරින් සමග සම්බන්ධීකරණයෙන් හා සමීප සහයෝගයෙන් යුතුව කටයුතු කළ යුතු ය.

## 2.2 දෙවෙනි අදියර - විමර්ශනය කිරීම

මෙම කොටසෙහි ළමයින්ට එරෙහි සංවිධානාත්මක අපරාධ හෝ වෙළෙඳාම් පිළිබඳව විමර්ශනය කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සැකෙවින් දක්වා ඇත. අදාළ සිද්ධියට සයිබර් අවකාශය සහ/හෝ ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සයිබර් අපරාධ සම්බන්ධ වන්නේ නම් අනුගමනය කළ යුතු අමතර කාර්ය පටිපාටියය පිළිබඳ දැනුවත් වීම සඳහා 3.3 වෙනි ඡේදය බලන්න.
විමර්ශනය සිදුකිරීමේ අදියර තුනක් ඇත:

1. විමර්ශනය සැලසුම් කිරීම
2. වින්දිතයන්/සාක්ෂිකරුවන් සමග සම්මුඛ සාකච්ඡා කිරීම
3. විමර්ශන සැලැස්ම සමාලෝචනය කිරීම

### 2.2.1 විමර්ශනය සැලසුම් කිරීම

විමර්ශනයේ මුල් අදියරේ දී, ස්ථානාධිපතිවරයා නිලධාරි විමර්ශන නිලධාරින් සමග වියිමත් සැලසුම්කරණ රැස්වීමක් පවත්වනු ලබන බව සහතික කර ගත යුතු ය. ඉන් අනතුරුව ස්ථානාධිපතිවරයා මේ දක්වා රැස්කර ගෙන තිබෙන සාක්ෂිවල සාරාංශයක් ලේඛනගත කර ගොනුකර,එම සාක්ෂි වින්දිතයන්ගේ සාක්ෂි ප්‍රකාශ, සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ප්‍රකාශ සහ ඉදිරිපත් වී ඇති අනෙකුත් සාක්ෂි ලෙස වර්ග කර ගතයුතු ය.වැඩිදුර විමර්ශනය කළ යුතු දේ ලැයිස්තුගත කර,එය 'වහාම' විමර්ශනය කළ යුතු, එනම් ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතු දේ ලෙස තවදුරටත් වර්ග කළ යුතු අතර, ඒවාට පහත සඳහන් දේ ඇතුළත් වේ:

- ප්‍රධාන සාක්ෂිකරුවන් හඳුනා ගැනීම සහ ඔවුන් සමග සම්මුඛ සාකච්ඡා කිරීම
- තවදුරටත් වින්දිත වූවන් හඳුනා ගැනීම
- අපරාධ ස්ථාන විය හැකි ස්ථාන තවත් තිබේ නම් ඒවා හඳුනා ගන්න
- සාක්ෂි ලබා ගැනීම සඳහා සෝදිසි කළ යුතු ස්ථාන හඳුනා ගැනීම
- සෝදිසි කිරීම සහ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම

අදාළජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරින් සහ කොට්ඨාස - එනම් දිස්ත්‍රික්කයේ සහකාර පොලිස් අධිකාරීවරයා / ළමා හා කාන්තා කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය / අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත විමර්ශනවල ප්‍රගතිය පිළිබඳව දැනුම් දිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවලදී නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය සිදු කළයුතු ය.

සටහන - සිදුකර ඇති වැරදි හඳුනා ගැනීම සඳහා උපකාරීවීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය කිරීම සහ විමර්ශන සාකච්ඡා පැවැත්වීම පිළිබඳ තොරතුරු සඳහා 5.2.4.1 වෙනි ඡේදය බලන්න.

සම්පත් : අපරාධයේ ස්වභාවය සහ බරපතලකම අනුව එක් එක් සිද්ධිය සඳහා අවශ්‍යකරන විමර්ශන නිලධාරීන් සංඛ්‍යාව පත්කරනු ලබන බව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහතික කරගත යුතු ය.අවශ්‍ය පුහුණුව සහිත නිලධාරීන් මෙම කණ්ඩායමට ඇතුළත් විය යුතු ය.විමර්ශන නිසි පරිදි අවසන් කිරීමට හැකිවනු පිණිස සෑම විමර්ශනයක් සඳහා ම අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සහ අනෙකුත් පරිපාලනමය සහාය වැනි සැපයුම් සපයා දිය යුතු බව සැලකිල්ලට ගත යුතු ය.

ආයතන අතර සන්නිවේදනය : සමීප සහයෝගීත්වය හරහා විමර්ශනය සාර්ථක කර ගැනීම පිණිස සහ ළමයාගේ උපරිම යහපත ආරක්ෂා කිරීම සහතික කිරීම පිණිස, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය සහ සහ රෝහල් වැනි ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන අදාළ ආයතන සමග සන්නිවේදනය කිරීම සඳහා පැහැදිලි කාර්ය පටිපාටිය අනුගමනය කරමින් ආයතන අතර සන්නිවේදනය සිදුකිරීම වැදගත් වේ.
**සහයෝගීතාව**: අවශ්‍ය විට සහ අවශ්‍ය පරිදි පොලීසිය අදාළ පරිවාස නිලධාරීන් සමග සහ ළමයා ආරක්ෂිත රැකවරණය සඳහා තබා ඇති ආයතනවල කාර්ය මණ්ඩලය සමග සන්නිවේදනය කළ යුතු ය.විමර්ශනවල ප්‍රගතිය ඇගයීම පිණිස සහ ළමයා සම්බන්ධ සිද්ධිය කළමනාකරණය කිරීම සඳහා අදාළ වන අනෙකුත් කරුණු සොයා බැලීම පිණිස මාසයකට වරක් අදාළ පරිවාස නිලධාරියා සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරියා සමග සාකච්ඡා කළ යුතු ය.

බාල වයස්කරුවන් ඇතුළු අතුරුදහන් වූවන් සිටින ස්ථාන සොයා ගැනීම, පුද්ගලයන් හඳුනා ගැනීම හෝ විදේශයන්හි සැකකරුවන් සහිත ස්ථාන හඳුනා ගැනීම, අත්අඩංගුවට ගැනීම් සඳහා නොතීසි නිකුත් කිරීම, අන්‍යෝන්‍ය නීති සහාය සහ මෙරටට පිටුවහල් කිරීම ආදියට අදාළව ජාත්‍යන්තර පොලීසිය / අධිකරණ අමාත්‍යාංශය / විදේශ කටයුතු අමාත්‍යාංශය සමග සහයෝගයෙන් කටයුතු කිරීම පිළිබඳ දැනුවත් වීම සඳහා 5.2.4.5 වැනි වගන්තිය කියවන්න.

### 2.2.2 ළමා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සමග සම්මුඛ සාකච්ඡා කිරීම

ළමයාගේ අයිතිවාසිකම් සහ ළමයා නැවත වින්දිතභාවයට පත්වීම වැළැක්වීම සැලකිල්ලට ගනිමින් ළමා හිතකාමී සහ වින්දිත-කේන්ද්‍රීය වූ ප්‍රවේශයක් භාවිතා කරමින් ළමයාව සම්මුඛ පරීක්ෂණයට ලක් කරනු ලබන බව සහතික කිරීම සඳහා 'සේව් ද චිල්ඩ්රන් ශ්‍රී ලංකා' සහ සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ සහයෝගීත්වය සහ තාක්ෂණික සහාය ඇතිව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සකස් කරන ලද 'වෙළෙඳාම්වල වින්දිතයින් වන ළමයින් සමග සම්මුඛ සාකච්ඡා කිරීම පිළිබඳ නීතිය බලාත්මක කරන බලධාරීන් සඳහා වන මාර්ගෝපදේශ' බලන්න. [13]

කථා පරිවර්තකවරුන් යොදා ගැනීම:

කථා පරිවර්තකවරුන්ගේ සහාය අවශ්‍ය වන විට, පොලිස් නිලධාරීන්ට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පිළිගත්, විශ්වවිද්‍යාලයක භාෂා පීඨයකින් කථා පරිවර්තකවරුන් ඉල්ලා සිටිය හැක. සංඥා භාෂාව භාවිතා කරන ළමයෙකු සිටින්නේ නම්, පොලිස් ස්ථානාධිපතිවරයා සමාජ සේවා දෙපාර්තමේන්තුව වැනි අදාළ දෙපාර්තමේන්තු හෝ ආයතනවලින් අවශ්‍ය සංඥා භාෂා පරිවර්තන පහසුකම්සපයා දීමට වැඩපිළිවෙළ යෙදිය යුතු ය. අපරාධකරුවන්ගේ බලපෑම හේතුවෙන් ළබැඳියා පිළිගැටුමක් හෝ සට්ටනයක් ඇති නොවන බව සහතික කිරීම සඳහා අනුමත සහ විධිමත් මාර්ග හරහා පමණක් කථා පරිවර්තන සහ සංඥා භාෂා සේවා ලබා ගත යුතු ය.

සමගාමී වීඩියෝ පටිගත කිරීම

ළමයින් වෙළෙඳාම් කිරීම්වල වින්දිතයන් වූ ළමයින්ගේ ප්‍රකාශ හැකි ඉක්මනින් සටහන් කර ගත යුතු ය. 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධාන ප්‍රකාරව, ශ්‍රව්‍ය/වීඩියෝ පටිගත කිරීම් හරහා ප්‍රකාශ පටිගත කර ගත හැකි අතර එය අධිකරණය විසින් පිළිගනු ලැබේ.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වීඩියෝ පටිගත කිරීමේ ඒකකයෙහි සහ රාගම, උතුරු කොළඹ ශික්ෂණ රෝහල යටතේ ඇති බහුවිෂයයික කණ්ඩායමක් විසින් පාලනය කරනු ලබන 'ළමා පියස' මධ්‍යස්ථානයෙහි ඇති පහසුකම් හරහා ළමයෙකුගේ ප්‍රකාශවල වීඩියෝ පටිගත කිරීම්සිදු කර ගත හැක.

13 Guidelines for Law Enforcement Officials on Interviewing Child Victims of Trafficking.pdf (savethechildren.net)

වින්දිත ළමයෙකුගේ ප්‍රකාශයක වීඩියෝ පටිගත කිරීමක් සිදු කිරීමේදී විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු කරුණු වෙළෙඳාම්වල වින්දිතයන් වූ ළමයින් සමග සම්මුඛ සාකච්ඡා කිරීම පිළිබඳ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සඳහා වන පහත සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කරන්න.

1. අපේක්ෂා කරන පිළිතුර දීමට පොළඹවන ආකාරයේ ප්‍රශ්න නොඅසන්න.
2. ළමයාට සහ ළමයාගේ අවශ්‍යතාවලට ගරු කරන්න.
3. වින්දිතයා ඉතා කුඩා ළමයෙකු වන විට දෙමව්පියෙකු / භාරකරුවෙකු සිටින බව සහතික කර ගන්න.
4. දෙමව්පියන්/භාරකරු/සම්මුඛ සාකච්ඡාකරු ළමයා කිව යුතු දේ පිළිබඳව ළමයාව පුහුණු කිරීම හෝ ළමයාට සිහිපත් කරදීම නොකරන බව සහතික කරන්න.
5. ළමයාගේ ප්‍රකාශය අනුව ම එය සටහන් කරගෙන ඇති බව සහ කොටස් අත්හැරීම හෝ මකා දැමීම සිදු නොකරන බව සහතික කර ගන්න.
6. වීඩියෝ පටිගත කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දෙන පොලිස් නිලධාරියා ද අධිකරණයේ සාක්ෂි ලබා දිය යුතු ය.

1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ 7 වෙනි වගන්තිය මගින් දැනුම් දීමේ කාල සීමාවක් ලබා දී ඇත - පටිගත කළ වීඩියෝ පටය පරීක්ෂා කරනු ලැබීම සඳහා ලබා ගැනීමට හැකිය යුතු ය. වීඩියෝ සම්මුඛ සාකච්ඡාවලට අදාළ සාක්ෂි 1999 අංක 32 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතෙහි 163(අ) වැනි වගන්තිය යටතේ දක්වා ඇති විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2.2.3 විමර්ශන සැලැස්ම සමාලෝචනය කිරීම

විමර්ශන නිලධාරියා විමර්ශන සැලැස්ම සමාලෝචනය කර, වැඩිදුරටත් විමර්ශන කළ යුතු දේ මොනවාද යන්න තීරණය කළ යුතු ය.

සමාලෝචන ක්‍රියාවලියට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතු ය:

**විමර්ශනයේ මීළඟ පියවර**

කාලෝචිතභාවය සහ සම්පත් ලබා ගැනීමේ හැකියාව ද සැලකිල්ලට ගනිමින්, අදාළ කාරණය විමර්ශනය කිරීම සඳහා වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ක්‍රමය කුමක්ද යන්න තීරණය කරන්න.

**විමර්ශන ක්‍රියාවලීන්**

සිදුකරනු ලබන විමර්ශනයෙහි පුළුල්කම විමර්ශනයට භාජනය වන කාරණයෙහි බරපතලකමට සහ ඒ ආශ්‍රිත අවදානම්වලට සමානුපාතික වන බවත්, වින්දිතයාට තවදුරටත් බලපෑම් ඇතිවීම වළක්වා ගැනීමට සහ විමර්ශනයෙහි අඛණ්ඩතාවයට ඇති වන අවදානම් අවම කිරීමට හැකි වන පරිදි සිදුවීම් හෝ ගැටළු නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා සැලැස්මක් ඇති බවත් සහතික කර ගත යුතු ය. විමර්ශන කාර්ය පටිපාටිවල තිබෙන යහ පරිචයන් අනුගමනය කළ යුතු අතර, ඒවා අදාළ නීතිවිධිවිධානවලට සහ පොලිස් නියෝගවලට අනුකූල විය යුතු ය. එසේම අදාළ නොවන කරුණු විමර්ශනය කිරීමෙන් ඇති විය හැකි අවදානම් වළක්වා ගන්න.

2.2.4 වැඩිදුර විමර්ශන සිදු කිරීම

අදාළ විමර්ශන නිලධාරියා වැඩිදුර විමර්ශනවලදී රැස් කරගත් කරුණුවල සාරාංශයක් අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය. ඉන් පසුව විමර්ශන නිලධාරියා විසින් අවශ්‍ය පරිදි පහත සඳහන් දෑ සම්බන්ධයෙන් නියෝග නිකුත් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටිය යුතු ය:

(1) වෛද්‍ය-නීතික වාර්තාව
(2) රජයේ රස පරීක්ෂක වාර්තාව
(3) ළමයාගේ රැකවරණය සහ ආරක්ෂාව සඳහා නියෝගය
(4) අදාළ සැකකරුවන් රක්ෂිත බන්ධනාගාරගත කිරීම
(5) අවශ්‍ය අවස්ථාවලදී සාක්ෂි වීඩියෝ පටිගත කිරීම

2.2.4.1. වත්කම් අත්හිටුවීම / රාජසන්තක කිරීම
වැඩිදුර විමර්ශනවලදී අපරාධවලින් උපයාගන්නා ලද ආදායමෙන් ලබාගත් වත්කම් අත්හිටුවීම හෝ රාජසන්තක කිරීම කෙරෙහි ද විශේෂ අවධානය යොමු කළ යුතු ය. එසේ කළ යුත්තේ, වෙළෙඳාම් අපරාධවල ප්‍රතිඵලයක් ලෙස නීතිවිරෝධී ආකාරයෙන් උපයාගෙන ඇති වත්කම් පිළිබඳ සාක්ෂි රැස් කිරීම, අපරාධකරුවන් අයථා ලෙස උපයාගත් වත්කම් අපරාධකරුවන්ට අහිමි කිරීම සහ අපරාධවල වින්දිතයන්ට වන්දි ගෙවීමට උපකාර කිරීම සහතික කිරීම සඳහා ය.

**01 වත්කම් රාජසන්තක කිරීම**

1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත (6(1)(ඇ) වැනි වගන්තිය),2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත (24, 25, 26 වැනි වගන්ති) වැනි විශේෂිත නීති, බැංකුකරණය සම්බන්ධ නීති (උදා:1988 අංක 30 දරන බැංකු පනතේ 57, 67 වෙනි වගන්ති), අපරාධ නඩු විධාන සංග්‍රහය සහ 1870 රේගු ආඥාපනත (උදා: රේගු ආඥාපනතේ 125 වැනි වගන්තිය) නීති මගින් වත්කම් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා ඇත. අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කරනු ලැබ, සැඟවී සිටින පුද්ගලයකුගේ වත්කම් අත්අඩංගුවට ගැනීමට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 60 සහ 61 වෙනි වගන්තිවලට අනුව අධිකරණයට අවසරය තිබේ.

**(2) මුදල් විශුද්ධිකරණය**
මුදල් විශුද්ධිකරණය පිළිබඳ වරද සම්බන්ධයෙන් වූ විට, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත මගින් වත්කම් අත්හිටුවීම සඳහා විධිවිධාන සලසා ඇත (6 - 12 වෙනි වගන්ති)

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 13 - 16 වෙනි වගන්ති මගින් මුදල් විශුද්ධිකරණය සම්බන්ධ වරදකට අදාළ වත්කම් රාජසන්තක කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා ඇත.

ඉහත සඳහන් විධිවිධානවලට අමතරව, අපරාධ නඩු විධාන සංග්‍රහය (1979 අංක 15 දරන) පනතේ 29, 426, 431 සහ 433 වැනි වගන්ති යටතේ ඇති විධිවිධාන අපරාධවලින් උපයා ගත් දේපළ රාජසන්තක කිරීම සම්බන්ධයෙන් අදාළ වේ.

ළමයින් වෙළෙඳාම් කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් සැක කරනු ලබන පුද්ගලයෙකු සතු අපරාධවලින් උපයාගත් දේපළ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විමර්ශන නිලධාරියෙකුට 'පොලිස් නීති විරෝධී වත්කම් සහ බුද්ධිමය දේපළ විමර්ශන ඒකකයේ' සහාය ලබා ගත හැක.

2.2.4.2 වැරදි හඳුනා ගැනීම - ළමයින් වෙළෙඳාම් කිරීමේ මූලික ලක්ෂණ තහවුරු කර ගැනීම

සැක කරුවන්ගෙන් ප්‍රශ්න කරන විමර්ශන නිලධාරියා වෙළෙඳාම් අපරාධයේ මූලික ලක්ෂණ තහවුරු කර ගැනීමට උපකාරී වනු පිණිස පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු ය.

1. ළමයින් වෙළෙඳාම් කිරීමේ සමස්ත ක්‍රියාවලිය ම අවබෝධ කර ගැනීමට උපකාරී වන කරුණු වැරදිකරුවන්ට එරෙහි සාක්ෂි අනාවරණය කර ගැනීමට පමණක් නොව, පුද්ගලයන් වෙළෙඳාම් කිරීමේ අපරාධ වැළැක්වීමසඳහා අවශ්‍ය තොරතුරු ද ලබා දෙන ඉල්ලුම් -සැපයුම් රටාවන් සහ 'පුද්ගලයන් ඔවුන් පදිංචි ස්ථානවලින් පිටව යාමට පොළඹවන සාධක සහ පිටව යන ස්ථානයට ආකර්ෂණය කර ගන්නා සාධක'ආදිය.
    - 1.1. වින්දිතයා/වින්දිතයින් විසින් කරන ලද පැමිණිල්ල/පැමිණිලි අනුව, වින්දිතයා/වින්දිතයින් සැකකරුව/සැකකරුවන්ව දැනහැඳින ගත්තේ කෙසේද? වින්දිතයා/විනදිතයන් සහ සැකකරු/සැකකරුවන් අතර ඇති සම්බන්ධය හෙළිකළ යුතු ය.
    - 1.2. සැකකරු/සැකකරුවන් විසින් ලබාදෙන ලද ප්‍රකාශය/ප්‍රකාශ අනුව, සැකකරු/සැකකරුවන් වින්දිතයාව/වින්දිතයන්ව හැඳින ගත්තේ කෙසේද?
    - 1.3. ඉහත සඳහන් පරිදි ලබාගත් තොරතුරු අතර පරස්පරතාවයන් තිබේ නම් ඒවා හඳුනා ගැනීම පිණිස සහ වැඩිදුර විමර්ශන සිදු කිරීම පිණිස අනාවරණය කර ගන්නා කරුණු වෙන් වෙන්ව සඳහන් කළ යුතු ය.
    - 1.4. මෙම සිද්ධියට අමතර පාර්ශවයන් සම්බන්ධ බව වින්දිතයා/වින්දිතයින් හෝ සැකකරු/සැකකරුවන් ප්‍රකාශ කරන්නේ නම්, එම පුද්ගලයාගේ/පුද්ගලයන්ගේ ප්‍රකාශවල කෙටි සාරාංශයක් 'බී' වාර්තාවට අමුණා තිබිය යුතු ය.

2. අදාළ අවස්ථාවල දී වෙළඳාමේ සමස්ත සංවිධානාත්මක සම්බන්ධය (පුද්ගලයන් ලබා ගන්නා ස්ථානය - අතරමැදි ස්ථාන - ගමනාන්තය) අනාවරණය කර ගැනීම සඳහා අවශ්‍යවන කරුණු.
3. අදාළ අවස්ථාවල දී, පුද්ගලයන් ලබා ගන්නා ස්ථානය - අතරමැදි ස්ථාන -ගමනාන්තය යන ප්‍රදේශවල අදාළ පුද්ගලයන් සම්බන්ධ කර ගත හැකි ආකාර, පුද්ගලයන් සපයා ගන්නා මූලාශ්‍ර සහ සාක්ෂිකරුවන් පිළිබඳ සොයා බලන්න.
4. වින්දිතයින්ව ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රවාහන මාධ්‍ය, මාර්ග සහ ක්‍රම සොයා ගන්න.
5. වෙළෙඳාම් කරුවන් විසින් භාවිතා කරනු ලබන සන්නිවේදන ක්‍රම (ජංගම දුරකතන, අන්තර්ජාලය ආදිය) පිළිබඳව සොයා බලන්න.
6. වෙළෙඳාම්කරුවන්ගේ ක්‍රියා පිළිවෙළ විමර්ශනය කරන්න. (ඔවුන්ගේ මෙහෙයුම් සිදුකරන සියලු ම ක්‍රම සහ විධි; රැකියා ලබා දෙන බවට පොරොන්දු වීම, මුදල් ණයට දීම, සමීප සම්බන්ධතා, සමාජ මාධ්‍ය භාවිතය ආදී උපාය මාර්ග සහ උපක්‍රම).
7. ජාවාරුම්කරුවන් මෙයට පෙර අපරාධ සම්බන්ධයෙන් වරදකරුවන් වී ඇත්ද යන්න සහ අත්අඩංගුවට පත්වී ඇත්ද යන්න තහවුරු කරගන්න, මෙම වැරදිකරුවන් විසින් ම මෙයට පෙර වෙළෙඳාම් කරන ලද වින්දිතයන් සොයා ගෙන ඔවුන්ව බේරා ගන්න (වෙළෙඳාම් කරුවන් වැරදිකරුවන් කරනු ලැබුව හොත්, එකම වැරදි / සමාන වැරදි සඳහා මෙයට පෙර වරදකරුවන් වී තිබීම දඬුවම් නියම කිරීමේ අදියරේදී දඬුවම උග්‍ර කරවන තත්ත්වයක් ලෙස සලකනු ලබන නිර්ණායක වේ).
8. වෙළෙඳාම් කරුවන්ගේ චේතනාවන්/අභිප්‍රායන්/වරද කිරීමට පෙළඹුණු හේතු අවබෝධ කර ගන්න.
9. වැරදිකරුවන් අතර සිදුවී ඇති මූල්‍ය ගනුදෙනු පිළිබඳ තොරතුරු සොයා ගන්න.
10. නීති විරෝධී වත්කම් පිළිබඳව සොයා බලා ඒ අනුව අවශ්‍ය පියවර ගන්න.
11. මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදු කරන්න.

මෙම අදියරේදී විමර්ශන නිලධාරියා ළමයින් වෙළෙඳාම් කිරීමේ ක්‍රියාවලිය තුළ සිදු කර ඇති විවිධ වැරදි හඳුනා ගෙන, පොලිස් ‘බී’ වාර්තාවේ සැකකරුවන්ට එරෙහිව ඇති චෝදනාවලට අදාළ නීති විධිවිධාන ඇතුළත් කළ යුතු ය.එම වැරදි ඔප්පු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට නිලධාරියා සහතික කරගත යුතු ය.ළමයින් වෙළෙඳාම් කිරීමේ අපරාධයක මූලික ලක්ෂණ පිළිබඳ වැඩිදුර කරුණු අවබෝධ කර ගැනීම සඳහා කරුණාකර ඇමුණුම 1 බලන්න.

විමර්ශනවල දී සංකීර්ණ නීතිමය ගැටලු ඇතිවන්නේ නම් විමර්ශන අවසන් කිරීමට පෙර වුවද අවශ්‍ය නම් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ඉල්ලා සිටිය හැක. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 393 වෙනි වගන්තිය මගින් ඕනෑම විමර්ශනයක් සම්බන්ධයෙන් මගපෙන්වීමට හෝ උපදෙස් දීමට නීතිපති දෙපාර්තමේන්තුවට බලය ලබා දී තිබේ.

සංවිධානාත්මක අපරාධයක් සිදුවී ඇතැයි සැක කෙරෙන හෝ විමර්ශන සංකීර්ණ ස්වභාවයකින් යුක්ත වන අවස්ථාවලදී, ළමා හා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂවරයාට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට හෝ මිනිස් වෙළෙඳාම් මැඩලීමේ ඒකකයේ සහකාර පොලිස් අධිකාරිවරයාට නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගෙන නීති උපදෙස් ලබා ගැනීමට සහ මිනිස් වෙළෙඳාමක් / ළමා වෙළෙඳාමක් සිදුවී තිබිය හැකිද යන්න පිළිබඳ විශේෂ කරුණු සාකච්ඡා කළ හැක.

විමර්ශන නිලධාරියා විසින් ළමයින් වෙළෙඳාම් කිරීමේ අපරාධයේ මූලික අංග හඳුනා ගැනීමෙන් පසුව, සාක්ෂිවල අඩුපාඩු තිබේද යන්න පිළිබඳ ඇගයීමක් සිදු කළයුතු අතර, එම අපරාධයේ මූලික කරුණු සනාථ කිරීම සඳහා තවදුරටත් විමර්ශන සිදු කළ යුතුද යන්න පිළිබඳ සලකා බැලිය යුතුය. තවද, පොලීසියට ගරු මන්ත්‍රීවරයාගේ උපදෙස් ඉල්ලා සිටිය හැක. විදේශ රටවලින් අන්‍යොන්‍ය නීති සහාය ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද පොලීසියට නීතිපතිවරයාගෙන් උපදෙස් ඉල්ලා සිටිය හැක.

මිනිස් වෙළෙඳාමත් සමග බොහෝ විට සිදු කරනු ලබන අනෙකුත් වැරදි:

දණ්ඩ නීති සංග්‍රහය

| | | |
|---|---|---|
| 285 වෙනි වගන්තිය | - | අසභ්‍ය පොතපත විකිණීම |
| 286 වෙනි වගන්තිය | - | විකිණීම හෝ මහජන ප්‍රදර්ශනය සඳහා අසභ්‍ය පොත් හෝ වෙනත් දෑ ළඟ තබා ගැනීම |
| 286(අ) වෙනි වගන්තිය | - | ළමයින් සම්බන්ධ අසභ්‍ය ප්‍රකාශන ප්‍රදර්ශනය කිරීම |
| 286(ආ) වෙනි වගන්තිය | - | පරිගණකයක් මගින් සේවා සපයන තැනැත්තෙකු විසින්ළමයෙකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සඳහා එම පරිගණක පහසුකම භාවිත නොකරන බවට සහතික වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගත යුතු ය. |
| 286(ඇ) වෙනි වගන්තිය | - | ළමයෙකු අපයෝජනය කිරීම සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා යම් පරිශ්‍රයක් භාවිතා කරමින් සිටින බව දැන ගැනීමට ලැබෙන එම පරිශ්‍රය භාරව සිටින හෝ එම පරිශ්‍රයට රැකවරණය ලබා දෙන, එය පාලනය කරන හෝ එහි සන්තකය දරන යම් තැනැත්තෙක් එසේ දැනගැනීමට ලැබුණු විට එම කරුණ පිළිබඳව ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙත වහාම දැනුම් දිය යුතු ය. |
| 310 - 329 වෙනි වගන්ති | - | තුවාල කිරීම |
| 330 - 339 වෙනි වගන්ති | - | අයුතු අවහිරය සහ අයුතු සිරකර තැබීම |
| 340 -349 වෙනි වගන්ති | - | සාපරාධී බලහත්කාරය සහ අඩන්තේට්ටම් කිරීම |
| 350 වෙනි වගන්තිය | - | අපහරණය |
| 352 වෙනි වගන්තිය | - | නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම |
| 353 වෙනි වගන්තිය | - | පැහැර ගෙන යාම |
| 356 වෙනි වගන්තිය | - | රහසිගත සහ අයුතු ලෙස සිරගත කර තැබීමේ චේතනාවෙන් පැහැරගෙන යාම හෝ අපහරණය කිරීම. |
| 358 වෙනි වගන්තිය | - | බරපතල තුවාල සිදු කිරීමකට හෝ වහල්භාවයට යටත් කිරීම සඳහා යම් තැනැත්තෙකු අපහරණය කිරීම හෝ පැහැර ගැනීම |
| 358 (අ) වෙනි වගන්තිය | - | ණය බැඳීමකට හෝ දාසභාවයට පත් කිරීම, බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් ශ්‍රමය ලබා ගැනීම, වහල්කමට භාජනය කිරීම සහ සන්නද්ධ ගැටුම් සඳහා ළමයින් බඳවා ගැනීම |
| 360(අ) වෙනි වගන්තිය | - | කුට්ටනය |
| 360(ආ) වෙනි වගන්තිය | - | ළමයින් ලිංගිකව සූරාකෑම |

**1941 අංක 51 දරන අයාල ආඥාපනත**

| | | |
|---|---|---|
| 9(1) වෙනි වගන්තිය | - | (අ)- දැන දැනම ගණිකා වෘත්තියේ ඉපැයීම් මත සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් ජීවත් වීම. |
| | | (ආ) - නීතිවිරෝධී හෝ අස්වාභාවික සංසර්ගයේ යෙදවීමේ අරමුණ ඇතිව ක්‍රමානුකූලව පුද්ගලයන් සපයා ගන්නා, තැනැත්තෙකු අසාධනීය ධූර්තයෙකු ලෙස සැලකිය යුතු ය. |
| 11 වෙනි වගන්තිය - | - | ගැහැණු ළමයෙකු දූෂණය කිරීම හෝ ගණිකා වෘත්තියේ යෙදවීම හෝ නීති විරෝධී කාම සංසර්ගය |

1989 අංක 05 දරන ගණිකා නිවාස ආඥාපනත

| | | |
|---|---|---|
| 2 වෙනි වගන්තිය | - | ගණිකා නිවාසයක් පවත්වාගෙන යාම හෝ කළමනාකරණය කිරීම හෝ කළමනාකරණයට සහාය වීම |

ළමයින් වෙළෙඳාම් කිරීමේ වරද සමග විමර්ශනය කළ හැකි වෙනත් නීති යටතේ ඇති වැරදි:
1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත

| | | |
|---|---|---|
| 62(1) වෙනි වගන්තිය | - | අනවසර බඳවා ගැනීම් |
| 62(2) වෙනි වගන්තිය | - | බලපත්‍රයක් නොමැතිව ක්‍රියාත්මක කිරීම |
| 63(ආ) වෙනි වගන්තිය | - | ව්‍යාජ ලේඛන සකස් කිරීම හෝ පිටව යාමට පෙළඹවීම |
| 64 වෙනි වගන්තිය | - | අනවසර ගාස්තු අයකිරීම |
| 67(අ) වෙනි වගන්තිය | - | පොදු දණ්ඩන |
| 67(ආ) වෙනි වගන්තිය | - | පනත යටතේ වන වරදක් සඳහා ආධාර හා අනුබල දීම |
| 68 වෙනි වගන්තිය | - | 63 වෙනි සහ 64 වෙනි වගන්ති යටතේ වන වරදක් නැවත සිදු කිරීම |

1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත

| | | |
|---|---|---|
| 45(අ)(1) වෙනි වගන්තිය | - | පනතෙහි විධිවිධානවලට පටහැනිව පුද්ගලයන් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ වරද |
| 45(1)(ආ) වෙනි වගන්තිය | - | පනතෙහි විධිවිධානවලට පටහැනිව ශ්‍රී ලංකාව හැර යාම |
| 45(ඇ)(1) වෙනි වගන්තිය | - | පුද්ගලයන්ට ශ්‍රී ලංකාව හැර යාමට පහසුකම් සැලසීම (2006 අංක 31 දරන පනත මගින් සංශෝධිත පරිදි) |

2.2.4.3 සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම සහ ඔවුන් අත්අඩංගුවට ගැනීම

පොලිස් නිලධාරින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙ හි විධිවිධාන ප්‍රකාරව සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සිදු කළ යුතු ය.

සලකා බැලිය යුතු විශේෂ කරුණු:

- විමර්ශන නිලධාරින්ට පුද්ගලයන් කාණ්ඩ දෙකක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදු වනු ඇත - සැකකරුවන් සහ වින්දිතයන් එම කාණ්ඩ දෙකයි.

- වින්දිත ළමයින් සෑම විටම සැකකරුවන්ගෙන් වෙන්කර තිබීම වැදගත් වේ.

- 2018 අංක 10 දරන දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනතේ 76 වෙනි වගන්තිය ප්‍රකාරව, අදාළ අවස්ථාවේ දී තමන්ගේ චර්යාවෙහි ස්වභාවය සහ එහි ප්‍රතිවිපාක විනිශ්චය කිරීමට තරම් අවබෝධයෙහි පරිණතභාවයක් නොමැති, වයස අවුරුදු අටට වැඩි සහ දොළහට අඩු ළමයෙකු විසින් සිදු කරනු ලබන කවර හෝ ක්‍රියාවක් වරදක් නොවන්නේ ය.

- වයස අවුරුදු 12 ට වැඩි ළමයකු මත අපරාධ වගකීම ඇතැයි සලකනු ලැබේ. ළමයා අවුරුදු 12 - 14 අතර වයසේ නම්, එවැනි අපරාධ වගකීමක් භාර ගැනීමට තරම් ළමයාගේ ශාරීරික හා මානසික තත්ත්වය කෙබඳු ද යන්න තහවුරු කර ගැනීම සඳහා විනිසුරුවරයා විසින් ළමයාව විශේෂ වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කරනු ඇත.

- 2018 අංක 11 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ 122(අ) වගන්තිය මගින් වයස අවුරුදු දොළහ සහ එයට වැඩි සහ අවුරුදු දාහතරට අඩු ළමයෙකු විසින් කරන ලදැයි සැලකෙන වරදක් සම්බන්ධයෙන් එම ළමයාව වෛද්‍ය පරීක්ෂණයකට යොමු කිරීමට අදාළ විධිවිධාන සලසා ඇත.

කෙසේ වෙතත්, පුද්ගලයින් වෙළෙඳාම් කිරීමේ සිද්ධීන් හි දී, ඇත්ත වශයෙන් ම සැකකාර ළමා අපරාධකරුවන් බලහත්කාරයෙන්, රැවටීමට ලක්කර හෝ තර්ජනයට ලක්කර වෙළෙඳාම් සම්බන්ධ වැරදි සිදු කිරීමට ඔවුන්ට බල කරනු ලැබ තිබිය හැකි බව සැලකිල්ලට ගත යුතු අතර, වැරදිකාර ළමයාට එවැනි අපරාධයක් සිදු කිරීමට තරම් දැනුමක් හෝ චේතනාවක් තිබුණි ද යන්න තක්සේරු කිරීම සඳහා තොරතුරු රැස් කිරීමට පොලිස් නිලධාරින් හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු ය.

සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම සැලසුම් කිරීම

පහත සඳහන් දෑ පිළිබඳ තීරණය කරන්න:

- ප්‍රශ්න කළ යුතු සැකකරුවන් සංඛ්‍යාව;
- ප්‍රශ්න කිරීම සඳහා සිටින සම්මුඛ සාකච්ඡාකරුවන් සංඛ්‍යාව;
- වැරදි සිදු කර ඇතැයි පැවසෙන, විභාග කළ යුතු සිද්ධි සංඛ්‍යාව;
- අපරාධය සම්බන්ධයෙන් ආවරණය කළ යුතු කාල රාමුව;
- පරීක්ෂණය කළ යුතු විය හැකි, සාක්ෂිමය කරුණුවල සංකීර්ණතාව;
- සැකකරුවන් පොලිස් අත්අඩංගුවේ තබා ගත හැකි කාල සීමාව

**සැකකරුවන් අවම වශයෙන් පැය 24 ක් රඳවා තබා ගත යුතු අතර, එහෙත් රැඳවුම් නියෝගයක් යටතේ එය පැය 72 ක් දක්වා දීර්ඝ කළ හැක.

2.2.4.4. සාක්ෂිවල සාරාංශයක් සහිත ‘බී’ වාර්තාව සකස් කිරීම

මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන‘බී’ වාර්තාවේ පහත සඳහන් කරුණු අඩංගු විය යුතු ය:

- පැමිණිල්ලේ කෙටි සාරාංශයක්
- ළමයකු වෙළෙඳාම් කරනු ලැබීමට, සූරාකෑමට, සැපයුම් කරනු ලැබීමට, දූෂණය කිරීමකට හෝ බරපතල ලිංගික අපයෝජනයකට ලක්ව ඇති බවට අනාවරණය වී ඇත්නම් එම තොරතුරු ඇතුළත්, පොලීසිය විසින් රැස්කර ඇති සාක්ෂිවල සාරාංශය.

2.2.4.5. මහේස්ත්‍රාත් හමුවට පැමිණවීම (‘බී’ වාර්තාව සමග)

සැකකරුවන් වරදක් සිදු කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි තිබේ නම් සැකකරුවන් මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළයුතු ය. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන යටතේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කළයුතු ය. (116 - 120 වෙනි වගන්ති).

2.2.4.6 රිමාන්ඩ් භාරයේ තැබීම සහ ඇප දීම

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 264 වෙනි වගන්තිය මගින් සැකකරුවන් රිමාන්ඩ් භාරයේ තැබීම සඳහා වනකාර්ය පටිපාටිය නියම කර ඇත.

115 වෙනි වගන්තිය, 159 වෙනි වගන්තිය, 239 වෙනිවගන්තිය හෝ 263 වෙනි වගන්තිය යටතේ නිකුත් කරනු ලබන, අත්අඩංගුවේ තැබීම, අධිකාරීවරයෙකුගේ භාරයට පැමිණ වීම හෝ රිමාන්ඩ් කිරීම සඳහා වන සෑම වරෙන්තුවක් ම ඒ සඳහා නියම කර ඇති ආකෘතියට අනුව සකස් කර, විනිසුරුවරයා විසින් අත්සන් කර තිබිය යුතු අතර,එය බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරියකු වෙත භාර දිය යුතු වේ.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙ හි සහ 1997 අංක 30 දරන ඇප පනතෙ හි විධිවිධාන ප්‍රකාරව ඇප ලබා දිය යුතු ය. ඇප දිය හැකි සහ ඇප දිය නොහැකි වැරදි මොනවා ද යන්න අපරාධ නඩු විධාන සංග්‍රහයේ උපලේඛනයක දක්වා ඇත. ඇප පනතේ 14 වෙනි වගන්තියේ දක්වා ඇති නිර්ණායක එකක් හෝ කිහිපයක් අදාළ වන්නේ නම් සැකකරු රිමාන්ඩ් භාරයේ තබන ලෙස අධිකරණයෙන් ඉල්ලීමක් කළ යුතු ය.

2.2.4.7 විදේශ රටවල සිටින සැකකරුවන් සොයා ගැනීම සහ අත්අඩංගුවට ගැනීම

ළමා වෙළෙඳාමක් සම්බන්ධ සැකකරුවෙක්/සැකකරුවන් විදේශගතව සිටින බව අනාවරණය වුවහොත් සහ ඔහු/ඇය/ඔවුන් සිටින ස්ථානය හඳුනාගැනීමට අවශ්‍ය වන්නේ නම්, ජාත්‍යන්තර පොලීසියට එහි ජාලය හරහා එවැනි හඳුනාගැනීම් සඳහා පහසුකම් සලසා දිය හැක.

පොලිස් චක්‍රලේඛ අංක CRTM 1478(2019 ඔක්තෝබර් 24 දිනැති අංක RTM 890 දරන)අනුව, ඕනෑම පොලිස් ස්ථානයකට හෝ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයකට ස්වකීය කොට්ඨාශයේ ජොෂ්ඨ පොලිස් අධිකාරී (එස්.එස්.පී.) හරහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් ඔවුන්ගේ විමර්ශන සඳහා සහාය ඉල්ලා සිටිය හැකි අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තර පොලීසියේ (ඉන්ටර්පොල්) කොළඹ කාර්යාලයෙන් උපදෙස් ලබා ගත යුතු ය. මෙම චක්‍රලේඛයට අනුව, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සහ/හෝ බලධාරීන්ට පහත සඳහන් අවස්ථාවල දී සහාය ඉල්ලා සිටිය හැක;

1. ‘අවශ්‍ය පුද්ගලයකු’ පිළිබඳ තොරතුරු රැස් කිරීමට/සොයා ගැනීමට.
2. එවැනි ‘අවශ්‍ය පුද්ගලයකු’ අත්අඩංගුවට ගැනීමට, රඳවා තබා ගැනීමට හෝ සංචරණය කිරීම් සීමා කිරීමට.
3. විමර්ශනවලට අදාළව යම් පුද්ගලයකු සිටින හෝ යම් දෙයක් තිබෙන ස්ථානය සොයා ගැනීමට.
4. පුද්ගලයකු සම්බන්ධ අපරාධ පරීක්ෂණයක් හෝ අපරාධ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු බෙදා ගැනීමට/සපයා දීමට හෝ තොරතුරු ලබා ගැනීමට.
5. යම් පුද්ගලයකු හෝ සිදුවීමක් හෝ යම් දෙයක් පිළිබඳව හෝ අපරාධ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ කිසියම් සැලැස්මක්/උපායයක්/උපක්‍රමයක් පිළිබඳව දැනුම් දීමට හෝ අනතුරු ඇඟවීමක් නිකුත් කිරීමට
6. නාඳුනන මළ සිරුරක් හෝ ජීවතුන් අතර සිටින පුද්ගලයකු හඳුනාගැනීමට / සොයා ගැනීමට
7. අධිකරණ වෛද්‍ය විශ්ලේෂණයක් සිදු කිරීම
8. ආරක්ෂාව සම්බන්ධ සෝදිසි කිරීම් සිදු කිරීමට
9. අපරාධ ජාල, ප්‍රවණතා සහ තර්ජන හඳුනා ගැනීමට
10. අතුරුදහන් වූ සහ සූරාකෑමට ලක්වූ ළමයින් පිළිබඳ මධ්‍යස්ථානය සහ ජාත්‍යන්තර ළමා ලිංගික සූරාකෑම (දත්ත සංචිතය) වෙතින් සහාය ලබා ගැනීමට

ජාත්‍යන්තර පොලීසිය විසින් පහත සඳහන් නිවේදන නිකුත් කරනු ලැබිය හැකි අතර,එමගින් ලොව පුරා රටවලට අනතුරු ඇඟවීම් සහ තොරතුරු ඉල්ලා සිටීම් බෙදා ගැනීමට හැකි වෙයි. මේවා සහයෝගීතාව සඳහා වන ජාත්‍යන්තර ඉල්ලීම් හෝ සාමාජික රටවල පොලීසියට අපරාධ සම්බන්ධ ඉතා වැදගත් තොරතුරු බෙදා ගැනීමට ඉඩ සලසන නිවේදන වේ. මෙම නිවේදන නිකුත් කිරීමේ විවිධ අරමුණු අනුව ඒවා වර්ණ පදනම් කර ගෙන කේතගත කර ඇත:

| | |
|---|---|
| රතු නිවේදනය | නඩු පැවරීම හෝ දඬුවම් දීම සඳහා අවශ්‍ය පුද්ගලයින් සිටින ස්ථානය සොයා ගැනීම සහ අත්අඩංගුවට ගැනීම සඳහා. |
| නිල් නිවේදනය | අපරාධ විමර්ශනයකට අදාළව පුද්ගලයකුගේ අනන්‍යතාවය, සිටින ස්ථානය හෝ ක්‍රියාකාරකම් පිළිබඳ අමතර තොරතුරු රැස් කර ගැනීම සඳහා. |
| කොළ නිවේදනය | යම් පුද්ගලයෙක් මහජන ආරක්ෂාවට තර්ජනයක් විය හැකි යැයි සලකනු ලබන අවස්ථාවක එම පුද්ගලයාගේ අපරාධ ක්‍රියාකාරකම් පිළිබඳ අනතුරු ඇඟවීම සඳහා. |
| කහ නිවේදනය | අතුරුදහන් වූවන්, බොහෝ විට බාලවයස්කරුවන්, සොයා ගැනීමට හෝ තමන්ව හඳුනා ගැනීමට නොහැකි පුද්ගලයින් හඳුනා ගැනීමට උපකාර කිරීම සඳහා. |
| කළු නිවේදනය | හඳුනා නොගත් මළ සිරුරු පිළිබඳ තොරතුරු සොයා ගැනීම සඳහා. |
| තැඹිලි නිවේදනය | මහජන ආරක්ෂාවට බරපතල සහ ආසන්න තර්ජනයක් පිළිබඳ ඇඟවීම් සහිත සිදුවීමක්, පුද්ගලයෙකු, වස්තුවක් හෝ ක්‍රියාවලියක් පිළිබඳ අනතුරු ඇඟවීම සඳහා. |
| දම් නිවේදනය | අපරාධකරුවන් විසින් භාවිතා කරනු ලබන කාර්ය පටිපාටිය, වස්තූන්, උපාංග සහ සඟවා තැබීමේ උපක්‍රම පිළිබඳ තොරතුරු ලබා ගැනීම හෝ සැපයීම සඳහා. |

**අන්‍යෝන්‍ය නීති සහාය**

**සටහන: අන්‍යෝන්‍ය නීති සහාය සඳහා වන ඉල්ලීම් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා එම ඉල්ලීම් ඉදිරි පියවර සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කළ යුතු වේ. මෙම ඉල්ලීම් නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සම්බන්ධීකරණය කළයුතු වේ.

සැකකරුවන් හෝ වින්දිතයන් විදේශගතව සිටින්නේ නම් සහ ඔවුන් නැවත මෙරටට ගෙන්වා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතෙහි විධිවිධාන යටතේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කළයුතු වේ.

කෙසේ වෙතත්, අපරාධවල වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි විධිවිධාන ප්‍රකාරව, විදේශයක සිටින වින්දිතයකුගේ ප්‍රකාශයක් ලබාගැනීමට අවශ්‍ය වන්නේ නම්, එම ප්‍රකාශය අදාළ රටෙහි තානාපති කාර්යාලය හෝ කොන්සල් කාර්යාලය සමග සම්බන්ධීකරණය කරමින් වීඩියෝ තාක්ෂණය ඔස්සේ පටිගත කර ලබා ගතහැක.

2018 අංක 24 දරන පනත මගින් සංශෝධිත 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතෙහි 2(1) වගන්තිය මගින් නීති සහාය ඉල්ලා සිටිය හැකි රටවල්/සංවිධාන ලෙස පහත සඳහන් රටවල්/සංවිධාන නම් කර ඇත:

- දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ පාර්ශ්ව
- සයිබර් අපරාධ පිළිබඳ යුරෝපා කවුන්සිලයේ සම්මුතියේ පාර්ශව
- පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජික රටවල්
- සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහාය සඳහා ශ්‍රී ලංකාව සමග ගිවිසුමකට එළඹ ඇති රටවල්
- ශ්‍රී ලංකාව අන්‍යෝන්‍යතාවය පදනමෙන් සහාය ලබා දීම සහ ලබා ගැනීම ස්වෛරී ජාතීන්ගේ උපරිම යහපත උදෙසා වන්නේ යැයි අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, ශ්‍රී ලංකාව සමග කිසිදු ගිවිසුමකට එළැඹ නැති රටක්
- අවශ්‍ය කරන කොන්දේසි සහ නියමයන් මත සහ අන්‍යෝන්‍යත්වය සහතික කිරීම මත, දූෂණයට, මුදල් විශුද්ධිකරණයට හෝ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහිව සටන් කරන අන්තර්-රාජ්‍ය සංවිධානයක්.

මෙම පනතෙහි 3 වෙනි වගන්තියෙ හි පනතෙ හි පරමාර්ථය දක්වා ඇති අතර, එයට පහත සඳහන් ඒවා ඇතුළුව, සාපරාධී සහ ඒ ආශ්‍රිත කාරණා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විසින් සහාය ලබා දීම සහ ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම ඇතුළත් වේ.

(අ) සාක්ෂිකරුවන් හෝ සැකකරුවන්ගේ සිටින ස්ථාන සහ එම පුද්ගලයින් හඳුනාගැනීම;
(ආ) ලියවිලි භාරදීම;
(ඇ) සාක්ෂිකරුවන් හෝ සැක කටයුතු පුද්ගලයන් පිළිබඳ පරීක්ෂණය කිරීම සහ ඔවුන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම;
(ඈ) සාක්ෂි, ලේඛන සහ වෙනත් ලිපි හෝ තොරතුරු සැපයීම සහ ලබා ගැනීම;
(ඉ) සෝදිසි කිරීම සහ අල්ලා ගැනීම සඳහා වන ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම;
(ඊ) අත්අඩංගුවේ පසුවන පුද්ගලයකුට සාක්ෂිකරුවකු ලෙස පෙනී සිටීමට හැකිවනු පිණිස තාවකාලිකව මාරු කිරීම ක්‍රියාත්මක කිරීම;
(උ) සාක්ෂිකරුවන්ට පෞද්ගලිකව පෙනී සිටීම සඳහා පහසුකම් සැලසීම;
(ඌ) ප්‍රකාශන හිමිකම් කඩ කිරීම ඇතුළුව බුද්ධිමය දේපළ අයිතීන් සාපරාධීව උල්ලංඝනය කිරීම් පිළිබඳ තොරතුරු සැපයීම;
(එ) කිසියම් අපරාධ ක්‍රියාවකට සම්බන්ධ පරිගණක පද්ධතියක් හෝ වෙනත් දේපළක් තිබෙන ස්ථානයට අදාළ තොරතුරු සැපයීම;
(ඒ) දඩ මුදල් ගෙවීම සඳහා වන කිසියම් නියෝගයක් බලාත්මක කිරීම;
(ඔ) අදාළ නීතිවලට අනුකූලව දේපළ රාජසන්තක කිරීම හෝ අත්හිටුවීම;
(ඕ) ඕනෑම ඩිජිටල් මුදල් ඒකකයක් වෙළෙඳාම් කිරීම ද ඇතුළුව,අන්තර්ජාලය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ක්ලවුඩ් තාක්ෂණය, බ්ලොක් චේන් තාක්ෂණය සහ අනෙකුත් පරිගණක ජාල හරහා සිදු කරනු ලබන අපරාධ සොයා ගැනීම;
(ක) කිසියම් විදේශීය රාජ්‍ය නිලධාරියකුගෙන් හෝ ජාත්‍යන්තර රාජ්‍ය සංවිධානයක නිලධාරියකුගෙන් හෝ ඔවුන්ගේ අදාළපෙරකලාසිකරුවන්ගෙන් හෝ ප්‍රතිලාභීන්ගෙන් අල්ලස් ගැනීම් සොයා ගැනීම;
(ග) ගබඩා කර ඇති පරිගණක දත්ත කඩිනම් සංරක්ෂණය කිරීම සහ සංරක්ෂිත සකස් කළ දත්ත කඩිනම් හෙළිදරව් කිරීම සහ දත්ත රඳවා තබා ගැනීම;
(ච) සාපරාධී ක්‍රියාවක් මගින් උපයාගත් ආදායම් තිබෙන ස්ථාන සොයා ගැනීම;
(ජ) නිශ්චිත අවසරයක් මත නිශ්චිත රටක දී හෝ නිශ්චිත සංවිධානයක දී ලබාගත් ලේඛනමය සාක්ෂි භාවිතය අධිකරණ ක්‍රියාවලියකදී පිළිගත හැකි කිරීම; සහ
(ට) වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය හරහා නිශ්චිත රටක් හෝ නිශ්චිත සංවිධානයක් මගින් මෙහෙයවනු ලබන සාක්ෂි පිළිගත හැකි බව සහ අදාළ කරගත හැකි බව.

**පුද්ගලයන් සිය රටට භාරදීම**

පුද්ගලයන් සිය රටට භාරදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නීතිය වන්නේ 1977 අංක 08 දරන උද්ර්පන නීතියයි. 2022.07.22 දිනැති අංක 2289/43 දරන *ගැසට්* නිවේදනය අනුව ශ්‍රී ලංකාවේ උද්ර්පනය කිරීම සම්බන්ධ බලය පැවරී ඇති අධිකාරිය වන්නේ ආරක්ෂක අමාත්‍යාංශයයි. ඒ අනුව උද්ර්පනය කිරීමේ ඉල්ලීම් අදාළ රාජ්‍ය තාන්ත්‍රික මාර්ග හරහා ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කළයුතු ය.

**2.3 තුන් වෙනි අදියර - විභාග කිරීම**

2.3.1 චෝදනා ගොනු කිරීම - නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීම

පුද්ගලයින් වෙළෙඳාම් කිරීමක් විය හැකි සිද්ධියක් සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමේ විධිමත් කාර්ය පටිපාටිය වන්නේ පොලීසියේ නීති අංශයේ අධ්‍යක්ෂවරයා විසින් නීතිපතිවරයාට ලිඛිතව දැනුම් දී උපදෙස් ඉල්ලා සිටීමයි.

නීතිපති දෙපාර්තමේන්තුවට තොරතුරු පොතේ (IB) උධෘත ලැබුණු පසු, නීතිපති දෙපාර්තමේන්තුවේ අදාළ ගොනුව භාර නිලධාරියා විමර්ශන නිලධාරීන් සමග සාකච්ඡා කිරීම අවශ්‍ය යැයි සිතන්නේ නම්, එම විමර්ශන නිලධාරීන්ව උපදේශන සාකච්ඡාවක් සඳහා කැඳවනු ලැබිය හැක.

**සටහන: අපරාධ නඩු විධාන සංග්‍රහයේ 393 වෙනි වගන්තිය - නීතිපතිවරයාට ඕනෑම විමර්ශනයක් සඳහා නියෝග/උපදෙස් ලබා දිය හැක.

සංවිධානාත්මක අපරාධයක ලක්ෂණ තිබෙන්නේ යැයි සැක කරන හෝ සංකීර්ණ ස්වභාවයක් ගන්නා සිද්ධීන්හි දී,අවශ්‍ය නීති උපදෙස් ලබා ගැනීම සඳහා ළමා හා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ මිනිස් වෙළෙඳාම් මැඩපැවැත්වීමේ ඒකකය භාර සහකාර පොලිස් අධිකාරී විසින් නීතිපති දෙපාතර්මේන්තුව අමතා,මිනිස් ජාවාරමක්/ළමා වෙළෙඳාමක් විය හැකි සිද්ධිය පිළිබඳ විශේෂ කරුණු සාකච්ඡා කළ හැක.

**නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය**

- එක් එක් සිද්ධියට අදාළ කරුණු සහ තත්ත්වයන් අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙහි උපදෙස් ලබාදිය හැක:
  1. විමර්ශනය කළ යුතුව තිබෙන සිද්ධියේ මිනිස් වෙළෙඳාම ට අදාළ ලක්ෂණ / අදාළ නීති විධිවිධාන
  2. සිදු කර ඇති වෙනත් අපරාධ
  3. විශේෂඥ වාර්තා ඉල්ලා සිටීම: සී.සී.ටී.වී. දර්ශන/ SOCO / අධිකරණ වෛද්‍ය නිලධාරි වාර්තාව/ඩී.එන්.ඒ. වාර්තාව/කටහඬ හඳුනාගැනීමේ පරීක්ෂණය යනාදිය
  4. සිදුකර ඇති අපරාධ අනුව රැස් කළ යුතු වන සාක්ෂි වර්ග
  5. දුරකථන වාර්තා ලබා ගැනීම (අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අධිකරණ නියෝගයක් නොමැතිව ලබා ගත හැක)
  6. අවශ්‍ය නම් වින්දිතයාගෙන් / සාක්ෂිකරුවන්ගෙන් අමතර ප්‍රකාශ ලබාගැනීම
  7. පවතින ද්‍රව්‍ය සමාලෝචනය කිරීමෙන් පසු, අවශ්‍ය නම් වැඩිදුර පරීක්ෂණ සිදුකරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් පොලීසියට උපදෙස් දෙනු ලැබේ.

- මිනිස් වෙළෙඳාම් චෝදනාවක් තහවුරු කිරීමට පවතින සාක්ෂි ප්‍රමාණවත් වන්නේ නම්, නීතිපති දෙපාර්තමේන්තුව විසින් අදාළ මහාධිකරණය වෙත අධිචෝදනා පත්‍රය ඉදිරිපත් කරනු ලැබේ.

- අවසන් කරන ලද විමර්ශනයක ඇති කරුණු කිසියම් පුද්ගලයෙකුට එරෙහිව මිනිස් වෙළෙඳාම් කිරීම සම්බන්ධයෙන් චෝදනා කිරීමට තරම් ප්‍රමාණවත් නොවන්නේ නම්, සහ ඒ සම්බන්ධ කිසියම් වරදක් සම්බන්ධයෙන් යම් පුද්ගලයෙකුට චෝදනා කිරීමට තරම් ප්‍රමාණවත් නොවන්නේ නම්, නීතිපති දෙපාර්තමේන්තුව විසින් අදාළ පුද්ගලයන් නිදහස් කිරීම සඳහා අවශ්‍ය ලියවිලි අදාළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**විමර්ශන නිලධාරියාගේ කාර්යභාරය**

- සිද්ධියට අදාළ කරුණු පිළිබඳ සම්පූර්ණ ගොනුව නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

- වින්දිතයා ආතතියට පත්ව සිටින්නේද, නැතහොත් කිසියම් මානසික සෞඛ්‍ය ගැටලුවක් තිබෙන බව පෙන්නුම් කරන්නේද, තර්ජනයට ලක්ව සිටින්නේද, එසේත් නැතහොත් කිසියම් සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධයක් තිබෙන්නේද යනාදී තත්ත්වයන් වැනි නඩු විභාගය පැවැත්වෙන කාලය දක්වා සහ ඉන් පසුව වින්දිතයා පිළිබඳ යම් විශේෂ සැලකිල්ලක් සහ අවධානයක් යොමුකිරීම අවශ්‍ය කරන තත්ත්වයන් තිබේද යන්න පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම.

- කිසියම් වින්දිතයෙකුට හෝ සිද්ධියේ සාක්ෂිකරුවෙකුට එරෙහිව සැකකරු/සැකකරුවන් ගෙන් තර්ජන හෝ බියගැන්වීම් සිදුකරන්නේ නම්, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හට සහාය දැක්වීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි විධිවිධාන ප්‍රකාරව ඒ පිළිබඳව වෙනම ම වාර්තා කළ යුතු ය.

** නඩුව විභාග කිරීමේ ක්‍රියාවලිය අතරතුරදී පොලීසිය විසින් තවත් සැකකරුවන් හඳුනාගනු ලැබුවහොත්, අවශ්‍ය අවස්ථාවලදී එම සැකකරුවන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ඩී.එන්.ඒ. වාර්තා ලබා ගැනීම පිණිස ඔවුන් රජයේ රස පරීක්ෂකවරයා වෙත යොමු කළ යුතු ය.

**2.3.2 අධිචෝදනා ගොනු කිරීම**

පුද්ගලයින් වෙළෙඳාම් කිරීම සහ ළමයින් වෙළෙඳාම් කිරීම යන අපරාධ අධිචෝදනා ලැබිය හැකි වැරදි වන අතර, ඒ සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් මහාධිකරණයේ නඩු පවරනු ලැබේ.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 162 වෙනි වගන්තියට අනුව මහාධිකරණයට ඉදිරිපත් කරනු ලබන සෑම අධිචෝදනාවකම පහත සඳහන් කරුණු අඩංගු විය යුතු ය:

1. පැමිණිල්ල මගින් කැඳවීමට අදහස් කරන සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක්.
2. නඩු විභාගයේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන ලේඛන සහ ද්‍රව්‍ය ලැයිස්තුවක් (නඩු භාණ්ඩ).
3. මූලික පරීක්ෂණයක් පැවති අවස්ථාවක, එම පරීක්ෂණයේ වාර්තාවෙහි සහ ලේඛනවල ද, මරණ පරීක්ෂණයක් පැවැත්වූයේ නම්, එම මරණ පරීක්ෂණයේ වාර්තාවෙහි ද සහතික කළ පිටපත්;
4. මූලික පරීක්ෂණයක් නොතිබූ විට, පැමිණිලිකරු සහ අධිචෝදනා පත්‍රයේ ලැයිස්තුගත කර ඇති සාක්ෂිකරුවන් විසින් පොලීසියට ලබාදෙන ලද ප්‍රකාශවල පිටපත්;
5. අධිචෝදනා පත්‍රයේ ලැයිස්තුගත කර ඇති සියලුම වාර්තාවල සහ සටහන් වල පිටපත්;
6. සිද්ධිය පිළිබඳ විමර්ශන සිදුකිරීමේදී හඳුනාගැනීමේ පෙරට්ටුවක් පැවතියේ නම් එහි සටහන්වල පිටපත්;
7. චූදිතයා සහ අධිචෝදනා පත්‍රයේ ලැයිස්තුගත කර ඇති යම් සාක්ෂිකරුවෙකු විසින් අපරාධ නඩුවිධාන සංග්‍රහයෙහි 127 වෙනි වගන්තිය ප්‍රකාරව මහේස්ත්‍රාත්වරයා වෙත ලබා දෙන ලද කිසියම් ප්‍රකාශයක් තිබේ නම් එහි පිටපතක්:

නඩු පැවරීම සඳහා අවශ්‍යව සිටින,අධිචෝදනා ලැබ ඇති සැකකරුවෙකු සිටින ස්ථානය සොයා ගැනීම සහ අත්අඩංගුවට ගැනීම පිණිසරතු නිවේදනයක් මගින් විවෘත වරෙන්තුවක් නිකුත් කළහැක.

**2.3.3 පුද්ගලික නීති නියෝජනය / නීති ආධාර**

2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනතේ 5(ඇ) සහ 5(ඈ) වගන්ති ප්‍රකාරව,නීති ආධාර නොලැබුණ හොත් සැලකිය යුතු අසාධාරණයක් සිදුවන්නේ නම්, ළමයෙකුට බලපාන අපරාධ නඩු කටයුතුවලදී රජයේ වියදමින් නීති සහාය ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ සෑම ළමයෙකුටම අයිතිය ඇත.

වෙළෙඳාම්වල වින්දිතයන් වූ ළමයින්ට අධිකරණ ක්‍රියාවලිය පුරාම ඔවුන්ගේ අවශ්‍යතා සහ අයිතිවාසිකම් ආරක්ෂා වන බව සහතික කිරීම සඳහා නීති උපදෙස් සහ නීති ආධාර ලබා ගත හැක. 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ පනතේ 5(ඇ) වගන්තිය මගින් වින්දිතයින්ට අවශ්‍ය නම් රජයෙන් නීති ආධාර ලබා ගැනීමේ අයිතිය තවදුරටත් පිළිගෙන ඇත. එමෙන්ම, වින්දිතයන්ට විශේෂිත සහාය සපයන ජාත්‍යන්තර සහ රාජ්‍ය නොවන සංවිධාන හරහා ද නීති ආධාර ලබාගත හැක.

එවැනි පුද්ගලික නීති නියෝජනයක් තිබීම වින්දිත ළමයින්ට හෝ ඔවුන්ගේ පවුල්වලට කිසියම් තර්ජන හෝ වෙනත් ආරක්ෂක අවශ්‍යතා තිබේ නම් ඒ පිළිබඳව දැනුම් දීමට ද විමර්ශකයින්ට සහ නඩු පවරන්නන්ට උපකාරී විය හැක.

චූදියාට ද නීති නියෝජනය ලබා ගැනීම සඳහා අයිතියක් ඇති අතර, චූදිතයාට ඒ සඳහා මුදල් ගෙවීමට නොහැකි නම් නීති ආධාර කොමිෂන් සභාව හරහා රජයෙන් නීති සේවා ලබා ගත හැක.

**2.3.4 විභාග කිරීමේ ක්‍රියාවලිය**

**වින්දිතයා සූදානම් කිරීම**

වින්දිත ළමයා නඩු විභාගය සඳහා හොඳින් සූදානම්ව සිටීම වැදගත් වේ. උපදේශකවරුන්, පරිවාස නිලධාරින් සහ ළමා ආරක්ෂක නිලධාරින්ගේ සහාය ඇතිව සමස්ත ක්‍රියාවලිය පුරා ම වින්දිත ළමයාට සහාය විය හැක.

ළමයින් වෙළෙඳාම් කිරීමේ සිද්ධියකට අදාළ යුක්තිය පසිඳලීමේ සමස්ත ක්‍රියාවලිය මගින් ම, ළමයාට ලබාදෙනු ලබන ප්‍රතිචාරය සහ ආරක්ෂාව වින්දිත-කේන්ද්‍රීය වූවක් සහ ළමයාගේ උපරිම යහපත සලසන්නක් බව සහතික කිරීම වැදගත් වේ. පොලීසිය සහ සිද්ධිය පිළිබඳ විමර්ශනයට සහ නඩු පැවරීමට සම්බන්ධ වන අනෙකුත් සියලුම නිලධාරින් විමර්ශනය සහ අධිකරණ ක්‍රියාවලිය මගින් වින්දිත ළමයාව නැවත කම්පනයට සහ නැවත වින්දිත භාවයටපත් නොවන බවටත්, ළමයාට අමතර හානියක් සිදු නොවන බවටත් වගබලා ගැනීමට විශේෂ උත්සාහයක් දැරිය යුතු ය.

**අනුගමනය කළ යුතු පියවර:**

වින්දිතයින්ව ඔවුන්ගේ නීතිමය තත්ත්වය පිළිබඳව දැනුවත් කරන්න:

- හඳුනාගන්නා ලද වින්දිතයින්ට වින්දිතයෙක් ලෙස ඔවුන්ගේ නීතිමය තත්ත්වය පිළිබඳව සහ ඔවුන්ට ලබා ගත හැකි සේවාවන් පිළිබඳව තොරතුරු සපයා දීම.
- නීතිමය තත්ත්වය අනුව, විදේශික වින්දිතයන්ට හෝ සාක්ෂිකරුවන්ට (ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ වීසා තත්ත්වය නොසලකා) රඳවා තබා ගැනීමෙන් හෝ පිටුවහල් කිරීමෙන් තොරව මෙරට රැඳී සිටීමට අවසර තිබෙන බව තහවුරු කරන්න.

වින්දිතයන්ව බිය ගැන්වීම් සහ තර්ජනවලින් ආරක්ෂා කරන්න (අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සහයෝගය දක්වමින් කටයුතු කරන වෙළඳාමේ වින්දිතයින් පළිගැනීම් සහ බිය ගැන්වීම්වලට ලක්වීමේඉහළ අවදානමක් තිබිය හැක):

- පොලීසිය සහඅපරාධවල වින්දිතයන් සහ සාක්ෂිකරුවන් පිළිබඳ ජාතික අධිකාරිය වින්දිතයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම ඇතුළුව ඔවුන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධයෙන් ඇති අවදානම් හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීමට කටයුතු කළ යුතු ය. වින්දිතයන්/සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේදී පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීම ප්‍රධාන අවශ්‍යතාවයක් වනවා පමණක් නොව, පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීම වින්දිතයා තුළආරක්ෂාව සහ විශ්වාසය පිළිබඳ හැඟීම් ද ගොඩනගයි.

**අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී වින්දිතයින්ගේ ආරක්ෂිත සහ අර්ථාන්විත සහභාගීත්වයට පහසුකම් සලසන්න**
(සාක්ෂි දීමේදී මාධ්‍ය විසින් තමන්ව හඳුනාගනු ඇතැයි යන අවදානම හෝ ප්‍රසිද්ධ උසාවියක නැගී සිට තමන්ව වෙළෙඳාම් කළ/සූරාකෑමට ලක්කළ අය ඉදිරියේ තමන්ගේ කම්පන සහගත පෞද්ගලික අත්දැකීම් පිළිබඳව කතා කිරීමට සිදුවන්නේ යැයි වෙළෙඳාම් වල වින්දිතයන්ට හැඟී යන්නේ නම් බොහෝ විට ඔවුන් සාක්ෂි දීම සඳහා ඉදිරිපත්වීමට පසුබට වෙති):

- පොලීසිය සහ අනෙකුත් අධිකරණ නිලධාරින් වෙළෙඳාම්වල වින්දිතයින්ට ඔවුන්ගේ වයසට යෝග්‍ය වන පරිදි,ආරක්ෂිතව සහ අර්ථාන්විතව නීති කටයුතුවලට සහභාගී වීම සඳහා සහාය වීමේ ක්‍රම සොයා ගත යුතු වේ. ඔවුන් සමග සිදුකරනු ලබන සියලු ම අන්තර්ක්‍රියා වලදී සහ ගනු ලබන ක්‍රියාමාර්ග වලදී ඔවුන්ගේ දුක්ඛිත අත්දැකීම් හඳුනා ගැනීම සහ ඒවාට සංවේදී වීම මෙයට ඇතුළත් වේ.
- ළමයින්ගේ වයසට සහ ඔවුන්ගේ සංවර්ධන අවධියට සුදුසු වන භාෂාවකින් සහ සුදුසු ආකාරයකින්/ක්‍රමයකින් ඔවුන්ගේ අයිතිවාසිකම්, ආරක්ෂණ ක්‍රියාවලීන් සහ නීතිමය ක්‍රියාදාමයන් පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතු වේ.

- සාක්ෂිකරුවෙක් වීම ළමයාගේ උපරිම යහපතට හේතු වන්නේ යැයි තීරණය කරන්නේ නම්, වින්දිත ළමයින්ට නීති ක්‍රියාවලියේදී ඔවුන්ගේ උපරිම යහපත ආරක්ෂා කර ගැනීම සඳහා සහාය වීම පිණිස පුද්ගලයෙකු සපයා දිය යුතු අතර,හැකි අවස්ථාවල දී ළමයා සෘජු සාක්ෂි ලබා දීම සහ අධිකරණ ශාලාවේදී සම්මුඛ සාකච්ඡාවට භාජනය කිරීම වෙනුවට විකල්ප ක්‍රම සපයා දීම වැනි ආකාර වලින් ළමයාට පවතින ආරක්ෂාවන් සපයා දෙනු ලබන බව සහතික කළ යුතු වේ.

- වින්දිතයාට අවශ්‍ය සහාය සහ සහයෝගය ලැබෙන බව සහතික කිරීම සඳහා ආරක්ෂක සේවා සපයා දෙන රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඉල්ලා සිටිය යුතු අතර එය සම්බන්ධීකරණය කළ යුතු වේ.

**පෞද්ගලික ලෙස නඩු විභාග පැවැත්වීම**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වගන්තියෙන් ලිංගික ක්‍රියාආශ්‍රිත අපරාධ චෝදනා සම්බන්ධ වන විට,පෞද්ගලික ලෙස අධිකරණ ක්‍රියාදාමයන් සිදු කිරීම සඳහා විධිවිධාන සලසා ඇත.

එමෙන්ම, ළමයෙකුගෙන් සාක්ෂි ලබා ගැනීමේදී අධිකරණයේ නිලධාරින් හෝ නඩුවේ පාර්ශ්වයන්, ඔවුන්ගේ නීතිඥයින් හෝ නඩුවට සෘජුවම අදාළ පුද්ගලයින් නොවන සියලු ම පුද්ගලයින් හෝ කවර හෝ පුද්ගලයෙක් අධිකරණ ශාලාවෙන් බැහැර කරන ලෙස නියෝග කිරීමට ළමයින් සහ තරුණ තැනැත්තන් ආඥාපනතෙහි 19(1) වෙනි වගන්තිය මගින් අධිකරණයට අවසර ලබා දෙයි.

තවද, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ පනතෙහි 19(1)(ආ) වෙනි වගන්තිය මගින් වින්දිතයාට සම්පූර්ණ අධිකරණ ක්‍රියාවලිය හෝ ඉන් කොටසක් හෝ පෞද්ගලිකව සිදුකරන ලෙස ඉල්ලා සිටීමට අවසර ලබා දෙන විධිවිධාන සලසා ඇත. සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක තුළින් සාක්ෂි දීම සම්බන්ධ පනතේ X කොටසේ 82, 83 සහ 87 වගන්තිවල අපාරධවලට ගොදුරු වූ ඕනෑම වින්දිතයෙකු, සාක්ෂිකරුවෙකු හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියක් විසින් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධයක් මගින් ලබා දිය යුතු සාක්ෂි සඳහා විධිවිධාන ඇතුළත් වේ.

**වින්දිත ළමයින්ගේ ආරක්ෂාව**

නඩු විභාග කිරීමේ අදියරේදී වින්දිතයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් පොලිස් විමර්ශන නිලධාරින් වැදගත් කාර්යභාරයක් ඉටු කරති. නඩු විභාගයට පෙර සහ නඩු විභාගය පැවැත්වෙන අවස්ථා වලදී මතු විය හැකි, චූදිතයා/චූදිතයන් විසින් වින්දිතයාට තර්ජනය කිරීම හෝ වෙනත් බිය ගැන්වීම් වැනි විශේෂ කරුණු කිසිවක් තිබේ නම්, පොලිස් නිලධාරීන්ට එවැනි කරුණු පිළිබඳව අභිචෝදකට දැනුම් දිය හැක. වින්දිතයාට හෝ සාක්ෂිකරුට අපරාධවල වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය ලබාදීම සඳහා වූ ජාතික අධිකාරිය වෙත සෘජුවම පැමිණිලි කළ හැක.

2023 අංක 10 දරන අපරාධ වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ II වන කොටස සහ IV කොටස යටතේ විධිවිධාන පහත ලැයිස්තුගත කර ඇති පරිදි අපරාධවලට ගොදුරු වූවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම නියම කරයි. 34 (6) වගන්තිය යටතේ 'අපරාධයේ අවදානමට ලක්විය හැකි වින්දිතයෙකු' අතර වයස අවුරුදු 18 ට අඩු අපරාධයකට ගොදුරු වූවෙකු හෝ සාක්ෂිකරුවෙකු මෙන්ම දණ්ඩ නීති සංග්‍රහයේ 360 වගන්තිය යටතේ වෙළෙඳාමට ගොදුරු වූ පුද්ගලයෙකු ඇතුළත් වේ.

දෙවන කොටස

| | | |
|---|---|---|
| 3 වන වගන්තිය | - | සාධාරණ සැලකීමක් සඳහා අපරාධ වින්දිතයෙකුට ඇති අයිතිවාසිකම් |
| 4 -6 වගන්තිය | - | අපරාධයක වින්දිතයෙකුට ලබා ගත හැකි සහාය, ආරක්ෂාව සහ ප්‍රතිකර්ම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය |
| 7 වන වගන්තිය | - | මූල්‍ය සහයක් ලබාගැනීමට අපරාධයක වින්දිතයෙකුට ඇති හිමිකම් |
| 8 වන වගන්තිය | - | වින්දිත බලපෑම් ප්‍රකාශය |

සිව්වෙනි කොටස

| | | |
|---|---|---|
| 27-29 වගන්තිය | - | අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව ලබා ගැනීමට ඇති අයිතිය |
| 34 වන වගන්තිය | - | අවදානමකට ලක්විය හැකි අපරාධයක වින්දිතයන් හෝ සාක්ෂිකරුවන් සඳහා වන විශේෂ ක්‍රියාමාර්ග |
| 35 වන වගන්තිය | - | ආරක්ෂණ නිලධාරියෙකු විසින් අඛණ්ඩව අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීම |
| 59 වන වගන්තිය | - | අපාරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු සම්බන්ධයෙන් විශේෂිත වැඩසටහනක් යොදා ගැනීම |

2023 අංක 10 දරන අපරාධවල වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ තෙවන කොටසෙහි දක්වා ඇති විධිවිධාන මගින් වින්දිතයින්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුකරන ලද වැරදි සම්බන්ධයෙන් එම පනත යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා කර නඩු පැවරිය හැකි වැරදි මොනවාද යන්න දක්වා ඇත.

තෙවන කොටස

| | | |
|---|---|---|
| 14 වන වගන්තිය | - | අපරාධයක වින්දිතයෙකු හෝ සාක්ෂිකරුවෙකු බිය ගැන්වීම |
| 15 වන වගන්තිය | - | අපරාධයක වින්දිතයෙකුට හෝ සාක්ෂිකරුවෙකුට තුවාල සිදු කිරීම |
| 16 වගන්තිය | - | අපරාධයක වින්දිතයෙකු හෝ සාක්ෂිකරුවෙකු වැළැක්වීම |
| 17 වැනි වගන්තිය | - | අපරාධයක වින්දිතයෙකුට හෝ සාක්ෂිකරුවෙකුට යම් ස්ථානයක් හැර යාමට බල කිරීම හෝ පෙළඹවීම හෝ අපරාධයක වින්දිතයෙකුගේ හෝ සාක්ෂිකරුවෙකුගේ දේපළවලට අලාභ හෝ හානි සිදු කිරීම |
| 18 වන වගන්තිය | - | රැකියා ස්ථානයේ දී පුද්ගලයෙකුට හිරිහැර කිරීම |
| 19 වන වගන්තිය | - | නීති කටයුතු සිදුකිරීම වළක්වා ගැනීම සඳහා අල්ලසක් ලබා දීම |

**සටහන: මෙම පනතෙහි 14 - 23 වෙනි වගන්ති අධිකරණයකින් පමණක් ඇප දිය හැකි වැරදි වන අතර, 1997 අංක 30 දරන ඇප පනතෙහි අර්ථය තුළ පමණක් එම වැරදිවලට ඇප ලබා දිය හැක. එවැනි වැරදි සඳහා ඇප ලබා දෙන විට අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරුවෙකු හෝ ඇප නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් පුද්ගලයෙකු සමග සන්නිවේදනය කිරීම හෝ ඔවුන් සමීපයට පැමිණීම තහනම් කිරීම වැනි කොන්දේසි ඇප නියෝගයටඇතුළත් කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය ඇත.

** තවද, 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14(ඒ) වගන්තිය ප්‍රකාරව, අපරාධ විමර්ශන සහ නඩුකටයුතු වලට සම්බන්ධ ළමයින්ගේ සුරක්ෂිතතාවය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවකදීම සුදුසු පියවර ගැනීම සහතික කිරීම එම අධිකාරියේ ප්‍රධාන කාර්යයක් වේ. ළමයා ශ්‍රම සූරාකෑමට ලක් කිරීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම ඇති විට, ඒ සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ කරගත හැක.

**අතුරු සහන සහ වන්දි**

2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ පනත යටතේ අපරාධයක වින්දිතයෙකුට කිසියම් වන්දියක් හෝ අතුරු දීමනාවක් ගෙවීම සාධාරණ සහ සමානාත්මතාවයෙන් යුතු පදනමක් මත ගෙවිය යුතු බව එම පනතේ IX වෙනි කොටසෙහි සඳහන් වේ. එම පනතේ 61 වෙනි වගන්තිය අනුව, චූදිතයෙකු වරදකරු කිරීමේ දී, ඔහු වරදකරු කරනු ලබන වරද සම්බන්ධයෙන් ඔහුට පැනවිය හැකි ඕනෑම දණ්ඩන සම්බාධකයකට අමතරව, අධිකරණය විසින් නියම කරනු ලබන වන්දි මුදලක් අධිකරණයට ගෙවන ලෙස අධිකරණය විසින් වරදකරුට නියෝග කරනු ලැබිය හැක.

**2.3.5 ශ්‍රී ලංකාවේ සිට සහ ශ්‍රී ලංකාවට වින්දිත ළමයින් ආපසු යැවීම / ගෙන ඒම**

දෙමව්පියන් හෝ භාරකරුවන් සමග සිටින වින්දිත ළමයින්ව ඔවුන්ගෙන් වෙන් කිරීම එම ළමයින්ගේ උපරිම යහපත සඳහා වන්නේ නම් මිස එම ළමයා ඔවුන්ගෙන් වෙන් නොකළ යුතු ය. දෙමව්පියන් හෝ භාරකරුවෙකු නොමැති ළමයෙකු සිටින විට, විමර්ශන නිලධාරියා ළමයින් හා තරුණ තැනැත්තන් ආඥාපනත යටතේ එය අධිකරණයට යොමු කර එම ළමයා තාවකාලිකව ආරක්ෂිත නිවාසයක තැබීමට නියෝගයක් ලබා ගත යුතු ය.

වින්දිත ළමයා විදේශිකයෙකු නම්, සන්නද්ධ ගැටුම්වල ප්‍රචණ්ඩත්වය, වෙළෙඳාම් කරනු ලැබීම්, අපයෝජන, සූරාකෑම් ආදියෙන් ළමයාගේ ආරක්ෂාවට එල්ලවන අවදානම මෙන්ම ළමයාගේ පවුල තුළ ළමයාට ඇති ආරක්ෂාවෙහි මට්ටම ද සලකා බලා, ළමයා ආපසු යාම ආරක්ෂිතද යන්න තහවුරු කර ගැනීම සඳහා ළමයාගේ මව් රටෙහි හෝ පදිංචි රටෙහි තත්ත්වය පිළිබඳ තක්සේරුවක් සිදුකළ යුතු ය. මෙය අධිකරණ නියෝගයක් හරහා සිදුකළ යුතු ය.[14] ළමයා ඔහුගේ/ඇයගේ මව් රටට ආපසු යවන තුරු (සහ යවන්නේ නම්)ළමයාට (සහ අදාළ නම් ළමයාගේ පවුලට) ගරුත්වයෙන් යුතුව සැලකිය යුතු අතර, ළමයාට පෝෂණය, සෞඛ්‍යය, නවාතැන්, අධ්‍යාපනය සහ ආරක්ෂාව වැනි මූලික අවශ්‍යතා සපුරාගැනීම සඳහා සුදුසු පරිදි ප්‍රවේශය තිබිය යුතු ය.වින්දිතයන් ආපසු යැවීම / සිය රට වෙත යැවීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් සිදුකළ යුතු ය.

14 විමර්ශන නිලධාරියා මෙම සිද්ධිය අධිකරණයට යොමු කළ යුතු ය. අධිකරණ නියෝගය මත පදනම්ව, විමර්ශනය නිලධාරියා ළමයාගේ මව් රටෙන් ළමයාගේ පවුලේ තොරතුරු ලබා ගැනීම සඳහා සහ ළමයා ආපසු භාර දීම පිළිබඳ තීරණය කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ඇතුළු අදාළ කටයුතු සිදු කළ යුතු ය.

වින්දිත ළමයා විදේශගතව සිටින්නේ නම් සහ ළමයා සිටින ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීමට අවශ්‍ය නම් සහ/හෝ ළමයාගේ භාරකාරත්වය භාර ගැනීම සඳහා සහාය අවශ්‍ය වන්නේ නම්, ජාත්‍යන්තර පොලීසියේ සහාය ඉල්ලා සිටිය හැක.
වින්දිත ළමයාගේ අයිතිවාසිකම් ආරක්ෂා වන හොඳම පරිසරය තීරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දී ළමයාට ලබා දිය හැකි ආරක්ෂාවෙහි මට්ටම පිළිබඳව ද තක්සේරුවක් තිබිය යුතු ය.

### 2.3.6 වින්දිත ළමයින් නැවත වින්දිතභාවයට පත්වීම සහ තවදුරටත් හිංසනයට ලක්වීම වැළැක්වීම

වින්දිතයින්ට සහාය සේවා සපයන්නන් සමග සම්බන්ධීකරණය කිරීම සහ වින්දිතයන් ඔවුන් වෙත යොමු කිරීම
පොලීසිය වින්දිතයන්ව යොමු කිරීම සඳහා වින්දිතයන්ට සහාය සේවා සපයන ආයතන හඳුනා ගැනීම වැදගත් වන අතර, එක් එක් වින්දිතයාගේ හදිසි අවශ්‍යතා පිළිබඳ මූලික තක්සේරුවක් මත පදනම් යොමු කිරීම් සිදු කළ යුතු වේ. යොමු කිරීම් සිදු කළ හැකි ආයතනවලට රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවල එකතුවක් ඇතුළත් විය හැකි අතර, ඒවාට අවම වශයෙන් මාර්ගස්ථ නවාතැන් සහ වෛද්‍ය සේවා ඇතුළත් විය හැක.

**නවාතැන් සැපයීම**

පරිවාස නිලධාරියා සමග සාකච්ඡා කර, අවදානම් තක්සේරුවක් සිදු කර 'යෝග්‍ය පුද්ගලයෙකු භාරයට පත්කිරීමේ නියෝගයක්' ලබා ගන්නා තෙක් වෙළෙඳාමක වින්දිතයෙකු වූ ළමයෙකුට කෙටි කාලීන ආරක්ෂිත නවාතැනක් අවශ්‍ය විය හැක. පොලිස් විමර්ශන නිලධාරියා රජය හෝ රාජ්‍ය නොවන සංවිධාන විසින් පවත්වාගෙන යනු ලබන ආරක්ෂිත නිවාස වැනි ආරක්ෂිත ස්ථානයකට ළමයා යොමු කිරීමට තාවකාලික වැඩපිළිවෙළක් යෙදිය යුතු ය. එම පොලිස් නිලධාරියාට එවැනි ආරක්ෂිත නිවාස පවත්වාගෙන යන අමාත්‍යාංශ හෝ ආයතනවල දුරකථන අංක ද සහිත ලැයිස්තුවකට ප්‍රවේශය තිබීම වැදගත් වේ.

අධිකරණ ක්‍රියාවලිය පුරාවටම ප්‍රමාදයන් සිදුවිය හැකි බව සැලකිල්ලට ගැනීමේ දී, වෙළෙඳාමක වින්දිතයෙකු වූ ළමයෙකුට දිගුකාලීන නවාතැන් සැපයීමේ අවශ්‍යතාවක් මතුවිය හැක. මෙම අවස්ථා වලදී, ළමයාගේ උපරිම යහපත පිණිස ළමයා ඔහුගේ/ඇයගේ පවුලේ අය සමග තැබීමට සියලු උත්සාහයන් දැරිය යුතු අතර, ළමයා නැවත සිය පවුල සමග එක්වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ළමයාට අවදානමක් හෝ තවත් හානියක් සිදු වනු ඇතැයි අපේක්ෂා කරන්නේ නම් පමණක්, ළමයා දිගුකාලීන නවාතැන් ස්ථානයක තැබීමට සලකා බැලිය යුතු ය.

**මනෝ සමාජීය සහාය**

වෙළෙඳාම ක වින්දිතයෙකු වූ ළමයෙකු වෙළෙඳාම ට ගොදුරුවීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ තමන් අත්විඳි සූරාකෑමෙහි ප්‍රතිඵලයක් ලෙස දැඩි කම්පනයකට පත්වී සිටිය හැක. ළමයාගේ කම්පනය සහ පීඩාව අවම කිරීම සඳහා මනෝ උපදේශකයින් වැනි අදාළ පාර්ශ්වකරුවන්ගේ සේවාවන් හරහා මනෝ සමාජීය සහාය සහ මැදිහත්වීම සපයා දීම සඳහා පහසුකම් සැලසීමට පොලීසිය සියලු උත්සාහයන් දැරිය යුතු ය. නඩු විභාගයෙන් පසුව සහ වින්දිත ළමයා නැවත සමාජගත කිරීම සඳහා සැලසුම් කරනු ලබන ක්‍රියාවලියක් පුරාවටම මනෝ සමාජීය සහාය අඛණ්ඩව ලබා දිය යුතු ය.

**ප්‍රාදේශීයව ලබා ගත හැකි රාජ්‍ය සේවාවන්**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අවදානමට ලක්විය හැකි ළමුන්ගේ ආරක්ෂාව සහ සවිබල ගැන්වීම සඳහා විවිධ සහාය සේවාවන් සපයන අතර එමගින් ළමා වින්දිතයින්ට තවදුරටත් හානියක් හෝ නැවත පීඩාවට පත්වීම වළක්වා ගත හැකිය. ආරක්ෂාව අවශ්‍යය ළමුන් සඳහා යොමු කිරීම මගින් එවැනි සේවාවන් ඉල්ලා සිටිය හැකිය.

| *නිලධාරියාගේ තනතුර* | *ලබා ගත හැකි සේවාවන්* |
|---|---|
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි | සිද්ධි කළමනාකරණය තුළින් ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් හඳුනා ගැනීම, වැළැක්වීම සහ අවම කිරීම |
| ප්‍රාදේශීය ළමා ආරක්ෂණ නිලධාරි | ළමා ආරක්ෂන ගැටළු හඳුනා ගැනීම, වැළැක්වීම සහ අවම කිරීම, ළමුන්ට එරෙහි අපරාධ පිළිබඳ පරීක්ෂණ අධීක්ෂණය කිරීම සඳහා සහාය වීම |
| සමාජ සේවා නිලධාරී | ආබාධ සහිත අවදානමට ලක්විය හැකි දරුවන්, වීදි තත්වයක් තුළ සිටින ළමුන් සඳහා සහාය සහ සමාජ සුභසාධන සේවා සැපයීම |
| නිපුණතා සංවර්ධන නිලධාරි | නිපුණතා සංවර්ධනය හා පුහුණු සේවා |
| මුල් ළමාවිය සංවර්ධනය නිලධාරි | වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ ළමා සංවර්ධන ගැටළු හඳුනා ගැනීම, වැළැක්වීම සහ අවම කිරීම |
| වනිතා සංවර්ධන නිලධාරි | කාන්තාවන්ගේ ආරක්ෂාව සහ සුබසාධන ගැටළු හඳුනා ගැනීම, වැළැක්වීම සහ අවම කිරීම |

| | |
|---|---|
| විදේශ සේවා නියුක්ති අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරි | රැකියා වලට විදේශගත වූ දෙමව්පියන්ගේ දරුවන්ගේ ආරක්ෂාව සහ සුබසාධන ගැටළු හඳුනා ගැනීම, වැළැක්වීම සහ අවම කිරීම |
| උපදේශන නිලධාරි | ළමුන් සහ කාන්තාවන් සඳහා මූලික උපදේශන සේවා සැපයීම |
| තරුණ සේවා නිලධාරි | තරුණ තරුණියන් සවිබල ගැන්වීම සහ නිපුණතා සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් සැපයීම |
| අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ නිවාරණ අධ්‍යාපන හා පුහුණු නිලධාරි | පාසල්, තරුණ තරුණියන්, පවුල් සහ ප්‍රජාවන් ඉලක්ක කර ගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සම්පාදනය කිරීම. |

* මෙය සම්පූර්ණ ලැයිස්තුවක් නොවන අතර, ලබා ගත හැකි සේවාවන් ස්ථානය අනුව වෙනස් විය හැක.

3. ළමයින්ට එරෙහි සයිබර් අපරාධ

සයිබර් අපරාධ යනු පරිගණක ජාලයක් හෝ ජාලගත උපාංගයක් ඉලක්ක කර හෝ භාවිතා කර සිදුකරන අපරාධ ක්‍රියාකාරකම් වේ. බොහෝ සයිබර් අපරාධ සිදු කරනු ලබන්නේ මුදල් ඉපැයීමේ පරමාර්ථයෙනි.

එබැවින්, නීතිවිරෝධී මූල්‍ය ගනුදෙනු, හිරිහැර කිරීම්, මාර්ගගත ළමා ලිංගික අපයෝජන සිදු කිරීම්, ළමා ලිංගික අපයෝජන ද්‍රව්‍ය නිපදවීම හෝ පළ කිරීම, සයිබර් ත්‍රස්තවාදී ක්‍රියා, සොරකම් කිරීම හෝ පෞද්ගලික තොරතුරු හෙළිකිරීම ආදී ක්‍රියා සිදු කිරීම සඳහා ඊමේල්, චැට්, වෙබ් අඩවි, යෙදුම් වැනි අන්තර්ජාල මාධ්‍ය භාවිතා කරන ඕනෑම ක්‍රියාකාරකමක් සයිබර් අපරාධයක් ලෙස සැලකිය හැක.

සයිබර් අපරාධ ‘දේපල අපරාධ’ සහ ‘පුද්ගලයෙකුට එරෙහි අපරාධ’ ලෙස කාණ්ඩ දෙකකට වර්ග කළ හැක.

දේපළ අපරාධ - නීතිවිරෝධී ගනුදෙනු, අනන්‍යතාවය සොරකම් කිරීම, වංචා, රැවටිලි සහ ප්‍රකාශන හිමිකම් උල්ලංඝනය කිරීම් ආදිය දේපළ අපරාධ විය හැක

පුද්ගලයෙකුට එරෙහි අපරාධ -රහසින් ලුහුබැඳීම, අන්තර්ජාලය ඔස්සේ හිරිහැර කිරීම, ළමා ලිංගික අපයෝජන ද්‍රව්‍ය පළ කිරීම සහ පුද්ගලයෙකුගේ අනුමැතියකින් තොරව පෞද්ගලික පින්තූර හෝ වීඩියෝ බෙදාහැරීම පුද්ගලයෙකුට එරෙහි අපරාධ විය හැක.
තාක්ෂණයේ සීඝ්‍ර දියුණුව හා ඒ ආශ්‍රිත සයිබර් අපරාධවල ඉහළයාම සම්බන්ධ සංකීර්ණත්වයන් සැලකිල්ලට ගැනීමේ දී, එවැනි සයිබර් අපරාධ විසඳීමට සාම්ප්‍රදායික විමර්ශන පළපුරුද්ද පමණක් ප්‍රමාණවත් නොවේ. එවැනි අපරාධ ආමන්ත්‍රණය කිරීම සඳහා විමර්ශන පළපුරුද්ද සහ තාක්ෂණික විශේෂඥතාවය යන දෙකම සහිත ව්‍යුහගත ප්‍රවේශයක් අවශ්‍ය වේ. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින්ට සයිබර් අපරාධ විමර්ශනය කිරීම සඳහා හැඩගැසීමට සහ අභියෝගවලට මුහුණ දීමට හැකි වනු පිණිස, තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ සම්පත් සහ විශේෂඥතාවය ලබා දීම සහ ප්‍රධාන පාර්ශවකරුවන් සමග සහයෝගීතා හවුල්කාරිත්වයන් ගොඩනගා ගැනීම වැදගත් වේ. සයිබර් අපරාධ විමර්ශනවලදී ප්‍රමිතිගත කාර්ය පටිපාටියය අනුගමනය කිරීම මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පියවරක් වේ.

**3.1. ළමයින්ට එරෙහි සයිබර් අපරාධ වර්ග**

ළමයින් යනු අවදානමට ලක් වන කණ්ඩායමක් වන බැවින් ළමයින්ට එරෙහි සයිබර් අපරාධ පිළිබඳ විශේෂ සැලකිල්ලක් යොමු කළ යුතු වේ. අන්තර්ජාලය ඔස්සේ සිදුවන අපරාධවලට එරෙහිව ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා විශේෂ අවධානයක් අවශ්‍ය වේ.

සයිබර් ලිංගික සූරාකෑම, සයිබර් හිරිහැර කිරීම් සහ කප්පම් ගැනීම්, මාර්ග ගතව සම්බන්ධතා ගොඩනගා ගැනීම් සහ සක්‍රිය සයිබර්/ ඩිජිටල් මාර්ගයෙන් ළමයින්ව අන්තවාදී/ප්‍රචණ්ඩකාරී රැඩිකල්කරණයට ලක් කිරීම ළමයින්ට එරෙහිව සිදු කරනු ලබන ඇතැම් සයිබර් අපරාධ ලෙස හඳුනාගෙන ඇත. එමෙන්ම, ළමා ලිංගික අපයෝජන ද්‍රව්‍ය සහ ළමා ලිංගික සූරාකෑමේ ද්‍රව්‍ය නිපදවීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා ළමයින්ව සූරාකෑමේ අපරාධ ද සිදු වෙයි. ‘ළමා ලිංගික අපයෝජන ද්‍රව්‍ය සහ ළමා ලිංගික සූරාකෑමේ ද්‍රව්‍ය’ සඳහා ගෝලීය වශයෙන් පිළිගත් නිර්වචනයක් මේ වන තෙක් නැත. කෙසේ වෙතත්, ලිංගිකකරණයට ලක්වන හා සූරාකෑමේ ස්වරූපයෙන් ළමයින්ව නිරූපණය කරනු ලබන මාධ්‍ය මෙයින් අදහස් කෙරෙයි.

ළමයින්ට එරෙහි සයිබර් අපරාධ ආමන්ත්‍රණය කිරීම සඳහා රජයයන්, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්, තාක්ෂණ සමාගම්, අධ්‍යාපනඥයන් සහ දෙමව්පියන් එකට එක්වූ සාමූහික ප්‍රයත්නයක් අවශ්‍ය වේ. මෙහි අරමුණ වන්නේ ළමයින්ව සූරාකෑම්, හිරිහැර කිරීම් සහ වෙනත් ආකාරයේ හානිවලින් ආරක්ෂා කරන සුරක්ෂිත මාර්ගගත සහ අතථ්‍ය පරිසරයක් නිර්මාණය කිරීමයි.

විමර්ශන නිලධාරියෙකුට විවිධ වර්ගයේ සයිබර් අපරාධ පිළිබඳව, විශේෂයෙන් ම ළමයින් සම්බන්ධ සයිබර් අපරාධ පිළිබඳවත්, සයිබර් අපරාධවලට අදාළ නීතිප්‍රතිපාදන පිළිබඳවත්, පියවරෙන් පියවර ක්‍රියාත්මක කරන අපරාධ විමර්ශන ක්‍රියාවලිය පිළිබඳවත් අවබෝධ කර ගැනීමට සහ මග පෙන්වීමට පහත දී ඇති කොටස් උපකාරී වේ. [15]

- *මාර්ගගත ලිංගික අපයෝජන සහ/හෝ සූරාකෑම* -ළමයින්ව ලිංගික අපයෝජනයට ලක්කිරීම සහ/හෝ ලිංගිකව සූරාකෑම සඳහා මාධ්‍යයක් ලෙස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම. වයසින් වැඩි හෝ වැඩියෙන් මුහුකුරා ගිය ළමයෙකුගේ හෝ වැඩිහිටියෙකුගේ ලිංගික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා වස්තුවක් ලෙස එම වයසින් වැඩි ළමයා හෝ වැඩිහිටියා විසින්ම ළමයෙකු සමග මාර්ගගතව සම්බන්ධතා හෝ අන්තර්ක්‍රියා සිදු කිරීම මෙයට ඇතුළත් වේ. මෙම සම්බන්ධතා හෝ අන්තර්ක්‍රියා ළමයාට එරෙහිව බලහත්කාරය යොදා ගැනීම, ළමයාව රැවටීම හෝ පෙළඹවීම, ළමයාට තර්ජනය කිරීම හෝ ළමයා පීඩනයට ලක් කිරීම මගින් සිදු කරනු ලැබේ.

- *සයිබර් හිරිහැරකිරීම* - වෙනත් පුද්ගලයෙකුට රිදවීමට හෝ අපහසුතාවයට පත් කිරීමට අදහස් කරන පාඨ හෝ පින්තූර යැවීමට හෝ පළ කිරීමට අන්තර්ජාලය, ජංගම දුරකථන හෝ වෙනත් උපාංග භාවිතා කිරීමේ ක්‍රියාවලිය. ළමයින් සහ තරුණයින් අතර සමාජ මාධ්‍ය සහ උපාංග අනිසි ලෙස භාවිතය වැඩි වීම සයිබර් හිරිහැර කිරීම් වැඩි වීමට හේතු වී තිබේ.වෙනත් පුද්ගලයෙකුට හානි කිරීම පිණිස අන්තර්ජාලය හරහා එම පුද්ගලයා පිළිබඳ කටකතා පළ කිරීම, තර්ජනය කිරීම, ලිංගික කරුණු පළකිරීම, පුද්ගලික තොරතුරු හෙළි කිරීම, වෛරී ප්‍රකාශ කිරීම හෝ ව්‍යාජ පැතිකඩ නිර්මාණය කිරීම මෙයට ඇතුළත් වේ.

- *ලිංගිකව අපයෝජනය කිරීම සඳහා මාර්ගගතව මිතුරුවීම* - වැඩිහිටියෙක් ළමයෙකුව ලිංගිකව අපයෝජනය කිරීමේ අදහසින් (බොහෝ විට මාර්ගගතව, හෝ මාර්ගගතව නොවන ලෙස)එම ළමයා සමග 'මිතුරුවීමේ'පිළිවෙත. ලිංගික අරමුණු සඳහා සහ/හෝ ඒ සඳහා සම්බන්ධතාවයක් ඇති කරගැනීම සඳහා ළමයින් සමග මෙලෙස මිතුරු වීම ප්‍රධාන වශයෙන් ම පිරිමින් විසින් සිදු කරන බව පර්යේෂණ සහ පවතින දත්ත වලින් පෙන්නුම් කරයි. වින්දිත ළමයාගේ සිත්ගන්නා සුළු බව / ආකර්ශනීය බව, පහසුවෙන් ප්‍රවේශවිය හැකි බව සහ අවදානම් සහගත බව පදනම් කර ගෙන අපරාධකරුවන් වින්දිතයෙකුව තෝරා ගනිති. ඉන් පසුව අපරාධකරු ඉලක්ක කරගත් වින්දිත ළමයා සමග මිත්‍රත්වයක් ගොඩනගා ගැනීමටත්, එම ළමයා පිළිබඳ අන්තර්ජාල මූලාශ්‍රවලින් තොරතුරු ලබාගෙන ඔවුන් රැවටීමටත් උත්සාහ කරති.

- *ළමා ලිංගික අපයෝජන ද්‍රව්‍ය සහ ළමයින් ලිංගිකව සූරාකෑමේ ද්‍රව්‍ය* - මූලික වශයෙන්ම ළමයින්ව ලිංගිකකරණය කරන හෝ සූරාකෑමට ලක්කරන ආකාරයෙන් එම ළමයින්ව නිරූපණය කරන මාධ්‍ය මෙයින් අදහස් වෙයි. 'ළමා ලිංගික අපයෝජන ද්‍රව්‍ය' යනු විශේෂයෙන් ම ළමා කාමුක දර්ශන අදහස් කිරීම සඳහා යොදනු ලබන යෙදුම වන අතර, එයින් ළමා ලිංගික අපයෝජන ක්‍රියාවන් නිරූපණය කරන ද්‍රව්‍ය කෙරෙහි සහ / හෝ ළමයින්ගේ ලිංගේන්ද්‍රිය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. 'ළමයින් ලිංගිකව සූරාකෑමේ ද්‍රව්‍ය' යන යෙදුම ළමයෙකු නිරූපණය කරන අනෙකුත් සියලුම ලිංගික ද්‍රව්‍ය ඇතුළත් කෙරෙන පුළුල් අර්ථයකින් භාවිතා කළ හැක.

**3.2 සයිබර් අපරාධ පිළිබඳව ශ්‍රී ලංකාවේ පවතින නීති රාමුව**

'සයිබර් අපරාධ පිළිබඳ බුඩපෙස්ට්' සම්මුතිය හෙවත් 'බුඩපෙස්ට් සම්මුතිය' යනුවෙන් ද හඳුන්වනු ලබන සයිබර් අපරාධ පිළිබඳ සම්මුතිය ජාතික නීති එකට එක්කිරීම, විමර්ශන සිදුකිරීමේ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම සහ සයිබර් අපරාධ හා සාක්ෂි එකතු කිරීම පිළිබඳ ජාතීන් අතර සහයෝගීතාවය වැඩිදියුණු කිරීම මගින් අන්තර්ජාල සහ පරිගණක අපරාධ විසඳීමට ප්‍රයත්න දරන පළමු ජාත්‍යන්තර ගිවිසුම වේ. ශ්‍රී ලංකාව 2015 වර්ෂයේ සිට බුඩපෙස්ට් සම්මුතියේ සාමාජිකයෙකි.

ශ්‍රී ලංකාව තුළ සයිබර් අපරාධ සම්බන්ධයෙන් 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත යටතේ විමර්ශන සිදු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ සයිබර් අපරාධවලට එරෙහිව ක්‍රියා කරන ප්‍රධානම ආයතනය වන්නේ ශ්‍රී ලංකා පොලීසියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය යි.

පනතේ පහත සඳහන් වගන්ති මගින් 'වැරදි' ලෙස සලකනු ලබන ක්‍රියාවන් මොනවාද යන්න දක්වා තිබේ:

| | | |
|---|---|---|
| 3 වෙනි වගන්තිය | - | පරිගණකයකට නීත්‍යානුකූල නොවන ප්‍රවේශයක් අත්කර ගැනීම |
| 4 වෙනි වගන්තිය | - | වරදක් සිදු කිරීම පිණිස නීත්‍යානුකූල නොවන ප්‍රවේශයක් අත්කර ගැනීම සඳහා යම් ක්‍රියාවක් සිදු කිරීම |
| 5 වෙනි වගන්තිය | - | අවසරය නොමැතිව පරිගණකයකට කර්තව්‍යයක් ඉටු කිරීමට සැලැස්වීම |

15 සයිබර් අපරාධ විමර්ශන අත්පොත ඉන්දියානු දත්ත ආරක්ෂණ සංගමය - ප්‍රකාශනය 2011

| | | |
|---|---|---|
| 7 වෙනි වගන්තිය | - | නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ලබාගත් දත්ත ආදිය සම්බන්ධයෙන් කටයුතු කිරීම |
| 8 වෙනි වගන්තිය | - | නීති විරෝධී ලෙස දත්ත අත්කර ගැනීම |
| 9 වෙනි වගන්තිය | - | නීති විරෝධී උපක්‍රම භාවිතය |
| 10 වෙනි වගන්තිය | - | සේවාවකට ප්‍රවේශය ලබා දෙන තොරතුරු අනවසරයෙන් හෙළිදරව් කිරීම |

*ළමයින් වෙළෙඳාම් කිරීම සහ/හෝ ළමයෙකුට එරෙහි සයිබර් අපරාධ පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයක් දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන සහ එහි දක්වා ඇති ළමයින්ට එරෙහි අපරාධ පිළිබඳ විධිවිධාන ද, පරිගණක අපරාධ පනතෙහි විධිවිධාන ද එකට එක්කර විමර්ශනය කර නඩු පැවරිය යුතු බව අවබෝධකර ගැනීම වැදගත් වේ.

**3.3 සයිබර් අපරාධ විමර්ශනයක අදියර**

**3.3.1. පළමු තොරතුරු**

ළමයෙකුට එරෙහිව සිදු කරන ලද සයිබර් අපරාධයක් පිළිබඳ පළමු තොරතුරු පහත සඳහන් ආකාරයට ඔස්සේ වාර්තා විය හැක:

1. වින්දිතයන් විය හැකි පුද්ගලයින් / පවුලේ සාමාජිකයින් / භාරකරුවන් / ඥාතීන් මගින්
2. උපකාරක දුරකථන සේවා/ක්ෂණික දුරකථන අංක - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පොලීසිය, රාජ්‍ය නොවන සංවිධාන මගින්
3. ලිඛිත පැමිණිලි (නිර්නාමික පැමිණිලි ඇතුළුව) - ලිපි, ඊමේල්, ෆැක්ස් ... යනාදිය මගින්
4. සිවිල් සමාජ සංවිධාන / ප්‍රජා මූලික සංවිධාන හරහා
5. මාධ්‍යවේදීන් / මාධ්‍ය / සමාජ මාධ්‍ය වාර්තා හරහා
6. පොලිස් දත්ත සංචිතය / අතුරුදහන් වූ හෝ සූරාකෑමට ලක්වූ ළමයින් පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය / ජාත්‍යන්තර ළමා ලිංගික සූරාකෑමේ දත්ත සංචිතය මගින්

**** විශේෂ සටහන : ළමා ලිංගික සූරාකෑම පිළිබඳ ජාත්‍යන්තර පිංතූර සහ වීඩියෝ දත්ත සංචිතය**

මෙම දත්ත සංචිතය ලොව පුරා සිටින වින්දිතයන් හඳුනාගැනීමේ විශේෂඥයින්ට ළමා ලිංගික අපයෝජන පිංතූර විශ්ලේෂණය කිරීමට සහ සංසන්දනය කිරීමට උපකාරී වෙයි. මෙය බුද්ධිමය සහ විමර්ශන මෙවලමක් වන අතර, මෙමගින් විශේෂඥභාවය සහිත විමර්ශකයින්ට ළමා ලිංගික අපයෝජන සිද්ධීන් පිළිබඳ දත්ත බෙදා ගැනීමට ඉඩ සලසයි. මෙම දත්ත සංචිතය සඳහා "පින්තූර සහ වීඩියෝ සංසන්දනය කිරීමේ මෘදුකාංගය" නමින් හඳුන්වන විශේෂ මෘදුකාංගයක් භාවිතා කරන අතර, මෙම මෘදුකාංගය භාවිතයෙන් විමර්ශකයින්ට ක්ෂණිකව වින්දිතයන්, අපයෝජකයන් සහ ස්ථාන අතර සම්බන්ධතා හඳුනා ගැනීමට හැකි වේ. යම් පින්තූරයක් පිළිබඳ විමර්ශණය කිරීමේ දී මෙම දත්ත සංචිතයෙහි තිබෙන විශේෂාංග මගින් වෙනත් රටක මේ හා සමාන පින්තූර දැනටමත් සොයාගෙන හෝ හඳුනාගෙන තිබේද යන්න හෝ මෙහි වෙනත් රූපවලට සමාන ලක්ෂණ තිබේද යන්න විමර්ශකයින්ට දැන ගැනීමට ඉඩ සැලසෙන බැවින් එකම දේ සෙවීම සඳහා නැවත කාලය ගත කිරීමට සිදු නොවන බැවින් ඔවුන්ගේ වටිනා කාලය ඉතිරි කර ගැනීමට හැකි වෙයි. තවද, එය රටවල් 68 ට අධික සංඛ්‍යාවක සිටින විශේෂඥ විමර්ශකයන්ට ලොව පුරා ඔවුන්ගේ මිතුරු රටවල් සමග තොරතුරු හුවමාරු කර ගැනීමට සහ දත්ත හුවමාරු කර ගැනීමට ඉඩ සලසයි. ඡායාරූප සහ වීඩියෝවල තිබෙන ඩිජිටල්, දෘශ්‍ය සහ ශ්‍රව්‍ය අන්තර්ගතය විශ්ලේෂණය කිරීම මගින් වින්දිතයින් හඳුනාගැනීමේ විශේෂඥයින්ට සාක්ෂි ලබා ගැනීමට, සිද්ධිවල තිබෙන එක හා සමාන ලක්ෂණ හඳුනා ගැනීමට සහ ළමා ලිංගික අපයෝජනවල වින්දිතයින් සොයා ගැනීමට ඔවුන් දරන උත්සාහයන් ඒකාබද්ධ කළ හැක.

ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීම පිළිබඳ කාර්යාංශය ස්වකීය විමර්ශන කටයුතු සඳහා ළමා ලිංගික සූරාකෑම පිළිබඳ ජාත්‍යන්තර දත්ත සංචිතය භාවිතා කිරීම සඳහා ජාත්‍යාන්තර පොලීසිය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

**3.3.2. පූර්ව-විමර්ශන ඇගයීම**

වාර්තා වන ළමා වෙළෙඳාම් / සිද්ධීන් ඇතුළු සෑම සයිබර් අපරාධයක් සම්බන්ධයෙන් ම පූර්ව විමර්ශන තක්සේරුවක් සිදු කිරීම සෑම විමර්ශන නිලධාරියෙකුට ම ඉතා වැදගත් වේ. පැමිණිලිකරු තම ගැටලු විසඳා ගැනීම සඳහා පොලිස් නිලධාරියෙක් හෝ වෙනත් ආයතනයක් වෙත ප්‍රවේශ වීමට පෙර, තමන් විසින්ම හෝ තම මිතුරන්ගේ හෝ වෙනත් අයගේ සහාය ඇතිව අදාළ ගැටළුව විසඳා ගැනීමට උත්සාහ කර තිබිය හැකි සාමාන්‍යයෙන් මතක තබා ගත යුතු කරුණකි. කෙසේ වෙතත්, පැමිණිලිකරුගේ මෙම ක්‍රියාවන් ඉතා වැදගත් ඩිජිටල් සාක්ෂිය/සාක්ෂි විනාශ කරනු ලැබීමට හේතු විය හැක. එමෙන්ම, ඇතැම් විට මෙම සාපරාධී ක්‍රියාව මේ වන විටත් සිදු කෙරෙමින් පවතින අපරාධයක් විය හැකි අතර, එමගින් තවදුරටත් හානි සිදු විය හැක. තවද, පැමිණිලිකරුවන් ඔවුන්නගේ කනස්සල්ල හෝ නොදැනුවත්කම නිසා මුලදී සම්පූර්ණ කරුණු හෙළි නොකිරීමට ද ඉඩ ඇත. මේ සියලු සාධක විමර්ශනවල ප්‍රතිඵල කෙරෙහි බලපානු ඇත.

වාර්තා වන එක් එක් සිද්ධියේ ස්වභාවය අනුව, විමර්ශන නිලධාරියා විසින් සිද්ධියේ සම්පූර්ණ විෂය පථය සහ අත්විය හැකි ප්‍රතිඵල අවබෝධ කර ගැනීම සඳහා පූර්ව විමර්ශන තක්සේරුවෙහි කොටසක් ලෙස, පැමිණිලිකරු/පැමිණිලිකරුව(න්)/වින්දිතයන්ගෙන් අවශ්‍ය තොරතුරු රැස් කර ගතයුතු ය. විමර්ශනයෙහි ක්‍රියාකාරී සැලැස්ම/ඉදිරි පියවර ගොඩනැගීමට මෙය විමර්ශන නිලධාරියාට උපකාරී වනු ඇත. ඩිජිටල් සාක්ෂි අතිශය වැදගත් බව සහ අස්ථාවර බව අවබෝධ ගෙන විමර්ශකයින් සහ තාක්ෂණ නිලධාරින් පූර්ව විමර්ශන තක්සේරුව සඳහා නිවැරදි සාක්ෂි ආරක්ෂා කරගෙන සහ එකතු කරගත යුතු වේ. පූර්ව විමර්ශන තක්සේරුවේදී අපරාධය සිදුවූ ස්ථානය සහ තත්ත්වයන් ඇතුළුව අපරාධයේ විවිධ පැති සලකා බැලිය යුතු ය.

විමර්ශන නිලධාරියෙකු පහත දී ඇති පියවර පදනම් කර ගෙන පූර්ව තක්සේරුව සිදු කළයුතු ය. එසේ කිරීම ඩිජිටල් සාක්ෂි විනාශ වීමට, හානිවීමට හෝ විකෘති කිරීමට ඉඩක් ලබා නොදී සියලුම ඩිජිටල් සාක්ෂි සුරක්ෂිත කිරීම සඳහා සිදුකළ යුතු ප්‍රමුඛතම ක්‍රියාමාර්ග මොනවාද යන්න තීරණය කිරීමට විමර්ශන නිලධාරියාට උපකාරී වනු ඇත.

විමර්ශන නිලධාරියා සියලුම නිවැරදි සහ අදාළ තොරතුරු ලබා ගැනීමෙන් පසුව පූර්ව විමර්ශන තක්සේරුව ආරම්භ කළයුතු අතර එමගින් විමර්ශන නිලධාරියාට සිද්ධියේ / අපරාධයේ සම්පූර්ණ විෂය පථය පිළිබඳව අදහසක් ලබා දෙයි.

### 3.3.2.1 අපරාධය හඳුනාගැනීම

ඉහත විස්තර කර ඇති පරිදි, පනතේ 6.2 වෙනි වගන්තිය මගින් පරිගණක අපරාධ පනත යටතේ 'වැරදි' ලෙස සලකනු ලබන ක්‍රියා මොනවාද යන්න නිර්වචනය කර ඇත. පරිගණක සහ වෙනත් ඩිජිටල් උපාංග භාවිතයෙන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ ළමයෙකුට එරෙහි අපරාධයක් වන ක්‍රියාවක් සිදු කර තිබිය හැක.

ලැබී ඇති තොරතුරුවලට අනුව වරදක් සිදු කර ඇති බව හෙළි වූ පසු, විමර්ශන නිලධාරි විසින් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය:

- වාර්තාවී ඇති ක්‍රියාව පිළිබඳව සවිස්තරාත්මකව තොරතුරු ලබා ගෙන, සිදු කර ඇති වරදවල් පිළිබඳ විස්තර පැමිණිල්ලෙහි සම්පූර්ණයෙන් ම ග්‍රහණය කර ඇති බවට සහතික කර ගැනීම.
- සයිබර් අපරාධයේ ස්වභාවය/ එය සිදුකර ඇති ක්‍රියා පිළිවෙළ විස්තරාත්මකව දක්වන්න (ඊමේල් ලිපිනය, පද්ධති, වේලා කලාප ආදිය ඇතුළත් කරන්න).
- පැමිණිල්ල මගින් හඳුනාගත හැකි, පහත සඳහන් ආකාරයේ සියලු විස්තර දක්වන්න:

    - විද්‍යුත් තැපැල සහ අන්තර්ජාලය සම්බන්ධ සිද්ධිවලදී අදාල IP ලිපිනය.
    - සමාජ ජාල සම්බන්ධ අපයෝජනයකදී පැතිකඩ නාමය හෝ පරිශීලක නාමය.
    - මාර්ගගත වංචාවකදී බැංකුව/අන්තර්ජාල බැංකුකරණය, ශාඛාව ආදිය පිළිබඳ විස්තර .
    - බැංකු කාඩ්පත් වංචාවකදී ක්‍රෙඩිට් කාඩ් විස්තර සහ මිලදී ගැනීමේ ස්වභාවය යනාදිය.

- පැමිණිල්ල සමග අමුණා ඇති ඕනෑම ලියවිල්ලක (විද්‍යුත් තැපැල වැනි) පැමිණිලිකරු සඳහන් කර ඇති හෝ සටහන් කර ඇති නිශ්චිත ආකෘතියට අනුව ම වේලාව සහ දිනය ඇතුළත් කළ යුතු අතර විමර්ශනය අතරතුර කාල කලාප පරිවර්තනය අනුගමනය කිරීමට ද සිදු වේ.

### 3.3.2.2. තාක්ෂණික ඇගයීම

**අපරාධ ස්ථානය පිළිබඳ පූර්ව සමාලෝචනය**

සාමාන්‍යයෙන්, අපරාධය සිදු වූ ස්ථානය පහත සඳහන් ඕනෑම පසුබිමකට අයත් විය හැකිය:

1. යම් පුද්ගලයෙකුගේ පරිගණක එකක් හෝ කිහිපයක් සහිත නිවස.
2. සයිබර් කැෆේ/පොදු ස්ථාන.
3. පරිගණක එකක් හෝ කිහිපයක් සහිත සහ ඇතැම් අවස්ථාවල විශාල හා සංකීර්ණ පද්ධති ජාලයක් සහිත සමාගම්/සංවිධාන.
4. අතථ්‍ය අවකාශයන්

**අපරාධ ස්ථානය: නිවසක්**

- අන්තර්ජාල සම්බන්ධතාවයෙහි වර්ගය (වයිෆයි/ඊතර්නෙට්) හඳුනා ගන්න.
- එම අන්තර්ජාල සම්බන්ධතාවය මගින් පරිගණක පද්ධති කීයක් භාවිතා කරන්නේ ද යන්න.
- එම පද්ධතිය/පද්ධති තබා ඇති ස්ථානය සහ එම පද්ධතිවලට ප්‍රවේශය ඇති පුද්ගලයින්ගේ විස්තර.
- පරිශීලක විසින් භාවිතා කරනු ලබන/පරිශීලක සතු,දත්ත ගබඩා කර ඉවත් කර ගත හැකි මාධ්‍ය (බාහිර දෘඪ තැටි ද ඇතුළුව) පිළිබඳ විස්තර ලබා ගන්න.
- ජාල ස්ථලකය (ටොපොලොජි) සහ නිර්මිතය (ක්ලයන්ට්-සර්වර්)(තිබේ නම්) පිළිබඳ විස්තර ලබා ගන්න.
- අනෙකුත් පරිගණක උපාංග (මුද්‍රණ යන්ත්‍ර/ස්කැනර්/මොඩම් ආදිය) පිළිබඳ විස්තර ලබා ගන්න.

**අපරාධ ස්ථානය: සයිබර් කැෆේ**

- සයිබර් කැෆේ තුළ ඇති පරිගණක පද්ධති සංඛ්‍යාව හඳුනා ගන්න.
- අන්තර්ජාලයට සම්බන්ධකර ඇති පරිගණක පද්ධති සංඛ්‍යාව හඳුනා ගන්න.
- ජාල ස්ථලකය (ටොපොලොජි) සහ නිර්මිතය (ක්ලයන්ට් - සර්වර්) පිළිබඳ විස්තර ලබා ගන්න.
- සී.සී.ටී.වී./වෙබ් කැමරාවලින් ලබාගත් දර්ශනවල කොටස් තිබේ නම් ඒවා ලබා ගන්න.
- සයිබර් කැෆේ හිමිකරු විසින් කිසියම් පරිශීලක කළමනාකරණ මෘදුකාංගයක් භාවිතා කරන්නේද?
- අදාළ කාල සීමාව තුළ අන්තර්ජාලය භාවිතා කළ අයගේ නාම ලේඛනය ලබා ගන්න.
- සයිබර් කැෆේ හිමිකරු විසින් අනුගමනය කරන ලද දත්ත ගබඩා කිරීමේ උපාංග ෆෝමැට් කිරීමේ ප්‍රතිපත්තිය පරීක්ෂා කරන්න.
- සයිබර් කැෆේ හිමිකරු විසින් දෘඪාංග ප්‍රතිස්ථාපනය කිරීම් සිදු කර තිබේ ද යන්න පරීක්ෂා කරන්න.
- සයිබර් කැෆේ පද්ධතිවල ඉවත් කර ගත හැකි මාධ්‍ය භාවිතය සම්බන්ධ ප්‍රතිපත්තිය පරීක්ෂා කරන්න.

**අපරාධ ස්ථානය: ආයතනික පරිසරය**

අපරාධය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය මූලික තොරතුරු රැස්කර ගන්න:

- සිදු වූ සිද්ධියේ ස්වභාවය කුමක්ද?
- එම සිද්ධිය අනාවරණය කරගත්තේ කවුද සහ කවදාද? සිද්ධිය සම්බන්ධයෙන් එම පුද්ගලයාගේ අවධානය යොමු වූයේ කුමක් මගින් ද?
- හානියක් සිදුවී තිබේ නම්, එහි තරම කොපමණ ද?
- සිද්ධිය සිදු වූ විට / අනාවරණය කරගන්නා විට එහි සේවය කරමින් සිටි පුද්ගලයින් කවුද?
- සාමාන්‍යයෙන් ආයතනයේ සිටින කණ්ඩායමේ සාමාජිකයන් කවුද?
- ආයතනය විසින් භාවිතා කරනු ලබන යෙදුම් සහ මෘදුකාංග සහ දත්ත සංචිත මොනවාද?
- භාවිතා කරනු ලබන එම යෙදුම් නිපදවා ඇත්තේ කවුද?
- එම යෙදුම් සඳහා සහාය සපයන්නේ සහ ඒවායෙහි නඩත්තුව සිදු කරන්නේ කවුද?
- සැබෑ සේවාදායකයන් ස්ථානගත කර ඇත්තේ කොහේද?
- පරිපාලන සහ සුපිරි පරිශීලක වරප්‍රසාද ඇත්තේ කාටද?
- සංවිධානයේ රක්ෂිත ගොනු (බැක්අප්) පිළිබඳ ප්‍රතිපත්තිය කුමක්ද?
- කුමන ආකාරයේ රක්ෂිත ගොනු (බැක්අප්) ලබාගෙන ඒවා කොපමණ කාලයක් රඳවා තබා ගන්නේද?
- ආයතනය විසින් සපයනු ලබන සේවාවන් මොනවාද?
- සිදු වූ සිද්ධියෙන් පීඩාවට පත්ව ඇත්තේ කවුද? ඔවුන්ව දැනුවත් කළාද?
- කුමන ආකාරයේ ආරක්ෂක පියවර අනුගමනය කරන්නේද (ඇන්ටි-වයිරස, ෆයර්වෝල්, සහ IDS/IPS)?
- භාවිතා කරනු ලබන ඕනෑම යෙදුමකින් ලොග්වීමට හැකියාව ලබා දී තිබේද?
- සේවකයින්ට කුමන මට්ටමව ප්‍රවේශවීම් ලබා දී තිබේද මොනවාද?
- සංවිධානයේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය කුමක්ද?
- මෙය කොපමණ කාලයකට වරක් විගණනය කරන්නේ ද/අනුකූලතාවය සඳහා පරීක්ෂා කරනු ලබන්නේද?
- පවතින භෞතික ආරක්ෂණ පියවර මොනවාද?

- ඊමේල් සේවාදායකයක් (සර්වරයක්) තිබේ නම්, එය ස්ථානගත කර ඇත්තේ කොහේද?
- සංවිධානයේ මානව සම්පත් ප්‍රතිපත්ති කුමක්ද සහ, මෑතක දී සේවයෙන් ඉවත්ව ගිය සේවකයින් අතරින් සැකකරනු ලබන කිසිවෙකු සිටින්නේද?

**අපරාධ ස්ථානය: අතථ්‍ය අවකාශ**

1. **පෙදෙසි ගබඩා (Local Storage) උපාංග:**
   - දෘඪ තැටි, එස්.එස්.ඩී., යූ.එස්.බී. ධාවක සහ අනෙකුත් භෞතික ගබඩා මාධ්‍ය.
   - ඩෙස්ක්ටොප්, ලේඛන ෆෝල්ඩර, බාගැනීම් සහ යෙදුම්-විශේෂිත නාමාවලි වැනි ස්ථාන.

2. **RAM (සසම්භාවී ප්‍රවේශ මතකය)( Random Access Memory):**
   - සක්‍රිය ක්‍රියාවලි සහ විවෘත ගොනු විසින් තාවකාලිකව දත්ත ගබඩා කරනු ලැබිය හැකි නශ්‍ය මතකය (වොලටයිල් මෙමරි).
   - ක්‍රියාත්මක වෙමින් පවතින සැකසුම්, සංකේතාංකන යතුරු, සහ ගබඩා කර නොමැති දත්ත නැවත ලබා ගැනීම සඳහා මෙමරි ඩම්ප් ග්‍රහණය කර ගැනීම.

3. **මෙහෙයුම් පද්ධති මෙවලම්:**
   - පද්ධති ලොගය, සිදුවීම් ලොගය, රෙජිස්ට්‍රි සටහන් සහ පද්ධති ගොනු.
   - පද්ධති ක්‍රියාකාරකම්, මෘදුකාංග ස්ථාපනය කිරීම්, පරිශීලක ක්‍රියාකාරකම් සහ වින්‍යාසකිරීම් (කන්ෆිගරේෂන්) පිළිබඳ තොරතුරු.

4. **ජාල මෙවලම්:**
   - ජාල ලඝු-සටහන්, පැකට් ග්‍රහණය කිරීම් සහ Traffic විශ්ලේෂණය.
   - භාවිතා කරන ලද IPaddresses, URLs සහ Protocols ඇතුළුව දත්ත සම්බන්ධිත ජාල සන්නිවේදන.

5. **පරිශීලක ක්‍රියාකාරකම්:**
   - බ්‍රව්ස් කිරීම් ඉතිහාසය, කුකීස්, කැෂ්ඩ් (Cached Files) ගොනු සහ බුක් මාර්ක්ස්.
   - පරිශීලකගේ අන්තර්ක්‍රියා, පිවිසි වෙබ් අඩවි සහ සබැඳි ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු.

6. **යෙදුම් දත්ත:**
   - ස්ථාපනය කර ඇති යෙදුම්වලට විශේෂිත ගොනු සහ ලොග් (*උදා:*චැට් ලොග්, ඊමේල් සේවාදායක, ඔෆිස් යෙදුම්).
   - විවිධ මෘදුකාංග යෙදුම් සමග භාවිතා කිරීමට සහ අන්තර්ක්‍රියා කිරීමට සම්බන්ධ දත්ත.

7. **ක්ලවුඩ් ස්ටොරේජ්:**
   - ගූගල් ඩ්‍රයිව්, ඩ්‍රොප්බොක්ස්, වන් ඩ්‍රයිව් සහ එවැනි වෙනත් ක්ලවුඩ් වේදිකාවල ගබඩා කර ඇති දත්ත.
   - වලාකුළෙහි සුරකින ලද ලේඛන, පැතුරුම්පත්, ඡායාරූප, උපස්ථ සහ අනෙකුත් ගොනු.

8. **ක්ලවුඩ් සේවා ලොග්:**
   - ක්ලවුඩ් සේවා සපයන්නන් විසින් සපයනු ලබන ප්‍රවේශ ලොග්, යූසේජ් ලොග් සහ ඇක්ටිවිටි ලොග්.
   - ප්‍රවේශවීමේ උත්සාහයන්, ගොනු වෙත ප්‍රවේශය, සංශෝධනය කිරීම් සහ මකාදැමීම් පිළිබඳ තොරතුරු.

9. **අතථ්‍ය යන්ත්‍ර සහ කන්ටේනර්:**
   - අතථ්‍ය යන්ත්‍ර හෝ කන්ටේනර් ක්ලවුඩ් යටිතල පහසුකම් මත ක්‍රියාකරවන අවස්ථා.
   - අථත්‍ය පරිසරයන්හි වින්‍යාස (කන්ෆිගරේෂන්)ගොනු, ස්නැප්ෂොට් සහ ක්‍රියාකාරකම් ලොග්.

10. **ක්ලවුඩ් යෙදුම් සහ සේවා:**
    - සැකකරු විසින් භාවිතා කරන ලද වෙබ් පාදක යෙදුම් සහ සේවා.
    - සී.ආර්.පී., ඊ.ආර්.පී. සහ වෙනත් ව්‍යාපාරික මෙවලම් ඇතුළුව එස්.ඒ.එස්. (Software as Service) යෙදුම් මගින් ජනනය කරන ලද දත්ත.

11.**API අන්තර්ක්‍රියා:**
- ක්ලවුඩ් සේවා ඒ.පී.අයි. සමග අන්තර්ක්‍රියා වලින් ලැබෙන ලොග් සහ දත්ත.
- යෙදුම් සහ සේවා ක්ලවුඩ් යටිතල ව්‍යුහය සමග අන්තර්ක්‍රියා කරන ආකාරය පිළිබඳ විස්තර.

12. **සත්‍යාපනය කිරීම සහ අනන්‍යතා කළමනාකරණය කිරීම:**
- පරිශීලක ගිණුම්, භූමිකා, අවසර සහ අනන්‍යතා සපයන්නන්ගේ ලොග් (උදා: AWS IAM, Azure AD).
- ක්ලවුඩ් පරිසරය තුළ පරිශීලකයින් සත්‍යාපනය කර ගැනීම, අවසරදීම සහ ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත.

13. **මෙටා දත්ත:**
- ගොනු, ඊමේල් සහ ලේඛන හා සම්බන්ධ මෙටා දත්ත.
- සාදන ලද දින, සංශෝධනය කරන ලද දින, කර්තෘ පිළිබඳ විස්තර, සහ ගොනු මාර්ග වැනි තොරතුරු.

14. **සංකේතනය සහ ආරක්ෂාව:**
- සංකේතාංකන යතුරු, සහතික සහ ආරක්ෂක ටෝකන.
- තොරතුරු සුරක්ෂිත කර ප්‍රවේශ වන ආකාරය පිළිබඳ දත්ත.

15. **බැක්අප් සහ තවදුරටත් අවශ්‍ය නොවන ගොනු:**
- බැක්අප් ගොනු සහ තවදුරටත් අවශ්‍ය නොවන ගොනු සඳහා විසඳුම්.
- බැක්අප් ගබඩාවෙහි හෝ ප්‍රතිබිම්බිත පරිසරයක පැවතිය හැකි දත්තවල පිටපත්.

16. **අන්තර්-ක්ලවුඩ් සන්නිවේදන:**
- විවිධ ක්ලවුඩ් පරිසරයන් අතර දත්ත හුවමාරුව සහ සන්නිවේදනය.
- ක්ලවුඩ් අතර ක්‍රියාකාරකම් සහ සහයෝගීතා පිළිබඳ තොරතුරු.

අපරාධය සිදු වූ ස්ථානයේ දී (වරදෙහි වර්ගය කුමක් වුවත්), විමර්ශන නිලධාරියා විසින් එම ස්ථානය සැලකිල්ලෙන් යුතුව පරීක්ෂාකර/විශ්ලේෂණය කර, තත්ත්වය නිරීක්ෂණය කර සහ තක්සේරු කර, සහ අත්‍ය අවකාශය නිර්ණය කර, තවදුරටත් ඉදිරියට විමර්ශනය කිරීම සඳහා අවශ්‍ය පියවර තීරණය කළ යුතු ය.

සාක්ෂි අත්අඩංගුවට ගැනීමට / සංරක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට පෙර, අපරාධය සිදු වූ ස්ථානයේ ඇති පද්ධතිවල/ජාලයේ ස්ථානීය තත්ත්වය, වාතාවරණයන් සහ තාක්ෂණික තොරතුරු අවබෝධ කර ගැනීම සඳහා පූර්ව විමර්ශන තක්සේරුව විමර්ශන නිලධාරියාට උපකාරී වනු ඇත. ඩිජිටල් සාක්ෂි ඉතා පහසුවෙන් විනාශ වන සුලු සහ අස්ථාවර ඒවා වේ. එම සාක්ෂි උපාංග ගණනාවකින්, ස්ථාන කිහිපයකින් සහ විවිධ ස්වරූපවලින් ලබා ගත හැක. උදාහරණයක් ලෙස, සම්මත ගබඩාකිරීමේ / පරිගණක උපාංග හැරුණු විට, පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, රවුටර්, හබ් ආදියෙහි අදාළ සිද්ධියට/සිදුවීමට සම්බන්ධ වැදගත් තොරතුරු ද අඩංගු විය හැක. එබැවින්, විමර්ශන නිලධාරි විසින් සාක්ෂි හඳුනා ගැනීමට සහ, ඒවා සෝදිසි කිරීමට සහ අත්අඩංගුවට ගැනීමට පෙර, වරද සිදු වූ සම්පූර්ණ ස්ථානය පිළිබඳ මූලික සමාලෝචනයක් සිදු කර, අමතර පියවර කිහිපයක් ගැනීම ඉතා වැදගත් වේ. පිළිවෙතක් ලෙස, විමර්ශන නිලධාරි විසින් අපරාධය සිදු වූ ස්ථානයේ 'තිබෙන තත්ත්වයන් එලෙසම තිබිය දී'ස්ථානය වීඩියෝ/ඡායාරූපගත කළ යුතු අතර, ජාල නිර්මිතය පිළිබඳව සටහනක් ඇඳ එය ලේඛනගත කළ යුතු ය.

පූර්ව විමර්ශන තක්සේරුවේ දී ඉහත පියවර අනුගමනය කිරීමවිමර්ශන නිලධාරියාට සිද්ධිය සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීමට සහ විමර්ශන ඉදිරියට ගෙන යා යුතු ආකාරය තීරණය කිරීමට උපකාරී වනු ඇත.

**3.3.3 සාක්ෂි රැස්කිරීම**

සයිබර් අපරාධ ස්ථානයක් සාම්ප්‍රදායික අපරාධ ස්ථානයකට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් ය. ඩිජිටල් සාක්ෂි පහසුවෙන් විනාශවනසුලු වන අතර ම එය පහසුවෙන් සහ රහසිගතව විකෘති කළ හැක. සාක්ෂි සෙවීමේදී, එකතු කිරීමේදී, සංරක්ෂණය කිරීමේදී, ප්‍රවාහනය කිරීමේ දී සහ පරීක්ෂා කිරීමේදී උපරිම සැලකිල්ල දැක්වීම සහ පූර්වාරක්ෂක උපාය මාර්ග අනුගමනය කිරීම සිදු කළ යුතු වේ.

**3.3.3.1 අපරාධ ස්ථානයට ආරක්ෂාව සැලසීම**

අපරාධයක් සිදු වූ ස්ථානය හඳුනා ගැනීමෙන් පසුව, විමර්ශන නිලධාරි එය සුරක්ෂිත කළ යුතු අතර, අපරාධය සිදු වූ ස්ථානයේ කායිකව සිටි සෑම පුද්ගලයෙකු පිළිබඳව ම සහ අපරාධය සිදු වූ ස්ථානය සුරක්ෂිත කරන අවස්ථාවේදී ඔවුන් ඉටුකරමින් සිටි කාර්යභාරය පිළිබඳව

සටහන්කර ගත යුතු ය.

- රැස්කර ගන්නා ලද තොරතුරු සහ අපරාධය සිදු වූ ස්ථානයේ දෘශ්‍ය පරීක්ෂාව පදනම් කර ගෙන, විමර්ශන නිලධාරි විසින් විභව්‍ය සාක්ෂි සියල්ල හඳුනාගත යුතු ය. මෙම භෞතික සාක්ෂිවලට අත්පොත්, පරිශීලක මාර්ගෝපදේශ සහ, කඩදාසිවල ලියන ලද මුරපද, බැංකු ගිණුම් අංක ආදී ඉතිරි වී ඇති අනෙකුත් දේ වැනි සාම්ප්‍රදායික භෞතික සාක්ෂි ඇතුළත් විය හැක. එමෙන්ම, අපරාධ සිදු වූ ස්ථානයේ තිබෙන විවිධ උපකරණ සහ අයිතමවල පිහිටීම සටහන් කරගැනීම ද වැදගත් වේ. උදාහරණයක් ලෙස, ඩෙස්ක්ටොප් පරිගණකය වම් අත පැත්තේ මවුසයක් තිබේ නම් පරිගණකය ක්‍රියාත්මක කරන පුද්ගලයා වම් අත භාවිතා කරන්නෙකු බව පෙන්නුම් කරයි.

- ඩිජිටල් සාක්ෂි හඳුනාගැනීමේදී, විමර්ශන නිලධාරියා දිරාපත් විය හැකි සාක්ෂි හඳුනාගෙන ඒවා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සියලු පූර්වාරක්ෂාවන් ක්‍රියාත්මක කිරීමට වග බලා ගත යුතු ය. සාක්ෂි සමාලෝචනය කරන අවස්ථාවේ දී, ඉලෙක්ට්‍රොනික සාක්ෂි ව්‍යාකූල කිරීම හෝ වෙනස් කරනු ලැබීම වැළැක්විය යුතු ය.

- පද්ධති අක්‍රිය කර තිබේ නම්, ඒවා පරීක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක නොකළ යුතු ය. පද්ධති ක්‍රියාත්මකව තිබේ නම්, ඒවා ක්‍රියාත්මක තත්ත්වයේ ම තැබිය යුතු යැයි උපදෙස් දෙනු ලැබේ.

- වරදක් සිදු කර ඇති ස්ථානයේ පද්ධති ක්‍රියාත්මකව තිබෙන්නේ නම්, විමර්ශන නිලධාරියා විසින් එය ඡායාරූප ගත කිරීමට සුදුසු පියවර ගත යුතු අතර, හැකි ඉක්මනින් සාක්ෂි අත්අඩංගුවට ගැනීමට සැලසුම් කර එය ලේඛනගත කළ යුතු ය. පහසුවෙන් විනාශ විය හැකි සාක්ෂි (වෙනස් විය හැකි දත්ත) හානිවීමකින් තොරව නිසි පරිදි ප්‍රතිසාධනය කර ගැනීමට හැකි වන පරිදි, එම සාක්ෂි අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලියේදී සහාය වීම සඳහා විමර්ශන නිලධාරියා සුදුසු තාක්ෂණ විශේෂඥයන්ගේ සහාය ලබා ගත යුතු ය. විමර්ශන ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර සෑම උපාංගයක්ම එය තබා ඇති කුටියේ අංකය හෝ නම, කාමරයේ වටපිටාව වැනි අදාළතොරතුරු සමග ඒවායෙහි මුල් ස්ථානයේ තිබියදී ඡායාරූපගත කර ගනු ලබන බවට වග බලා ගන්න.

- පද්ධති වෙත සවි කර ඇති ජාල කේබල් සහ විදුලි රැහැන් විමර්ශන නිලධාරියා විසින් සටහන් කර ගත යුතු ය. පැමිණිලිකරුගේ හෝ අදාළ ආයතනයේ තාක්ෂණ නිලධාරින්ගේ සහාය ඇතිව, සියලු ජාල සම්බන්ධතා, මොඩම් සහ දුරකථන මාර්ග ආදිය පිළිබඳව සටහන් කර ගෙන, ඒවා උපකරණයට සම්බන්ධවී ඇති කෙළවර සහ බිත්තිවල මූලාශ්‍රයට සම්බන්ධ කෙළවර යන දෙකම සටහන් කර ගන්න.

**3.3.3.2 සිද්ධිය / අපරාධය සීමා කිරීම**

- සිද්ධීන් පාලනය කිරීම යන්නෙන් අදහස් කරන්නේ සිද්ධියේ ස්වභාවය සහ විෂය පථය තීරණය කිරීම සහ හානියක් සිදුවන්නේ නම් එය අවම කිරීමයි. ප්‍රවේශය අවහිර කිරීම සඳහා ෆයර්වෝල් මත තවත් නියමයන් පැනවීම, බලපෑමට ලක් වූ යන්ත්‍ර ජාලයෙන් ඉවත් කිරීම, පරිශීලක ප්‍රවේශ පාලන අක්‍රිය කිරීම, හෝ බලපෑමට ලක් වූ යන්ත්‍ර සඳහා අතථ්‍ය රික්තයක් නිර්මාණය කිරීම එම පාලනය කිරීමේ පියවරවලට ඇතුළත් විය හැක. මෙම ක්‍රියාමාර්ග ගනු ලබන්නේ වින්දිතයා හෝ සංවිධානය විසින් විමර්ශකයින්ගේ / ආයතනවල උපදෙස් ලබා ගනිමිනි.

- මූල්‍ය වංචාවලදී, ප්‍රතිලාභියා/සැකකරු/චූදිත පුද්ගලයා වංචා සහගත මුදල් මාරු කිරීම් සිදු කිරීම වැළැක්වීම පිණිස විමර්ශන නිලධාරියා විසින් වහාම අදාළ බැංකු ශාඛා සම්බන්ධ කරගෙන බැංකු ගිණුම් අත්හිටුවීම කටයුතු කළ යුතු ය.

- විමර්ශන නිලධාරියා විසින් සමාජ ජාලවල/ප්‍රජා වෙබ් අඩවිවල ඇති ව්‍යාජ/අපහාසාත්මක පැතිකඩ අවහිර කරන ලෙස/ඉවත් කරන ලෙස සහ ඒ සමගම ප්‍රවේශ තොරතුරු ආරක්ෂා කරන ලෙස සේවා සපයන්නන්ගෙන් ඉල්ලා සිටිය යුතු ය. අපහාසාත්මක/අසභ්‍ය අන්තර්ගතයන්හි ප්‍රවේශ තොරතුරු සුරකින ලෙස ද විමර්ශන නිලධාරියා විසින් සේවා සපයන්නන්ට දැනුම් දිය යුතු ය.

- වාණිජ හේතූන් මත හෝ පොදු යහපත පිණිස විපතට පත් පාර්ශ්ව විසින් ඉලක්කගත පද්ධතිය වහාම ප්‍රතිෂ්ඨාපනය කිරීමට නම්, විමර්ශන නිලධාරියා විසින් සයිබර් අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති තාක්ෂණ නිලධාරින්ගේ සේවය ලබාගෙන, බලපෑමට ලක් වූ පද්ධතියේ රූප පිටපතක් ලබාගෙන, ඉන් පසුව එය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අවසර දිය යුතු ය. මෙම ක්‍රියාවන් ප්‍රමාණවත් සාධාරණීකරණයක් සහිතව ලේඛනගත කළ යුතු අතර, ඉතාමත්ම දුර්ලභ ම අවස්ථාවන්හිදී පමණක් භාවිතා කළ යුතු ය. සාමාන්‍යයෙන්, ප්‍රතිෂ්ඨාපනය සිදු කරනු ලබන්නේ සාක්ෂි අත්අඩංගුවට ගැනීමෙන් පසුව මිස සෘජුව ම අපරාධය වාර්තා කිරීමේ අදියරේදී නොවේ.

**3.3.3.3. සාක්ෂි ලේබල් කිරීම සහ ලේඛනගත කිරීම**

- පූර්ව විමර්ශන තක්සේරුවේදී සිදු කරන ලද හරස් සත්‍යාපන සටහන් සහ අපරාධ සිදු වූ ස්ථානයේ ඇති උපකරණ, ජාල සහ වෙනත් සන්නිවේදන උපකරණ සම්බන්ධ තාක්ෂණික තොරතුරු නිවැරදිව ලේඛනගත කිරීම.

- 'භාරකාරත්ව දාමය සහ ඩිජිටල් සාක්ෂි එකතු කිරීමේ ආකෘති' ලේඛනගත කරන්න. (නිෂ්පාදන ලේඛනය -PR පෝරමය)

- සෑම උපාංගයක් සඳහාම අනුක්‍රමික අංකයක් ලබා දිය යුතු අතර, එය 'භාරකාරත්ව දාමය සහ ඩිජිටල් සාක්ෂි එකතු කිරීමේ ආකෘති'පත්‍රවල නිසි ලෙස සටහන් කළ යුතු ය.

- වරද සිදු වූ ස්ථානයේ 'පවතින තත්ත්වය ඒ ආකාරයෙන් ම' ලේඛනගත කරන්න. (ඡායාරූප පින්තූරය)

**3.3.3.4 සාක්ෂි වෙනස් කිරීම වැළැක්වීම**

- පූර්ව විමර්ශන ඇගයීම්වල මූලික අරමුණ වන්නේ සයිබර් අපරාධවලට වගකිවයුත්තන්ට එරෙහිව සාර්ථකව නඩු පැවරීම සඳහා අවශ්‍ය කරන ඉතාමත් වැදගත් වන "සාක්ෂි වෙනස් කිරීම වැළකීම" ය. ඔබට සිද්ධිය සම්බන්ධයෙන් පැහැදිලි බවක් නොමැතිනම් හෝ සැකයක් ඇත්නම් හෝ ජාල පිළිබඳ අවබෝධයක් නොමැති නම්, හැකි ඉක්මනින්, ඕනෑම ප්‍රාදේශීය අධිකරණ වෛද්‍ය රසායනාගාරයකින් වෝහාරික පරීක්ෂකවරයාගේ සහාය ලබා ගන්න.

**3.3.3.5. උපාංග අත්අඩංගුවට ගැනීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම**

- අත්අඩංගුවට ගැනීම

- **ඩිජිටල් සාක්ෂි සොයා ගැනීම සහ අත්අඩංගුවට ගැනීම** සඳහා භාවිතා කරනු ලබන මෙවලම් පිළිබඳව සාක්ෂිකරුවන්ට කෙටියෙන් විස්තර කරන්න.

- **විදුලිය විසන්ධි කරන්න:** ක්‍රියාත්මක කර තිබෙන උපාංග සම්බන්ධයෙන් වන විට, තොරතුරු ලේඛනගත කළ පසු, වර්තමාන තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා විදුලි සැපයුම විසන්ධි කරන්න.

- **ලේබල් කිරීම සහ ඇසිරීම:** උපාංගය අනන්‍ය හඳුනාගැනීමේ නාමයක් යොදා ලේබල් කරන්න. එය ප්‍රතිස්ථිතික බෑගයක හෝ සාක්ෂි මල්ලක බහා හානි නොවන මුද්‍රාවකින් එය මුද්‍රා කරන්න.

- **ෆැරඩේ බෑග් භාවිතා කරන්න:** ජංගම උපාංග සහ අනෙකුත් රැහැන් රහිත උපාංග සම්බන්ධයෙන් වන විට, ඕනෑම රැහැන් රහිත සංඥා වර්ගයක් අවහිර කිරීම සඳහා සහ දුරස්ථව මකාදැමීම හෝ විකෘති කිරීම වැළැක්වීම සඳහා ෆැරඩේ බෑග් භාවිතා කරන්න.

- ගබඩා කිරීම

- **ආරක්ෂිතව ගබඩා කිරීම:** අත්අඩංගුවට ගත් උපාංගය ආරක්ෂිත, ප්‍රවේශය පාලනය කර ඇති පරිසරයක ගබඩා කරන්න. ඒ සඳහා සේප්පු හෝ අගුලු දැමිය හැකි කැබිනට් භාවිතා කරන්න.

- පාරිසරික තත්ත්වයන් පාලනය කිරීම: ගබඩා පරිසරය ආන්තික උෂ්ණත්වයන්, ආර්ද්‍රතාවය සහ විද්‍යුත් චුම්භක නිරෝධන වලින් තොර බව සහතික කර ගන්න.

- ප්‍රවාහනය

- ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම: හානිය වැළැක්වීම සඳහා ආරක්ෂිත, දේශගුණය තත්ත්වයන් පාලනය කර ඇති පරිසරයක උපාංගය ප්‍රවාහනය කරන්න. විද්‍යුත් චුම්භක නිරෝධන වළක්වා ගන්න.

- තත්ත්වයන් නිරීක්ෂණය කිරීම: උපාංගය භෞතික කම්පන වලින්, අධික උෂ්ණත්වයෙන් සහ තෙතමනයෙන් ආරක්ෂා කර ඇති **බවට සහතික කර ගන්න.**

**3.3.3.6. දත්ත ගබඩා කරන උපාංග හැසිරවීම**

- දත්ත ගබඩා කරන උපාංග ඉවත් කරන්න: ප්‍රායෝගිකව කළ හැකි නම් සහ අවශ්‍ය නම්, දෘඪ තැටි (හාර්ඩ් ඩිස්ක්) එස්.එස්.ඩී, යූ.එස්. බී. ඩ්‍රයිව්, සහ අනෙකුත් ගබඩා කිරීමේ මාධ්‍ය උපාංගයෙන් ඉවත් කරගන්න.

- දත්ත වෙනස්කිරීම වළක්වන (Write-blocker මෙවලම) භාවිතා කරන්න: රූපගත කිරීම හෝ පරීක්ෂණ සිදුකිරීම සඳහා දත්ත ගබඩා කිරීමේ මාධ්‍ය වෙත ප්‍රවේශ වන විට, දත්තවල කවර හෝ වෙනසක් සිදුවීම වැළැක්වීම සඳහා සෑම විටම දත්ත වෙනස්වීම වළක්වන Write-blocker මෙවලම භාවිතා කරන්න.

**3.3.3.7. වෝහාරික පිටපත් කිරීම**

සෑම ගබඩා මාධ්‍යයක්ම යම් දත්ත ප්‍රමාණයකින් සමන්විත වේ. අධිකරණ විද්‍යාත්මක කාර්යයන් සඳහා, උපාංගයේ ඇති කිසිදු තොරතුරක් වෙනස් නොවන ආකාරයට දත්ත පිටපත් කළයුතු ය.ඒ සඳහා පහත සඳහන් තාක්ෂණික ක්‍රම අනුගමනය කළයුතු ය.:

**න්‍යායානුකූල රක්ෂිත දත්ත** (Logical backup): එය යම් නිශ්චිත පරිමාවක ඇති නාමාවලි සහ ගොනු නාමාවලි පිටපත් කරයි. එය මකා දැමූ ගොනු හෝ භාවිතා නොකළ අවකාශයේ තිබෙන අවශේෂ දත්ත වැනි මාධ්‍යවල තිබෙන අනෙකුත් දත්ත ග්‍රහණය කර නොගනියි.

**දෘඪ තැටියක කොටසින් කොටස පිටපත් කිරීම** (Bit Stream Imaging):මෙය රූපකරණය හෝ ක්ලෝනකරණය ලෙසද හැඳින්වේ, එය කොටසින් කොටස මුල් මාධ්‍යයේ පිටපතක්ජනනය කරයි. එමගින් තැටියකින් තැටියකට (මුල් මාධ්‍යයේ සිට වෙනත් මාධ්‍යයකට) හෝ ‘තැටියකින් -ගොනුවකට’ (මුල් මාධ්‍යයේ සිට තනි සාමාන්‍ය ගොනුවකට) ආකාරයෙන් පිටපත් කිරීම සිදු කළ හැකිඅතර ඒ සඳහා වැඩි අවකාශ කාලයක් අවශ්‍ය වේ.

**දත්ත වෙනස්කිරීම වළක්වන මෙවලම** (Write-blocker):මේවා පරිගණකයක් විසින් ගබඩා කිරීමේ මාධ්‍යයක දත්ත ලිවීම වළක්වන දෘඪාංග සහ මෘදුකාංග මෙවලම් වේ. සැක සහිත ගබඩා මාධ්‍යය සෘජුවම දෘඪාංග Write-blocker වෙත සම්බන්ධ කර ඇති අතර, පසුව Write-blocker මෙවලම ගබඩා කර ඇති දත්ත ලබා ගන්නා උපාංගයට සම්බන්ධ කර ඇත. ඒ හා සමානව ම, දත්ත පිටපත් කර ගනු ලබන උපාංගය සම්බන්ධ කිරීමටපෙර, සැක සහිත පරිගණකයෙහි Write-blocker මෙවලම ස්ථාපනය කරනු ලැබේ.

**3.3.4. අපරාධ ස්ථානයේ දී සිදු කරන මූලික සම්මුඛ සාකච්ඡා**

වරදක් සිදු වූ ස්ථානයේ දී මූලික සම්මුඛ සාකච්ඡා සිදු කිරීම විමර්ශන නිලධාරියාට පූර්ව-විමර්ශනයේදී විභව සාක්ෂි හඳුනා ගැනීමට සහ අත්අඩංගුවට ගැනීමට උපකාරී වේ. විමර්ශන නිලධාරියෙකුට ඇසිය හැකි සම්මුඛ පරීක්ෂණ ප්‍රශ්න කිහිපයක් පහත සඳහන් පරිදි වේ:

- ගැටලුව පාලනය කිරීමට ගත් පියවර මොනවාද? (සැක සහිත පුද්ගලයින්ට එම ස්ථානයට කායිකව ප්‍රවේශවීමට ඉඩ නොදීම, සැකකටයුතු පරිගණක ඒවා සම්බන්ධ කර තිබූ ජාලයෙන් විසන්ධි කිරීම, සේවකයින්ට ප්‍රවේශ වීමට දීම අත්හිටුවීම යනාදිය) සියලු ම සැක සහිත පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන්ආදිය සමග.

- ගැටලුවට අදාළ තොරතුරු ආවරණය වන ලොග් සටහන් (පද්ධති ප්‍රවේශය ආදිය පිළිබඳ) තිබේද? ඒවායේ කිසියම් සැක කටයුතු සටහන් තිබේද?

- ගැටලුව ඇති වූ පසුව කිසිවෙකු පද්ධතිය භාවිතා කළේද?

- ඔබ මෙයට පෙර එවැනි අවස්ථාවක් නිරීක්ෂණය කර තිබේද?

- ෆයර්වෝල්/අයි.ඩී.එස්./ජාල ආරක්ෂණ උපාංග මගින් අක්‍රීය කරන ලද අනතුරු ඇඟවීම් පද්ධති තිබුණේද?

- ගැටළුව ඇති වූ පසුව බලපෑමට ලක් වූ පද්ධතිය හෝ ජාලය මත ක්‍රියාත්මක කරන ලද විධාන හෝ ක්‍රියාවලි සමූහය පිළිබඳ සවිස්තරාත්මක ලැයිස්තුවක් ලබා දෙන්න. (එය තහවුරු කිරීමේ ලිපියක් පැමිණිලිකරුගෙන් ඉල්ලන්න.)

- වෙනත් කවර හෝ ශාඛාවක/කාර්යාලයක මේ හා සමාන පද්ධති තිබේද?

- ගැටලුව සම්බන්ධයෙන් පිළිතුරු නොලැබුණු වෙනත් ප්‍රශ්න කිසිවක් තිබේද? (බලපෑමට ලක් වූ පද්ධති ලැයිස්තුව, සම්බන්ධ වූ පුද්ගලයින් ගණන, ආදිය)

- ගැටලුව විශ්ලේෂණය කිරීම සඳහා වන ඉදිරි සැලසුම් මොනවාද?
- අපරාධ ස්ථානයේ දී විමර්ශන නිලධාරි කළ යුතු දේ:
- විවිධ උපාංගවල පැමිණිලිකරුවන්/හිමිකරුවන් හඳුනාගෙන, එම උපාංගවලට ප්‍රවේශවීම් පිළිබඳ විස්තර, පරිශීලක නාම සහ සේවා සපයන්නන්ගේ විස්තර ලබා ගන්න. මුරපද වලින් සුරක්ෂිත / රක්ෂිත විවිධ තොරතුරු වෙත සාක්ෂිකරුවන් ඉදිරියේ දී ප්‍රවේශ වීම සඳහා සෝදිසි කිරීමේ සහ අත්අඩංගුවට ගැනීමේ කණ්ඩායම සමග මෙම පුද්ගලයින් ද සිටින බවට විමර්ශන නිලධාරි සහතික කර ගත යුතු ය.
- සංකේතාංකන ප්‍රතිපත්ති සහ වෙබ් අඩවියෙන් පිටත දත්ත ගබඩා කිරීම්, සහ දත්ත මධ්‍යස්ථානය සහ සංවිධානයේ ආපදා ප්‍රතිසාධන ප්‍රතිපත්ති හෝ උපස්ථ (බැක්අප්) සැලසුම් ඇතුළු සියලුම ආරක්ෂක පද්ධති පිළිබඳ තොරතුරු රැස් කරගන්න.
- සම්මුඛ සාකච්ඡාවලදී පෙරසූදානම්ව සිටීම සඳහා ජාලය හඳුනාගැනීමට හැකි පුද්ගලයින්ගේ ලැයිස්තුව හඳුනා ගැනීම සහ ජාලයේ ක්‍රමානුරූප රූප සටහනක් සකස් කර තිබීම ප්‍රයෝජනවත් වේ.

**3.3.5. ඩිජිටල් වෝහාරික විශ්ලේෂණය**

ඩිජිටල් වෝහාරික විද්‍යාව යනු ඩිජිටල් උපාංගවලින් සාක්ෂි සොයා ගෙන අපරාධකරුවන්ට එරෙහිව අධිකරණයක නඩු පැවරීමට උපකාරී වන, දියුණු වෙමින් පවතින පිළිවෙතකි. ඩිජිටල් වෝහාරික විද්‍යාව ද සාම්ප්‍රදායික වෝහාරික විද්‍යාව මෙන් වූ විද්‍යාවක් වන අතර, එහිදී විශේෂඥභාවය සහිත කුසලතා, මෙවලම් සහ වැඩසටහන් භාවිතා කරනු ලැබේ. විමර්ශකයින්ගේ දෘෂ්ටිකෝණයකින් සරලව කිවහොත්, එය මුල් සාක්ෂි වස්තුවේ සත්‍යවත්බව වෙනස් නොකර ඩිජිටල් උපාංගවලින් සාක්ෂි ලබා ගැනීමේ විද්‍යාවයි.

- දත්ත ප්‍රතිසාධනය:මකා දමන ලද, ඒ වෙනුවට වෙනත් ගොනු ප්‍රතිස්ථාපනය කර නොමැති ගොනු ප්‍රතිසාධනය කිරීම සහ විශ්ලේෂණය කිරීම මෙන්ම, වෙන් නොකරන ලද සහ භාවිතා නොකරන ලද අවකාශයෙහි ඇති ගොනු සහ පාඨ කොටස් පිටපත් කර ගැනීම මෙයට ඇතුළත් වේ.
- අක්ෂර හෝ ප්‍රධාන වචන සොයා ගැනීම:ද්විමය ගොනුවක් තුළඇති කියවිය හැකි පාඨ හඳුනා ගැනීමට හෝ නිශ්චිත අක්ෂර අනුපිළිවෙළක් අඩංගු ගොනුවක් සොයා ගැනීමට දන්නා සහ නොදන්නා ගොනු මෙන්ම වෙන් නොකරන ලද සහ භාවිතා නොකරන ලද අවකාශය පරීක්ෂා කර බැලීම මෙයට ඇතුළත් වේ.
- අස්ථාවර සාක්ෂි විශ්ලේෂණය: සම්බන්ධතා, ක්‍රියාවලි සහ අතිරේක මතකයෙහි වගු පරීක්ෂා කර බැලීමෙන් පද්ධතියෙහි දැනට පවතින තත්ත්වය කුමක්දැයි බැලීමට විශ්ලේෂකයාට හැකියාව ලබා දෙයි.
- කාලරේඛා විශ්ලේෂණය: රූපගත කරගන්නා ලද සියලුම ගොනු සමග සම්බන්ධිත,සංශෝධනය කරන ලද, ප්‍රවේශ වෙන ලද සහ වෙනස් කරන ලද වේලාවන් මත පදනම්ව, සිදුවීම් කාලරේඛාවක් නිර්මාණය කර විශ්ලේෂණය කරන ක්‍රියාවලියයි.
- පද්ධති ගොනු විශ්ලේෂණය: පද්ධති ද්විමය ගොනුවල සිදු කර ඇති අනවසර වෙනස්කම් හෙළි කරයි.

**3.4. විශේෂඥ සයිබර් අපරාධ විමර්ශනය කිරීමේ ආයතන**
**පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව**

පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසයේ සහාය ලබාගැනීම සඳහා වන සියලුම ඉල්ලීම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව), අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ ඒකකය,තැ.පෙ. 534, කොළඹ 01, යන ලිපිනය වෙත යොමු කළ යුතු ය.

පරිගණක අපරාධ පනතෙහි විධිවිධාන අනුව,පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසයේ පොලිස් නිලධාරියෙකුට පහත සඳහන් පරිදි අත්අඩංගුවට ගැනීමට, සෝදිසි කිරීමට සහ අත්අඩංගුවට ගැනීමට බලය ඇත:

21 (1) වගන්තිය, මෙම පනත යටතේ විමර්ශන ක්‍රියාවලියක දී යම් පොලිස් නිලධාරියෙකු විසින් නීතියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඕනෑම පරිශ්‍රයක ඇති ප්‍රවේශ විය හැකි ඕනෑම තොරතුරක් අත්අඩංගුවට ගැනීමේ, සෝදිසි කිරීමේ හෝ තොරතුරු තහනමට ගැනීමේ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැක.

එසේ වුව ද, මෙම පනත යටතේ වරදක් සිදු කරනලදැයි සැක කරනු ලබන තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගන්නා වූ පොලිස් නිලධාරියකු විසින් අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සහ ඒ අත්අඩංගුවට ගත් ස්ථානයේ සිට මහේස්ත්‍රාත්වරයා වෙත යාමට ගතවන කාලය අතහැර, ඒ තැනැත්තා අත්අඩංගුවට ගත් වේලාවේ සිට පැය විසිහතරක කාලයක් ඇතුළත, සැකකරු අත්අඩංගුවට ගන්නා ස්ථානයට ආසන්නතම මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය පහත සඳහන් ආයතන සහ අංශ සමග සහයෝගීත්වයෙන් යුතුව විමර්ශන කටයුතු සිදු කරයි:

- විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
- පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය
- රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
- ඩිජිටල් වෝහාරික සයිබර් විද්‍යාගාරය
- රජයේ විශ්ව විද්‍යාල (උදා: මොරටුව විශ්වවිද්‍යාල)
- මූල්‍ය බුද්ධි ඒකකය
- අන්තර්ජාල සේවා සපයන්නන්
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
- පරිගණක අපරාධ පනත යටතේ සඳහන් කර ඇති වෙනත් ඕනෑම පුද්ගලයෙක්/ආයතනයක්

**සයිබර් අපරාධ නිරීක්ෂණ ඒකකය - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සයිබර් අපරාධ නිරීක්ෂණ ඒකකය ළමයින්ට එරෙහි මාර්ගගත හිංසනය පිළිබඳ සිද්ධීන් අධීක්ෂණය කරමින් විමර්ශනය සිදු කරයි. එමෙන්ම මෙම ඒකකය සයිබර් ආරක්ෂාව සහ ළමයින්ගේ මාර්ගගත ආරක්ෂාව පිළිබඳ දැනුම හා කුසලතා බෙදා හැරීම හරහා දැනුවත්භාවය ඇති කරයි.
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එක්සත් රාජධානියේ ඉන්ටර්නෙට් වොච් ෆවුන්ඩේෂන් නැමති ආයතනය සමග එක්ව අන්තර්ජාල ළමා ලිංගික අපයෝජන රූප හඳුනා ගැනීම සහ ඉවත් කිරීම සඳහා මාර්ගගත මහජන පැමිණිලි ද්වාරයක් හඳුන්වා දී ඇත.

**ජාත්‍යන්තර පොලීසිය (ඉන්ටර්පෝල්)**

ජාත්‍යන්තර පොලීසිය ළමයින්ට එරෙහි ජාත්‍යන්තර මානයන් සහිත අපරාධ සම්බන්ධයෙන් ක්‍රියා කරයි. අන්තර්ජාලය හරහා ළමයින්ට සිදුවන ලිංගික අපයෝජන සහ සූරාකෑම් මැඩලීමට කටයුතු කිරීම එහි ප්‍රධානම කාර්යයන් ගෙන් එකක් වේ. අන්තර්ජාලයෙහි පවතින විශේෂ ලක්ෂණ, විශේෂයෙන්ම අන්තර්ජාලයේ නිර්නාමික ස්වභාවය ළමා ලිංගික අපයෝජන ද්‍රව්‍ය බෙදා හැරීමට සහ ඒවා වෙත ප්‍රවේශ වීමට විශාල වශයෙන් පහසුකම් සලසයි. වැරදිකරුවන්ට දැන් අන්තර්ජාලය හරහා ළමයින්ගේ සජීවී වීඩියෝ නිෂ්පාදනය කිරීමට (ළදරුවන් අපයෝජනය කිරීම් පවා), හුවමාරු කර ගැනීමට සහ එම අවස්ථාවේම අන්තර්ජාලයට යොමු කිරීමට හැකියාව ඇත. ඔවුන්ට සමාජ ජාල සහ ක්‍රීඩා හෝ යෙදුම්වල 'චැට්'පහසුකම හරහා ළමයින් සමග සෘජුව සම්බන්ධ විය හැක.

ජාත්‍යන්තර පොලීසියේ ළමයින්ට එරෙහි අපරාධ පිළිබඳ ඒකකය ප්‍රමුඛත්වය ලබා දෙන කාර්යයන් පහත සඳහන් පරිදි වේ:
- ලිංගික අපයෝජනවල වින්දිතයන් වූ යෞවනයින් හඳුනා ගැනීම සහ මුදා ගැනීම;
- ළමා ලිංගික අපචාර ද්‍රව්‍ය සඳහා ප්‍රවේශය අවහිර කිරීම;
- ලිංගික අපරාධකරුවන් ළමයින් අපයෝජනය කිරීමට හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් බේරී සිටීම සඳහා විදේශගත වීම වැළැක්වීම.

තවද,ජාත්‍යන්තර පොලීසියේ මිනිස් වෙළෙඳාම් විශේෂඥයින් වෙළෙඳාම් වල සහ බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීමේ වින්දිතයන් වූ ළමයින් බේරා ගැනීම සඳහා සාමාජික රටවල් සමග එක්ව කටයුතු කරයි.

මෙහි සේවා ලබා ගැනීම සඳහා අදාළ කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා හරහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි අතර, එම ඉල්ලීමට පහත සඳහන් තොරතුරු ඇතුළත් විය යුතු ය.

- සැකකරුවන් විසින් භාවිතා කරන ලද යම් වෙබ් සබැඳියක් හෝ වෙනත් 'සබැඳියක්'
- සිද්ධිය වූ දිනය සහ වේලාව
- සිද්ධිය පිළිබඳ විස්තරය
- අපරාධයට අදාළ නීති විධිවිධාන
- පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසයෙන්අපේක්ෂා කරන සහාය සහ තොරතුරු මොනවාද යන්න
- සිද්ධිය සම්බන්ධ ඉතිහාසය
- සාක්ෂි විනාශ වීම වළක්වා ගැනීම සඳහා හැකි ඉක්මනින් ඉල්ලීම සිදු කළ යුතු වේ.

4. **සම්මත මෙහෙයුම් පටිපාටියය ක්‍රියාත්මක කිරීම**

ළමයින් වෙළෙඳාම් කිරීමේ සිද්ධීන් පිළිබඳව විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සංකීර්ණ සහ බහුමාන ක්‍රියාවලියක් විය හැකි අතර, බොහෝ විට පුද්ගලයන් වෙළෙඳාම් කිරීම සම්බන්ධ ඕනෑම අපරාධයක් පිළිබඳව සාකල්‍ය ලෙස ආමන්ත්‍රණය කළ යුතු වේ. ඉහත දී ඇති සම්මත මෙහෙයුම් පටිපාටියය මගින් වින්දිත - දිවි ගලවා ගත් ළමයාගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කරන අතර ම විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට සහ අධීක්ෂණය කිරීමට අරමුණු කර ගෙන ඇත.

**4.1 සම්බන්ධීකරණය**

මෙම සම්මත මෙහෙයුම් පටිපාටියයවල ප්‍රධාන පාර්ශ්වකරුවන් වන මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලීසිය, විශේෂයෙන්ම පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය, මෙම සම්මත මෙහෙයුම් පටිපාටියයි ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම සිදු කළ යුතු ය.

ළමයින්ව වෙළෙඳාම් කරනු ලැබීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ ඵලදායි ලෙස විමර්ශනය කර නඩු පැවරීම සඳහා රජය තුළ වැදගත් කාර්යභාරයන් සහ කර්තව්‍යයන් ඉටු කරන තවත් ප්‍රධාන දෙපාර්තමේන්තු සහ ආයතන ද ඇති බැවින්, අදාළ පාර්ශවයන් සමග සිදු කරන මෙම සම්බන්ධීකරණ සහ සහයෝගීතා ක්‍රියාවලිය පිළිබඳව වරින් වර ඇගයීමක් සිදු කළ යුතු ය.

ළමයින් වෙළඳාම් කරනු ලැබීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා වන මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය හඳුන්වාදීමේ සහ ස්ථාපනය කිරීමේ අරමුණ වන්නේ ප්‍රාදේශීය, දිස්ත්‍රික්, පළාත් සහ ජාතික යන සෑම මට්ටමක ම ක්‍රියාත්මක වන පොලිස් ඒකක සහ පාර්ශවකරුවන් අතර සහයෝගීතාවය සහ සම්බන්ධීකරණය දිරිමත් කිරීමයි. එමෙන්ම, එවැනි අපරාධ විමර්ශනය කිරීමේදී සහ නඩු පැවරීමේදී ස්වකීය කාර්යභාරයන් සහ වගකීම් ඉටු කිරීම සඳහා මෙමගින් පාර්ශවකරුවන්ට මග පෙන්වීමක් ද සපයා දෙයි. මෙම විධිමත් කරන ලද හා සම්බන්ධීකරණය කරන ලද ක්‍රියාවලිය මගින් අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ එකඟතාවයෙන් යුත් ප්‍රයත්න තුළින් වින්දිත-කේන්ද්‍රීය හා ළමා හිතකාමී ආකාරයකට වෙළෙඳාම්වලින් දිවි ගලවා ගත් ළමා වින්දිතයන්ව කාලෝචිතව හඳුනා ගැනීම, බේරා ගැනීම සහ ඔවුන්ට සහාය දීම සහතික කරයි.

**4.2 යාවත්කාලීන කිරීම සහ සමාලෝචනය**


මෙම සම්මත මෙහෙයුම් පටිපාටියයවල ඵලදායිත්වය ඇගයීම පිණිස,සම්මත මෙහෙයුම් පටිපාටිය සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් සෑම වසරකම කාර්තුමය රැස්වීම් පවත්වනු ලැබේ. මෙම සම්මත මෙහෙයුම් පටිපාටියයවල අනුකූලත්වය සමාලෝචනය කිරීම සඳහා නිරන්තර, අවස්ථානුකූල වාර්තා සහ ප්‍රගති වාර්තා ලබාගෙන ප්‍රධාන පාර්ශවකරුවන් අතර සාකච්ඡා කරනු ලැබේ. මෙමගින් මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇති අතර, ක්‍රියාත්මක කිරීමේදී ගැටළු සහ අභියෝග හඳුනා ගැනීමට එය උපකාරී වෙයි. තවද, අදාළ පාර්ශ්වකරුවන්ගේ සාකච්ඡා සහ එකඟතාවයන් තුළින්, සම්මත මෙහෙයුම් පටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී සමීප සහයෝගීතාවයක් ඇති කර ගැනීමට අවශ්‍ය විය හැකි අතිරේක චක්‍රලේඛ සහ නියෝග හඳුන්වා දෙනු ලැබේ.

මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය සෑම වසර තුනකට වරක් ම සමාලෝචනය කරනු ලබන අතර, ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දෙනු ලබන ප්‍රතිපත්ති සහ නීති සංශෝධනවලට අනුව ඒවා යාවත්කාලීන කරනු ලැබේ.

**4.3 හැකියා සංවර්ධනය කිරීම**

පොලිස් නිලධාරින්ව පුහුණු කිරීම මෙන්ම, ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ සංවිධානාත්මක අපරාධ අවබෝධ කර ගැනීම පිළිබඳ වැඩිදුර දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම හරහා මහජන ආරක්ෂක අමාත්‍යාංශය මෙම සම්මත මෙහෙයුම් පටිපාටියයි ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය සම්බන්ධීකරණය සහ සහාය ලබා දෙනු ඇත.

**4.4 සම්මත මෙහෙයුම් පටිපාටිය: ක්‍රියාත්මක කිරීම, සහාය දීම සහ අධීක්ෂණය කිරීම**



**ඇමුණුම 1 - ළමයින් වෙළෙඳාම් කිරීමේ අපරාධයේ මූලිකාංග අවබෝධ කර ගැනීම**

**2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය(සංශෝධන) පනත - 360(ඇ) වගන්තිය**

| හිඟමනෙහි යෙදවීම (පිරිමි ළමයෙක්) | බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම | ලිංගික සූරාකෑම | බලහත්කාරයෙන් විවාහ කිරීම (ගැහැණු ළමයෙක්) |
|---|---|---|---|
| වෙළෙඳාම් කිරීමෙහි මූලික ලක්ෂණ සහ කරුණු | | | |
| කතරගම දේවාලය අසලදී 12 හැවිරිදි පිරිමි ළමයෙකු කතරගම පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. ඔහු සිඟමන් යැදීමෙහි නිරතවී සිටියේය. තමන් අනුරාධපුර ප්‍රදේශයේ සිට පැමිණි බවත්, කතරගමට පැමිණියේ දුම්රියෙන් සහ බස් රථයෙන් බවත් පොලීසියට ප්‍රකාශයක් ලබාදෙමින් එම ළමයා පවසයි. ඔහුගේ මාමා තමාට “නැන්දා” යනුවෙන් හඳුන්වා දෙන ලද අයෙකු සමග යන ලෙස ඉල්ලා සිටි බව ඔහු තවදුරටත් පැවසුවේය. ඔවුන් සමග ”ටැක්සි කමල්” යනුවෙන් හැඳින්වූ තවත් පුද්ගලයෙක් ද පැමිණ සිටියේය. එහිදී ඔහුව පිළිගෙන ඔහුව “බොස්” නමින් හැඳින්වූ කෙනෙකු යටතේ තබා ඇත. හිඟා කෑමට අමතරව කුඩා සුදු පාට “පාර්සල්” විවිධ ස්ථානවලට සහ කුලී රථ රියදුරන්ට ප්‍රවාහනය කිරීමට ද සිදු වූ බව ඔහු පැවසුවේය. ඔහු ඔහුට කිරීමට සිදුවූ කාර්යයන් පිළිකුල් කළ අතර, ඔහුට ආහාර පාන අවම වශයෙන් පමණක් ලබා දී තිබූ අතර ආපසු නිවසට යාමට ද ඉඩ දී තිබුණේ නැත. | පොලීසියට ලද තොරතුරක් මත බාලිකා නේවාසිකාගාරයක සිටි 15 හැවිරිදි දැරියක් බේරාගන්නා ලදී. පොලීසියට ඇයව හමුවන විට ඇය තමන්ට අයිති නැති රෙදි සෝදමින් සිටියාය. ඇය පාසල් යන්නේ නැත. ඇයගේ මව මැදපෙරදිග රටක සේවය කරන සංක්‍රමණික සේවිකාවක් වන අතර, ඇගේ පියා විසින් පවුල නඩත්තු කිරීම සඳහා ඇයව මෙම රැකියාවට භාර දී ඇත. අතුගෑමට, මොප් කිරීමට, මුළුතැන්ගෙය පිරිසිදු කිරීමට සහ අපිරිසිදු පිඟන් සහ රෙදි සේදීමට බල කරමින් තමන්ට නේවාසිකාගාර පාලිකාව තර්ජනය කරන බව ඇය ප්‍රකාශ කරන්නීය. ඇයට ආහාර පාන අවම ප්‍රමාණයක් ලබා දෙන අතර, මුළුතැන්ගෙයි මුල්ලක නිදා ගැනීමට ඉඩ දී ඇත. | 14 හැවිරිදි දැරියක් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබුවේ පොලීසිය විසින් හෝටලයක් වටලනු ලැබීමෙන් අනතුරුව ය. තමන් 09 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන බව පොලීසිය ඇයගෙන් ප්‍රශ්න කිරීමේදී ඇය කියා සිටියාය. ඇය පාසල් වෑන් රථයකින් පාසල් ගොස් තිබුණි. වෑන් රථයේ රියදුරු කඩවසම් පිරිමි ළමයෙකු වූ අතර, ඇය ඔහු සමග සම්බන්ධතාවයක් ගොඩනඟා ගත්තාය. දිනක් එම පිරිමි ළමයා ඔහු සමග හෝටලයකට යාමට ඇයව කැමති කර ගත්තේය. ඉන් පසු එම පිරිමි ළමයා ඇය සමග ලිංගිකව එක්වී ඇයව එම හෝටලයේ කළමනාකරුට භාර දී ඇත. ඔහු ඇයව බියගන්වමින් ඔහුගේ සේවාදායකයින්ට ලිංගික සේවා සපයන ලෙස ඇයට බල කළේය. | වයස අවුරුදු 15 ක පමණ නව යොවුන් වියේ ගැහැණු ළමයෙකු 60 හැවිරිදි පුද්ගලයෙකු සමග යන ආකාරය දැකීමේ සිදුවීමක් කාන්තා පොලිස් නිලධාරිනියක විසින් වාර්තා කරන ලදී. ඔවුහු නගරයේ විසිතුරු භාණ්ඩ සාප්පුවකට පැමිණියහ. එම දැරිය සිත්තැවුලෙන් සිටි අතර, මහලු මිනිසා ඇය සඳහා මිලදී ගැනීමට උත්සාහ කරන්නේ කුමක්ද යන්න පිළිබඳව පවා ඇය උනන්දු නොවූවාය. ඔහු සමග සිටීමට ඇයට බල කර තිබූ බවක් පෙනෙන්නට තිබුණි. ඉන් පසු, මිනිත්තු කිහිපයකට පසුව එම දැරියට අවශ්‍ය දෙයක් මිලදී ගන්නා ලෙස පවසා ඔහු සාප්පුවෙන් පිටතට පැමිණියේය. කාන්තා පොලිස් නිලධාරිනිය ඇය වෙත ගොස් ඇය සමග කතාබස් කරන්නට පටන් ගත්තාය. නව යොවුන් වියේ සිටි එම දැරිය හඬා වැළපෙන්නට වූ අතර, ඇගේ පියා මහලු පුද්ගලයාගෙන් මුදල් ණයට ගත් බව පැවසුවාය. ඔහුට එය ආපසු ගෙවීමට නොහැකි විය. දිනක් කුලී රථයක් ඇගේ නිවසට පැමිණි අතර ඇගේ |

| හිඟමනෙහි යෙදවීම (පිරිමි ළමයෙක්) | බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම | ලිංගික සූරාකෑම | බලහත්කාරයෙන් විවාහ කිරීම (ගැහැණු ළමයෙක්) |
|---|---|---|---|
| වෙළෙඳාම් කිරීමෙහි මූලික ලක්ෂණ සහ කරුණු | | | |
| | | | පියා ඇයට ඔහු සමග කුලී රථයෙන් යන ලෙස ඇයගෙන් ඉල්ලා සිටියේය. ඇයට මහලු මිනිසා සමග ජීවත් වීමට බල කර තිබූ අතර, එම පුද්ගලයා ඇයට පවසා ඇත්තේ ඇය නීත්‍යානුකූලව ඔහු සමග විවාහ වී ඇති බවයි. ඇය ඔහුගේ නීත්‍යානුකූල බිරිඳ බව පවසමින් ඔහු වෙනුවෙන් ලිංගික ක්‍රියා සිදු කරන ලෙස ඔහු ඇයට බල කළේය. |

| හිඟමනෙහි යෙදවීම (පිරිමි ළමයෙක්) | බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම | ලිංගික සූරාකෑම | බලහත්කාරයෙන් විවාහ කිරීම (ගැහැණු ළමයෙක්) |
|---|---|---|---|
| ක්‍රියාව | | | |
| **බඳවා ගැනීම**<br>ප්‍ර: ළමයාව බඳවා ගනු ලැබුවේද? කවුරුන් විසින්ද? | ප්‍ර: ළමයාව බඳවා ගනු ලැබුවේද? කවුරුන් විසින්ද? | ප්‍ර: ගැහැණුළමයාව බඳවා ගනු ලැබුවේද? කවුරුන් විසින්ද? | ප්‍ර: ගැහැණුළමයාව බඳවා ගනු ලැබුවේද? කවුරුන් විසින්ද? |
| පි: ඔව්<br>පි: ඔහුගේ මාමා විසින් | පි: ඔව් නේවාසිකාගාර පාලිකාව විසින් | පි: ඔව් පාසල් වෑන් රථයේ රියැදුරු විසින් | පි: ඔව් ඇගේ පියා විසින් |
| ප්‍රවාහනය කිරීම<br>ප්‍ර: ළමයා මුල් ස්ථානයේ සිට වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කළේද?<br>ප්‍ර: කවුරුන් විසින්ද?<br>ප්‍ර: ප්‍රවාහන ක්‍රමය? | ප්‍ර: ළමයා මුල් ස්ථානයේ සිට වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කළේද?<br>ප්‍ර: කවුරුන් විසින්ද?<br>ප්‍ර: ප්‍රවාහන ක්‍රමය? | ප්‍ර:ළමයා මුල් ස්ථානයේ සිට වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කළේද? කවුරුන් විසින්ද? ප්‍රවාහන ක්‍රමය? | ප්‍ර: ළමයා මුල් ස්ථානයේ සිට වෙනත් ස්ථානයකට<br>ප්‍ර: ප්‍රවාහනය කළේද? කවුරුන් විසින්ද?<br>ප්‍ර: ප්‍රවාහන ක්‍රමය? |
| පි: ඔව්, අනුරාධපුරයේ සිට කතරගමට,<br>පි: ඔහුගේ නැන්දා විසින්<br>පි: දුම්රියෙන් සහ බසයෙන් වෙනත් ස්ථානයකට මාරු කිරීම | පි: ඔව්<br>පි: පියා බස් රථයෙන් | පි:ඔව්<br>පි: පාසල් වෑන් රථයේ රියැදුරු විසින්<br>පි: බසයෙන් | පි: ඔව්<br>පි ඇගේ පියා විසින්<br>පි: කුලී රථයකින් |
| ප්‍ර: ළමයා වෙනත් පුද්ගලයෙකුට පවරා දුන්නේද? | ප්‍ර: ළමයා වෙනත් පුද්ගලයෙකුට පවරා දුන්නේද? | ප්‍ර: ළමයා වෙනත් පුද්ගලයෙකුට පවරා දුන්නේද? | ප්‍ර: ළමයා වෙනත් පුද්ගලයෙකුට පවරා දුන්නේද? |
| පි: ඔව්, 'ටැක්සි කමල්'යනුවෙන් හඳුන්වන නාඳුනන පුද්ගලයෙක්ට නවාතැන් දීම | පි: නැත | පි: ඔව්, හෝටල් හිමිකරුට | පි: ඔව්, 60 හැවිරිදි පුද්ගලයාට, ඔහුට ගෙවිය යුතු ණය මුදල සඳහා ගෙවීමක් ලෙස |

| **හිඟමනෙහි යෙදවීම (පිරිමි ළමයෙක්)** | **බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම** | **ලිංගික සූරාකෑම** | **බලහත්කාරයෙන් විවාහ කිරීම (ගැහැණු ළමයෙක්)** |
|---|---|---|---|
| ප්‍ර: ළමයාට වෙනත් කිසිවකු විසින් නවාතැන් දුන්නේද? | ප්‍ර: ළමයාට වෙනත් කිසිවකු විසින් නවාතැන් දුන්නේද? | ප්‍ර: ළමයාට වෙනත් කිසිවකු විසින් නවාතැන් දුන්නේද? | ප්‍ර: ළමයාට වෙනත් කිසිවකු විසින් නවාතැන් දුන්නේද? |
| පි: ඔව්, 'බොස්' යනුවෙන් හඳුන්වන නාඳුනන පුද්ගලයා භාර ගැනීම | පි: ඔව්<br>පි: නේවාසිකාගාරයේ පාලිකාව | පි: ඔව්, හෝටල් කළමනාකරු | පි: නැත |
| ප්‍ර: ළමයාව වෙනත් අයෙකු විසින් භාරගනු ලැබුවේද? | ප්‍ර: ළමයාව වෙනත් අයෙකු විසින් භාරගනු ලැබුවේද? | ප්‍ර: ළමයාව වෙනත් අයෙකු විසින් භාරගනු ලැබුවේද? | ප්‍ර: ළමයාව වෙනත් අයෙකු විසින් භාරගනු ලැබුවේද? |
| පි: 'බොස්' යනුවෙන් හඳුන්වන නාඳුනන පුද්ගලයා | පි: නැත | පි: ඔව්, හෝටලයේ සේවාදායකයින් කිහිප දෙනෙක් | පි: නැත. |
| | | | |
| **අරමුණ** | | | |
| බලහත්කාරයෙන් හෝ අනිවාර්ය ශ්‍රමය හෝ සේවා ලබා ගැනීම | | | |
| ප්‍ර: ළමයාට බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් ශ්‍රමය සපයාදීම සම්බන්ධ ක්‍රියාකාරකමක් කරන ලෙස ඉල්ලා සිටියේද? | ප්‍ර: ළමයාට බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් ශ්‍රමය සපයාදීම සම්බන්ධ ක්‍රියාකාරකමක් කරන ලෙස බලකර සිටියේද? | ප්‍ර: ළමයාට බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් ශ්‍රමය සපයාදීම සම්බන්ධ ක්‍රියාකාරකමක් කරන ලෙස බලකර සිටියේද? | ප්‍ර: ළමයාට බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් ශ්‍රමය සපයාදීම සම්බන්ධ ක්‍රියාකාරකමක් කරන ලෙස බලකර සිටියේද? |
| පි: ඔව්, ඔහුට කතරගම දේවාලය ඉදිරිපිට සිඟමන් යැදීමට පවරා තිබුණි. | පි: ඔව්, ඇයට නේවාසිකාගාරයේ මුළුතැන්ගෙය පිරිසිදු කිරීමට, බිමමොප් කිරීමට, රෙදි සේදීමට පවරා තිබුණි. ඇයට කිසිදු ගෙවීමක් ලැබුණේ නැත. මුදල් සියල්ල පියාට ගෙවා තිබුණි. | පි: නැත | පි: නැත |
| **වහල්භාවය** | | | |
| ප්‍ර: 'බොස්' යනුවෙන් හැඳින්වූ පුද්ගලයා ළමයා වහලෙකු ලෙස පාවිච්චි කළාද? | ප්‍ර: පාලිකාව විසින් ගැහැණු ළමයාව වහලියක් ලෙස යොදා ගත්තේද? | ප්‍ර: හෝටල් හිමිකරු විසින් ගැහැණු ළමයාව වහලියක් ලෙස යොදා ගත්තේද? | ප්‍ර: වයසක පුද්ගලයා විසින් ගැහැණු ළමයාව වහලියක් ලෙස යොදා ගත්තේද? |
| පි: එවැනි සාක්ෂි නොමැත | පි: ඔව්, වහල්භාවය වැනි තත්ත්වයන් පිළිබඳ සාක්ෂි තිබේ | පි: නැත | පි: නැත |
| **දාසකම** | | | |
| ප්‍ර: ළමයාව දාසකමට යොදා ගත්තේද? | ප්‍ර: ගැහැණු ළමයාව දාසකමට යොදා ගත්තේද? | ප්‍ර: ගැහැණු ළමයාව දාසකමට යොදා ගත්තේද? | ප්‍ර: ගැහැණු ළමයාව දාසකමට යොදා ගත්තේද? |
| පි: එවැනි සාක්ෂි නොමැත | පි: එවැනි සාක්ෂි නොමැත | පි: එවැනි සාක්ෂි නොමැත | පි: නැත |
| **අවයව ඉවත්කර ගැනීම :** | | | |

| **හිහමනෙහි යෙදවීම (පිරිමි ළමයෙක්)** | **බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම** | **ලිංගික සූරාකෑම** | **බලහත්කාරයෙන් විවාහ කිරීම (ගැහැණු ළමයෙක්)** |
|---|---|---|---|
| ප්‍ර: ළමයා යම් වෛද්‍ය ප්‍රතිකාරයකට හෝ සැත්කමකට භාජනය කර තිබේ ද? | ප්‍ර: ළමයා යම් වෛද්‍ය ප්‍රතිකාරයකට හෝ සැත්කමකට භාජනය කර තිබේ ද? | ප්‍ර: ළමයා යම් වෛද්‍ය ප්‍රතිකාරයකට හෝ සැත්කමකට භාජනය කර තිබේ ද? | ප්‍ර: ළමයා යම් වෛද්‍ය ප්‍රතිකාරයකට හෝ සැත්කමකට භාජනය කර තිබේ ද? |
| පි: එවැනි සාක්ෂි නොමැත | පි: එවැනි සාක්ෂි නොමැත | පි: එවැනි සාක්ෂි නොමැත | පි: එවැනි සාක්ෂි නොමැත |
| ගණිකා වෘත්තියේ යෙදවීම : | | | |
| ප්‍ර: කිසියම් පුද්ගලයකුට ලිංගික සේවා සැපයීමට ළමයාට බල කළේද? | ප්‍ර: කිසියම් පුද්ගලයකුට ලිංගික සේවා සැපයීමට ළමයාට බල කළේද? | ප්‍ර: කිසියම් පුද්ගලයකුට ලිංගික සේවා සැපයීමට ළමයාට බල කළේද? | ප්‍ර: කිසියම් පුද්ගලයකුට ලිංගික සේවා සැපයීමට ළමයාට බල කළේද? |
| පි: එවැනි සාක්ෂි නොමැත | පි: එවැනි සාක්ෂි නොමැත | පි: ඔව්, සේවාදායකයන්ට | පි: එවැනි සාක්ෂි නොමැත |
| ලිංගික සූරාකෑමේ වෙනත් ස්වරූප | | | |
| ප්‍ර: ළමයා වෙනත් ලිංගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගත්තේද? | ප්‍ර: ගැහැණුළමයා වෙනත් ලිංගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගත්තේද? | ප්‍ර: ගැහැණුළමයා වෙනත් ලිංගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගත්තේද? | ප්‍ර: ගැහැණුළමයා වෙනත් ලිංගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගත්තේද? |
| පි: එවැනි සාක්ෂි නොමැත | පි: එවැනි සාක්ෂි නොමැත | පි: එවැනි සාක්ෂි නොමැත | පි: ඔව්,මහලු මිනිසාගේ ඉල්ලීම මත ඔහුට ලිංගික ක්‍රියාකාරකම් කිරීමට ඇයට බල කෙරුණි. |
| ඕනෑම නීතියක් යටතේ වරදක් වන වෙනත් ඕනෑම ක්‍රියාවක් | | | |
| ප්‍ර: ළමයාට වෙනත් ආකාරවල ක්‍රියාකාරකම් කරන ලෙස බලකර සිටියාද? | ප්‍ර: ළමයාට වෙනත් ආකාරවල ක්‍රියාකාරකම් කරන ලෙස බලකර සිටියාද? | ප්‍ර: ළමයාට වෙනත් ආකාරවල ක්‍රියාකාරකම් කරන ලෙස බලකර සිටියාද? | ප්‍ර: ළමයාට වෙනත් ආකාරවල ක්‍රියාකාරකම් කරන ලෙස බලකර සිටියාද? |
| පි: ඔව්, කුඩා සුදු පාර්සල් (මත්ද්‍රව්‍ය යැයි සැක කරන) විවිධ ස්ථානවලට සහ කුලී රථ රියදුරන්ට ප්‍රවාහනය කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේය. | පි: එවැනි සාක්ෂි නොමැත | පි: ඔව්, ඇයව අන්තර්ජාල වීඩියෝ පටිගත කිරීම් සඳහා යොදා ගන්නා ලදී. | පි: නැත |

**ඇමුණුම 2 - ප්‍රධාන පාරිභාෂික වචන**

**"ළමයා"** යන්නෙන් වයස අවුරුදු දහඅටට අඩු ඕනෑම පුද්ගලයෙකු අදහස් වේ. [16]

**"ළමා වෙළෙඳාම"** සූරාකෑමේ අරමුණින් ළමයෙකු බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, වෙනත් ස්ථානයකට මාරු කිරීම, නවාතැන් දීම සහ භාර ගැනීම අදහස් කෙරෙයි. [17]

**"ණය දාසභාවය"** පුද්ගලයෙකුගේ චිත්ත ශක්තිය හා ශාරීරික ප්‍රතිරෝධය බිඳ වට්ටමින්, එම පුද්ගලයාට ගරුත්වයක් නොදක්වමින්, ඔහුගේ/ඇයගේ මානව ගෞරවය හීන කරමින්, අවමන් කරන හෝ ගරහන ආකාරයේ, *නැතහොත්* බිය, පීඩාව හෝ තමන් පහත්ය යන හැඟීමක් ඇති කරන ආකාරයේ සලකනු ලැබීමක්. [18]

**"ළමයින් සූරාකෑම"** ආර්ථික සූරාකෑම සහ ළමයාට අනතුරුදායක විය හැකි හෝ ළමයාගේ අධ්‍යාපනයට බාධාවක් විය හැකි හෝ ළමයාගේ සෞඛ්‍යයට හෝ කායික, මානසික, අධ්‍යාත්මික, සදාචාරාත්මක හෝ සමාජ සංවර්ධනයට හානිදායක විය හැකි ඕනෑම කාර්යයක්; නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ වෙළෙඳාම සඳහා සූරාකෑම; ලිංගික සූරාකෑම සහ ලිංගික අපයෝජනය, විශේෂයෙන්

ම කිසියම් නීති විරෝධී ලිංගික ක්‍රියාවක නිරත වීමට ළමයෙකු පෙළඹවීම හෝ බල කිරීම, ගණිකා වෘත්තියේ හෝ වෙනත් නීති විරෝධී ලිංගික ක්‍රියාවන්හි යොදවමින්ම ළමයින්ව සූරාකෑම සඳහා යොදා ගැනීම, සහ අසභ්‍ය සංදර්ශන සහ ද්‍රව්‍ය සඳහා ළමයින්ව සූරාකන ආකාරයෙන් යොදා ගැනීම; සහ ළමයින්ව පැහැර ගැනීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම හෝ වෙනත් කවර හෝ ආකාරයක ළමා සූරාකෑම හරහා ද ඇතුළුව ළමයෙකුගෙන් වාසි ලබා ගැනීමේ ක්‍රියාවක් අදහස් කෙරෙයි. [19]

**"මානව හිමිකම්"** මූලික නන්වැදෑරුම් නිදහසට, හිමිකම්වලට සහ මානව ගරුත්වයට බාධා කරන ක්‍රියා සහ නොකර හැරීම් වලට එරෙහිව පුද්ගලයන් සහ කණ්ඩායම් ආරක්ෂා කිරීමේ විශ්වීය නෛතික සහතික කිරීම. [20]

**"වෙළෙඳාම් කරු"** පුද්ගලයන් වෙළෙඳාම් කිරීමේ අපරාධය සිදු කරන හෝ සිදු කිරීමට උත්සාහ කරන ඕනෑම පුද්ගලයෙක් හෝ පුද්ගලයන් වෙළෙඳාම් කිරීමේ අපරාධය සිදු කිරීම සඳහා සහායකයෙකු ලෙස සහභාගී වන, වෙනත් පුද්ගලයින්ව සංවිධානය කරන හෝ මෙහෙයවන ඕනෑම පුද්ගලයෙක්. [21]

**"ජාවරම්වල වින්දිතයා"** අපරාධකරුව හඳුනාගෙන, අත්අඩංගුවට ගෙන, අපරාධකරුට එරෙහිව නඩු පවරා හෝ අපරාධකරුව වරදකරු කර තිබෙන්නේද නැත්ද යන්න නොසලකා, මිනිස් වෙළෙඳාමකට ගොදුරුවී ඇති ඕනෑම ස්වභාවික පුද්ගලයෙක්. [22]

**"වයස් තක්සේරුව"** අදාළ පුද්ගලයාළමයෙක් ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා පුද්ගලයෙකුගේ වයස හෝ වයස් පරාසය තහවුරුකර ගැනීම සඳහා බලධාරීන් විසින් උත්සාහ කරනු ලබන ක්‍රියාවලිය. [23]

**"වෙනස්කොට සැලකීම"** සියලු පුද්ගලයන් විසින් එක හා සමාන පදනමකින් සියලුම අයිතිවාසිකම් සහ නන්වැදෑරුම් නිදහස පිළිගැනීම, භුක්ති විඳීම හෝ ක්‍රියාත්මක කිරීම අහෝසි කිරීමේ හෝ අඩාල කිරීමේ අරමුණ ඇතිව හෝ එවැනි බලපෑමක් ඇති කරන ආකාරයෙන් ජාතිය, සමේ වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මතය, ජාතික හෝ සමාජීය සම්භවය, දේපළ, උපත හෝ වෙනත් තත්ත්වයන් වැනි කවර හෝ පදනමක් මත ඕනෑම ආකාරයක වෙනසක්, බැහැර කිරීමක්, සීමා කිරීමක් හෝ මනාපය දැක්වීමක්. [24]

**"සංවිධානාත්මක අපරාධ කණ්ඩායම"** සෘජුව හෝ වක්‍රාකාරයෙන් හෝ මූල්‍යමය හෝ වෙනත් ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා බරපතල අපරාධ හෝ වැරදි එකක් හෝ කිහිපයක් සිදු කිරීමේ අරමුණින් දීර්ඝ කාලයක්තිස්සේ ක්‍රියාත්මක වන සහ සාමූහිකව ක්‍රියා කරන පුද්ගලයන් තිදෙනෙකු හෝ එයට වැඩි ගණනකින් යුත් ව්‍යුහගත කණ්ඩායමක්. [25]

**"සම්මත මෙහෙයුම් පටිපාටියය"** කාර්ය සාධනය වැඩි කිරීමට, කාර්යක්ෂමතාව වැඩි කිරීමට සහ පද්ධතිමය ඒකරූපීකරණය හරහා ගුණාත්මක බව සහතික කරමින් නිතිපතා සිදු කරනු ලබන කාර්යයක් සම්පූර්ණ කිරීම සඳහා සකස් කර ඇති ලිඛිත මාර්ගෝපදේශ හෝ උපදෙස් මාලාවක්. මෙම යෙදුම ප්‍රථම වරට භාවිත කළ බවට වාර්තාවී ඇත්තේ 20 වෙනි සියවසේ මැද භාගයේදීය. [26]

**"සම්මත මෙහෙයුම් පටිපාටියය"** සම්මත මෙහෙයුම් පටිපාටියයක් යනු සේවකයින්ට දෛනික මෙහෙයුම් සිදු කිරීමට උපකාර කිරීම සඳහා සංවිධානයක් විසින් සම්පාදනය කර ඇති පියවරෙන් පියවර වූ උපදෙස් මාලාවකි. සම්මත මෙහෙයුම් පටිපාටියක අරමුණ වන්නේ වැරදි සන්නිවේදනයන් සහ කර්මාන්ත නියමයන්ට අනුකූල වීමට අපොහොසත් වීම් අවම කර ගනිමින්, කාර්යක්ෂමතාව, ගුණාත්මක නිමැවුම සහ කාර්ය සාධනයේ ඒකාකාරිත්වය සාක්ෂාත් කර ගැනීමයි. [27]

**"ළමා ශ්‍රමය"** ළමයෙකු විසින් තමාගේ සෞඛ්‍යයට, අධ්‍යාපනයට සහ ශාරීරික, මානසික, අධ්‍යාත්මික, සදාචාරාත්මක හෝ සමාජීය සංවර්ධනයට අහිතකර වන ආකාරයේ ඕනෑම කාර්යයක් ඉටු කිරීමයි. [28]

---

16 මිනිස් ජාවාරම් පිළිබඳ ගිවිසුම, 2000, 3(ඇ) වෙනි වගන්තිය
17 මිනිස් ජාවාරම් පිළිබඳ ගිවිසුම, 2000, 3(ඇ) වෙනි වගන්තිය
18 වහල්භාවය, වහල් වෙළඳාම සහ වහල්භාවයට සමාන පිළිවෙත් අහෝසි කිරීම පිළිබඳ අතිරේක සම්මුතියෙන් උපුටා ගන්නා ලද 1(අ) වගන්තිය
19 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි, 32, 34 සහ 35 වගන්ති වලින් උපුටා ගන්නා ලදී
20 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය, සහයෝගීතාවය ගොඩනැගීම සඳහා වන මානව හිමිකම් පදනම් වූ ප්‍රවේශයක් පිළිබඳ නිතර අසනු ලබන ප්‍රශ්න, 2006
21 සංක්‍රමණය පිළිබඳ පාරිභාෂික ශබ්දකෝෂය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2019, පි.216
22 සංක්‍රමණය පිළිබඳ පාරිභාෂික ශබ්දකෝෂය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2019, පි.216
23 සංක්‍රමණය පිළිබඳ පාරිභාෂික ශබ්දකෝෂය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2019, පි.7
24 මානව හිමිකම් කවුන්සිලය, ලොදු අදහස් අංක 18 (වෙනස්කොට නොසැලකීම, 1989)
25 වගන්තිය 2(අ) අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි සම්මුතිය, 2000
26 https://www.britannica.com/topic/standard-operating-procedure
27 https://en.wikipedia.org/wiki/Standard_operating_procedure
28 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 32 වෙනි වගන්තිය

**"සූරාකෑම"** සූරාකෑම යන්නට අවම වශයෙන්, අන් අයව ගණිකා වෘත්තියේ යෙදවී මගින් සූරාකෑම හෝ වෙනත් ආකාරයේ ලිංගික සූරාකෑම, බලහත්කාරයෙන් ශ්‍රමය හෝ සේවා ලබා ගැනීම, වහල්භාවය හෝ වහල්භාවයට සමාන පිළිවෙත්, දාසකම හෝ අවයව ඉවත් කිරීම ඇතුළත් වේ. [29]

**"ළමයාගේ උපරිම යහපත"**

1. රාජ්‍ය හෝ පෞද්ගලික සමාජ සුබසාධන ආයතන, අධිකරණ, පරිපාලන අධිකාරීන් හෝ ව්‍යවස්ථාදායක ආයතන වැනි කවර හෝ ආයතනයක් විසින් සිදු කරනු ලබන ළමයින් සම්බන්ධ සියලු ක්‍රියාවලදී, මූලික වශයෙන් ළමයාගේ උපරිම යහපත සලකා බැලිය යුතු ය.

2. ළමයාගේ දෙමව්පියන්ගේ, නීත්‍යානුකූල භාරකරුවන්ගේ හෝ ළමයාට නීත්‍යානුකූලව වගකිව යුතු වෙනත් පුද්ගලයින්ගේ යුතුකම් සහ වගකීම් සැලකිල්ලට ගනිමින්, ළමයාගේ උපරිම යහපත සහතික කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂාව සහ රැකවරණය සැලසීමට රාජ්‍ය පාර්ශව එකඟ වෙන අතර, මේ අරමුණ ඉටුකිරීම සඳහා සඳහා සියලු යෝග්‍ය ව්‍යවස්ථාදායක සහ පරිපාලන පියවර ගත යුතු ය.

3. ළමයින්ගේ රැකවරණය හෝ ආරක්ෂාව සඳහා වගකිව යුතු ආයතන, සේවා සහ පහසුකම් විශේෂයෙන් ම ආරක්ෂාව, සෞඛ්‍යය, සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව සහ යෝග්‍යතාවය යන ක්ෂේත්‍ර මෙන්ම නිසි අධීක්ෂණය යන අංශ වලින් නිසි බලධාරීන් විසින් ස්ථාපනය කරනු ලැබ ඇති ප්‍රමිතීන්ට අනුකූල වන බව, රාජ්‍ය පාර්ශ්වයන් විසින් සහතික කළ යුතු ය. [30]

**මෙවලම්/උපකරණ ලෙස පරිගණක පද්ධති භාවිත කරනු ලබන අපරාධ**

**"මූල්‍ය වංචා"**
ලාභ ලැබීමේ අවස්ථා සපයා දෙන බව පවසා අහිංසක මිනිසුන් රවටා ඔවුන්ගේ මුදල් සහ අනෙකුත් වටිනා දේ වංචා කරන ආකාරයේ ව්‍යාපාර වංචා, ආයෝජන වංචා, මහා පරිමාණ අලෙවිකරණ වංචා, විදේශ රැකියා පිරිනැමීම්, නයිජීරියානු වංචා, ව්‍යාපාරික අවස්ථා වංචා යනාදිය මූල්‍ය වංචාවලට ඇතුළත් වේ.

**"දත්ත වෙනස් කිරීම"**
මෙම අපරාධයේදී අපරාධකරු මූල්‍ය පද්ධති වැනි ඉලක්කගත පරිගණක පද්ධතියට ඇතුළු වී එම පද්ධතියේ අඩංගු දත්ත වෙනස් කිරීම හෝ මාරු කිරීම සිදු කරයි. පරිගණකයේ බලයලත් පරිශීලකයන් (අභ්‍යන්තර පුද්ගලයින්) විසින් ද මෙම ආකාරයේ අපරාධ සිදු කරනු ලැබිය හැක.

**"අනන්‍යතා සොරකම් කිරීම සහ අවභාවිතය"**
මෙය සංවේදී අනන්‍යතා තොරතුරු, එනම් උපන් දිනය, නම, ස්ථිර ගිණුම් අංක, විදේශ ගමන් බලපත්‍ර අංක, ක්‍රෙඩිට් කාඩ් අංක, විද්‍යුත් තැපැල් ගිණුම් ආදී තොරතුරු වංචනික අරමුණු සඳහා සොරකම් කිරීමයි. පරිශීලකයා ප්‍රසිද්ධ ආයතනවලින් ලෙස පෙන්වා වින්දිතයාට වංචනික ඊ-මේල් ආදිය යවා රහස් තොරතුරු ලබා ගැනීම වින්දිතයාගේ විද්‍යුත් තැපැල් ලිපිනයට සබැඳි කිහිපයක් යවා ඒ ඔස්සේ රහසිගත තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටීම හෝ සමාජ ඉංජිනේරු විද්‍යාව හරහා තොරතුරු ලබා ගැනීම, Key logger භාවිතා කිරීම වැනි ක්‍රම කිහිපයකින් සංවේදී තොරතුරු ලබා ගනු ලැබිය හැක.

**"සයිබර් හිරිහැර කිරීම/පීඩා කිරීම"**
එය කෙනෙකුට හිරිහැර කිරීම, තර්ජනය කිරීම හෝ බිය ගැන්වීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම ලෙස අර්ථ දක්වා ඇත. සයිබර් හිරිහැර කිරීම් වලට තර්ජනය කිරීම්, ප්‍රකෝපකාරී අපහාස හෝ ජාතිවාදී හෝ වාර්ගික අපවාද යැවීම, සමලිංගික පුද්ගලයන්ට බැන වැදීම්, වින්දිතයාගේ පරිගණකයට වෛරසයක් ආසාදනය කිරීමට උත්සාහ කිරීම සහ පණිවුඩ විශාල ප්‍රමාණයක් යවා ඊමේල් ගිණුමක ලැබෙන ලිපි කොටස පිරවීම ආදිය ඇතුළත් වේ.

**"දත්ත සොරකම"**
දත්ත සොරකම් කිරීම යනු පරිගණකයේ/පරිගණක පද්ධතියේ/පරිගණක ජාලයේ හිමිකරුගේ අවසරයකින් තොරව එහි ඇති දත්ත පිටපත් කිරීමයි. එය බොහෝ විට රැකියා ස්ථානයේ/ව්‍යාපාරයේ පරිගණක පද්ධතියට අනවසරයෙන් ඇතුළුවී වර්ගීකරණය කරන ලද සහ සංවේදී තොරතුරු පිටපත් කර ගැනීමේ ආකාරයෙන් සිදු විය හැක. සොරකම් කරනු ලබන දත්ත වර්ග නිල/ව්‍යාපාරික සන්නිවේදන, ගනුදෙනුකරුවන්, සේවාලාභීන්, ලිපින, පරිශීලක නාම, මුරපද, ක්‍රෙඩිට් කාඩ් අංක සහ වෙනත් අදාළ ලියකියවිලි සම්බන්ධ තොරතුරු වැනි ඕනෑම දෙයක් විය හැක,.

29 පුද්ගලයින් ජාවාරම් කිරීම් වැළැක්වීම, මර්දනය කිරීම සහ ජාවාරම්කරුවන්ට දඬුවම් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය, 2000, 3 වෙනි වගන්තිය
30 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 6 වෙනි වගන්තිය

**"ළමා ලිංගික අපයෝජන ද්‍රව්‍ය"**

ඒවා ළමයෙකු සම්බන්ධ ලිංගික අසභ්‍ය අන්තර්ගතයන් වේ. දෘශ්‍ය නිරූපණවලට ඡායාරූප, වීඩියෝ හෝ නිශ්චිත බාල වයස්කරුවන්ගෙන් වෙන්කර හඳුනාගත නොහැකි පරිගණක-උත්පාදිත රූප ඇතුළත් විය හැක.

**"වෙළෙඳ රහස් සහ බුද්ධිමය දේපළ සොරකම් කිරීම"**

දැනුම පදනම් කරගත් වත්කම් සහ ප්‍රාග්ධනය, වෙළෙඳ සැලසුම්, ලාංඡන, අදහස් සහ නවෝත්පාදන, පුද්ගලයෙකුට හෝ සංවිධානයකට ප්‍රකාශන හිමිකම් ඇති ද්‍රව්‍ය සොරකම් කිරීම ආදිය එයින් අදහස් වෙයි. එයට ශ්‍රව්‍ය, දෘශ්‍ය ද්‍රව්‍ය සහ චිත්‍රපට යනාදිය ද ඇතුළත් වේ. බුද්ධිමය දේපළ සොරකම් යටතේ වැඩිම සිද්ධීන් සංඛ්‍යාවක් සිදුවී ඇත්තේ මෘදුකාංග සහ එහි මූල (Source Code) මගින් ය.

**"ආරක්ෂිත පද්ධතිවල ඔත්තු බැලීම"**

මෙවැනි ඔත්තු බැලීම් සහ රාජ්‍ය පද්ධති පිළිබඳ ඔත්තු බැලීම බොහෝ විට සිදු කරනු ලබන්නේ සතුරාගේ හෝ අසල්වැසි රටවල බුද්ධි අංශ නිලධාරීන් විසිනි. සංවේදී සහ රහසිගත ලේඛන වෙත ප්‍රවේශ වීම මෙයට ඇතුළත් වේ.

**ඇමුණුම 3 - පුද්ගලයින් වෙළෙඳාම් කිරීම සහ ළමයින් වෙළෙඳාම් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සහ ජාතික නීති රාමුව**

**පුද්ගලයින් වෙළෙඳාම් කිරීම (අර්ථ දැක්වීම)**

3 වෙනි වගන්තිය -

(අ) 'පුද්ගලයින් වෙළඳාම් කිරීම' යන්නෙන් සූරාකෑමේ කාර්යය සඳහා තර්ජනය කිරීම හෝ බලය යොදා ගැනීම හෝ වෙනත් ආකාරයක බලහත්කාරකම්, පැහැරගැනීම්, වංචා කිරීම්, රැවටීම්, බලය හෝ අවදානම් තත්ත්වයක් අයුතු ලෙස යොදා ගැනීම හෝ වෙනත් පුද්ගලයෙකු පාලනය කිරීමේ බලයක් ඇති පුද්ගලයෙකුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා මුදල් හෝ වෙනත් ප්‍රතිලාභ ලබා දීම හෝ ලබා ගැනීම මාර්ගයෙන් පුද්ගලයින් බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, වෙනත් ස්ථානවලට මාරු කිරීම, නවාතැන් දීම හෝ භාර ගැනීම අදහස් කෙරෙයි. සූරාකෑම යන්නට අවම වශයෙන් අන් අයව ගණිකා වෘත්තියෙන් සූරාකෑම හෝ වෙනත් ආකාරයක ලිංගික සූරාකෑම, බලහත්කාරයෙන් ශ්‍රමය හෝ සේවා ලබා ගැනීම, වහල්භාවය හෝ වහල්භාවයට සමාන පිළිවෙත්, දාසකම හෝ අවයව ඉවත් කිරීම ඇතුළත් විය යුතු ය;

(ආ) මෙම වගන්තියේ (අ) උප ඡේදයේ දක්වා ඇති කවර හෝ ක්‍රමයක් භාවිතා කර ඇති අවස්ථාවක, අපේක්ෂිත සූරාකෑම සඳහා පුද්ගල වෙළෙඳාමක වින්දිතයෙකු වූවෙකුගේ කැමැත්ත තිබුණේද යන්න අදාළ නොවේ;

(ඇ) මෙම වගන්තියේ (අ) උප ඡේදයේ දක්වා ඇති කිසිදු ක්‍රමයක් භාවිත කර නොතිබුණ ද, සූරාකෑමේ අරමුණ සඳහා ළමයෙකු බඳවා ගැනීම, ප්‍රවාහනය, වෙනත් ස්ථානයකට මාරු කිරීම, නවාතැන් දීම හෝ භාර ගැනීම 'පුද්ගලයින් වෙළඳාම් කිරීමක්' ලෙස සලකනු ලැබේ;

(ඈ) 'ළමයා' යන්නෙන් වයස අවුරුදු දහඅටට අඩු ඕනෑම පුද්ගලයෙකු අදහස් කෙරෙයි.

**ජාත්‍යන්තර නීතිය**

- **දේශාන්තර සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය - 2000**

දේශාන්තර අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය යනු අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සකස් කරන ලද ගිවිසුම් පැකේජයක ප්‍රධානම සාධන පත්‍රය වේ. දේශාන්තර අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය වෙත අමුණා ඇතිඅමතර ගිවිසුම් පුද්ගලයන් වෙළෙඳාම් කිරීමට, සංක්‍රමණිකයන් වෙළෙඳාම් කිරීමට සහ කුඩා අවි නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීමට සහ වෙළෙඳාම් කිරීමට අදාළ වේ.

ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ වඩාත් ඵලදායී ලෙස මැඩපැවැත්වීම සඳහා අන්තර්-රාජ්‍ය සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම දේශාන්තර අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි පරමාර්ථය වේ. මූලික අවම ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ප්‍රවර්ධනය කිරීම මගින් සංවිධානාත්මක සාපරාධී ක්‍රියාකාරකම් සිදුවිය හැකි හෝ සාක්ෂි හෝ ලාභය වසන් කිරීම සිදුවිය හැකි 'ආරක්ෂිත තෝතැනි' ඉවත් කිරීමට දේශාන්තර අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය මගින් උත්සාහ කරයි.

මෙමගින් පුද්ගලයන් විසින් හෝ සංස්ථාගත ආයතන විසින් සිදු කරනු ලබන පහත සඳහන් වැරදි හතර (මෙන්ම 'බරපතල අපරාධ'නැමැති සාමාන්‍ය කාණ්ඩය) ආවරණය කරනු ලැබේ: සංවිධානාත්මක අපරාධ කණ්ඩායමකට සහභාගී වීම; මුදල් විශුද්ධිකරණය; දූෂණය; සහ නීතිය ක්‍රියාත්මක කිරීමට බාධා කිරීම. [22]

දේශාන්තර අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය අදාළකර ගැනීම සඳහා ප්‍රධාන පූර්ව අවශ්‍යතා දෙකක් තිබේ. අදාළ වරදෙහි යම් ආකාරයක අන්තර්ජාතික ස්වභාවයක් තිබිය යුතු වීම ඉන් පළමුවැන්නයි. එයට සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් සම්බන්ධ විය යුතු ය යන්න දෙවැන්නයි. මෙම අංග දෙකම ඉතා පුළුල් ලෙස අර්ථ දක්වා ඇත.[23] 'බරපතල අපරාධ' යන්න සැලකිය යුතු සාපරාධී වැරදි සියල්ල ඇතුළත්වන ආකාරයට අර්ථ දක්වා ඇත.[24] එහි ප්‍රතිඵලයක් වශයෙන්, වෙළෙඳාම් සහ ඒ ආශ්‍රිත සූරාකෑම් මෙන්ම සංක්‍රමණිකයින් වෙළඳාම් කිරීම ඇතුළු නූතන අපරාධ ක්‍රියාකාරකම් රාශියක් ආමන්ත්‍රණය කිරීමට රාජ්‍යාන්ට මෙම සම්මුතිය භාවිතා කළ හැක. මෙහි අමතර ගිවිසුම් සියල්ල හෝ ඉන් කවරක් හෝ අනුමත කිරීමකින් තොරව රාජ්‍යයන්ට සම්මුතියේ පාර්ශ්වකරුවන් බවට පත්විය හැකි බැවින් මෙය විශේෂයෙන් වැදගත් වන අතර, සම්මුතිය අනුමත කිරීම ඕනෑම අමතර ගිවිසුමක් අනුමත කිරීමට පෙර සිදු කළ යුතු ය.

සම්මුතිය යටතේ වන මූලික ම බැඳීම නිශ්චිත චර්යාවන් අපරාධකරණය කිරීමට සම්බන්ධ වේ. රාජ්‍ය පාර්ශ්ව පහත සඳහන් ක්‍රියා අපරාධකරණය කළ යුතු වේ:

- සංවිධානාත්මක අපරාධ කණ්ඩායමකට සහභාගී වීම;
- අපරාධවලින් උපයාගන්නා මුදල් විශුද්ධිකරණය කිරීම;
- රාජ්‍ය අංශයේ දූෂණය; සහ
- නීතිය ක්‍රියාත්මක කිරීමට බාධා කිරීම.

එමෙන්ම, මෙම වැරදි නිසි අනුමැතීන්ට යටත්ව කළ යුතු වේ.

පුද්ගලයින් වෙළඳාම් කිරීම ඇතුළු අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහිව ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි බලපා ඇති එක් ප්‍රතිපත්තිමය බාධාවක් වන්නේ ජාතික අපරාධ යුක්ති විනිශ්චය ආයතන අතර සන්නිවේදනය සහ සහයෝගීතාව නොමැතිකමයි. ඵලදායි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමේ සහයෝගීතාවය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්ව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මාලාවක් දේශාන්තර අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය විසින් ඉදිරිපත් කර ඇත. අදාළ වන වැරදි සම්බන්ධයෙන් විමර්ශන, නඩු පැවරීම් සහ අධිකරණ ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී අන්‍යෝන්‍ය නෛතික සහාය පිළිබඳ සවිස්තරාත්මක නීතිමය රාමුවක් ඇතුළත් කිරීම මගින් මෙම විධිවිධානවල ප්‍රායෝගික භාවිතය වැඩිදියුණු වනු ඇත.

පහත වඩාත් සවිස්තරාත්මකව විස්තර කර ඇති පරිදි, සාක්ෂි ලබා ගැනීම, අධිකරණ ලියවිලි භාර දීම, සෝදිසි කිරීම් ක්‍රියාත්මක කිරීම, අපරාධවලින් උපයාගන්නා ආදායම් හඳුනා ගැනීම සහ තොරතුරු උත්පාදනය කිරීම සහ ලේඛනගත කිරීම ඇතුළු විවිධ කාර්යයන් සඳහා අන්‍යෝන්‍ය නීති සහාය ඉල්ලා සිටීමට රාජ්‍ය පාර්ශවයන්ට මෙම සම්මුතිය භාවිතා කළ හැක. එමෙන්ම, ඒකාබද්ධ විමර්ශන ආයතන පිහිටුවීමට; විශේෂ විමර්ශන ශිල්පීය ක්‍රම භාවිතය පිළිබඳ විධිමත් එකඟතාවයකට එළඹීමට; අපරාධ නඩු කටයුතු සහ දඬුවම් නියම වූ පුද්ගලයින් මාරු කිරීම සලකා බැලීමට; සහ අදාළ වැරදි සඳහා පිටුවහල් කිරීමේ කාර්ය පටිපාටියට පහසුකම් සැලසීමටද රාජ්‍ය පාර්ශවයන් දිරිමත් කරනු ලැබේ. [31]

සංවිධානාත්මක අපරාධ සම්මුතිය ලෙසද හැඳින්වෙන එය අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහිව සටන් කිරීමේ ප්‍රධාන ජාත්‍යන්තර මෙවලම වේ. එය අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ වඩාත් ඵලදායී ලෙස වැළැක්වීම සහ මර්දනය කිරීම සඳහා රටවල් අතර සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 2000 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ඉතාලියේ පැලර්මෝ නුවරදී අත්සන් කරන ලදී. මෙම සම්මුතිය 2003 සැප්තැම්බර් 29 දින සිට බලාත්මක විය. මේ වන විට රාජ්‍ය පාර්ශ්ව 147ක් මෙම සම්මුතියට අත්සන් කර ඇති අතර,රාජ්‍යයන් 186ක් එය අපරානුමත කර ඇත.

31 පුද්ගලයින් ජාවාරම් කිරීමේ සිද්ධීන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීති සහයෝගීතාව පිළිබඳ ආසියාන් සංවිධානයේ අත්පොත, 2010, පි. 10-11, මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය.

මෙම සම්මුතියෙහි අමතර කෙටුම්පත් තුනක් ඇත:

1. පුද්ගලයන්, විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමයින් වෙළෙඳාම් කිරීම වැළැක්වීම, මර්දනය කිරීම සහ ඒවායෙහි වරදකරුවන්ට දඬුවම් කිරීම පිළිබඳ අමතර කෙටුම්පත.

2. ගොඩබිම, මුහුද සහ ගුවනින් සංක්‍රමණිකයන් වෙළෙඳාම් කිරීමට එරෙහි අමතර කෙටුම්පත.

3. ගිනි අවි, ඒවායේ කොටස් සහ සංරචක සහ පතොරම් නීතිවිරෝධී ලෙස නිෂ්පාදනය කිරීම සහ ප්‍රවාහනය කිරීමට එරෙහි අමතර කෙටුම්පත.

- **පුද්ගලයින්, විශේෂයෙන් ම කාන්තාවන් සහ ළමයින්, වෙළෙඳාම් කිරීම වැළැක්වීම, මර්දනය කිරීම සහ වෙළෙඳාම් කරුවන්ට දඬුවම් දීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ගිවිසුම 2000**

එක්සත් ජාතීන්ගේ මෙම ගිවිසුම මගින් මිනිස් වෙළෙඳාම පිළිබඳ වඩාත් පරිපූර්ණ සහ පුළුල් ලෙස පිළිගත් නිර්වචනයක් සපයා දෙන අතර, එයින් වෙළෙඳාම් වැළැක්වීමට, වින්දිතයන් ආරක්ෂා කිරීමට සහ අපරාධකරුවන්ට නඩු පැවරීමට රාජ්‍යයන් විසින් පියවර ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන සලසා ඇත.

(ආ) මෙම වගන්තියේ (අ) උප ඡේදයේ දක්වා ඇති කවර හෝ ක්‍රමයක් භාවිතා කර ඇති අවස්ථාවක, අපේක්ෂිත සූරාකෑම සඳහා පුද්ගල වෙළෙඳාමක වින්දිතයෙකු වූවෙකුගේ කැමැත්ත තිබුණේද යන්න අදාළ නොවේ;

(ඇ) මෙම වගන්තියේ (අ) උප ඡේදයේ දක්වා ඇති කිසිදු ක්‍රමයක් භාවිතා කර නොතිබුණද, සූරාකෑමේ අරමුණ සඳහා ළමයෙකු බඳවා ගැනීම, ප්‍රවාහනය, වෙනත් ස්ථානයකට මාරු කිරීම, නවාතැන් දීම හෝ භාර ගැනීම 'පුද්ගලයින් වෙළඳාම් කිරීමක්' ලෙස සලකනු ලැබේ;

**"ළමයා"** යන්නෙන් වයස අවුරුදු දහඅටට අඩු ඕනෑම පුද්ගලයෙකු අදහස් වේ.

- **ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 1989**

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මගින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ (1948) ප්‍රකාශ කර ඇති'ළමයින්ට විශේෂ රැකවරණය සහ සහාය ලැබීමට හිමිකම තිබිය යුතුය'යන අවබෝධය නැවත අවධාරණය කරයි. එමෙන්ම, සම්මුතියේ දක්වා ඇති පරිදි, "ළමයාගේ කායික සහ මානසික නොමේරූ බව හේතුවෙන්, ළමයාට උපතට පෙර මෙන්ම පසුවද, සුදුසු නෛතික ආරක්ෂාව ඇතුළුව විශේෂ ආරක්ෂාව සහ රැකවරණය අවශ්‍ය වේ".

තවද, ළමයාගේ පූර්ණ සහ සුසංයෝගී පෞරුෂ වර්ධනය සඳහා, ළමයා පවුල් පරිසරයක, සතුට, ආදරය සහ අවබෝධය සහිත වාතාවරණයක් තුළ හැදී වැඩිය යුතු බව එමගින් වැඩිදුරටත් පිළිගනියි. එබැවින්, සමාජයේ මූලික කණ්ඩායමක් වන සහ එහි සියලු සාමාජිකයින්ගේ, සහ විශේෂයෙන් ළමයින්ගේ, වර්ධනය සහ යහපැවැත්ම සඳහා ස්වභාවික පරිසරයක් වන පවුලට ප්‍රජාව තුළ ස්වකීය වගකීම් සම්පූර්ණයෙන් භාර ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය ආරක්ෂාව සහ සහාය සපයා දිය යුතු ය.

මෙම සම්මුතිය මගින් ඉහත කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ළමයෙකු සතු වන මූලික අයිතිවාසිකම් මොනවාද යන්න දක්වා ඇති අතර,ළමයින් සමග කටයුතු කිරීම සම්බන්ධයෙන් වඩාත් විශ්වීය වශයෙන් පිළිගත් ප්‍රමිතීන් සහ පදනම ද දක්වා ඇත.

- **ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ ළමයින් විකිණීම, ළමයින් ගණිකා වෘත්තියේ යෙදවීම සහ ළමයින් සම්බන්ධ අසභ්‍ය ද්‍රව්‍ය පිළිබඳ අමතර කෙටුම්පත 2000**

ළමයින් විකිණීම පිළිබඳ අමතර කෙටුම්පත මගින් ලිංගික සූරාකෑමට එරෙහිව ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ ඇති විධිවිධාන ශක්තිමත් කරයි. මෙම ගිවිසුම යටතේ, වයස අවුරුදු 18 ට අඩු ළමයින් සියලුම ආකාරයේ ලිංගික සූරාකෑම් වලින් ආරක්ෂා කිරීමට, ළමයින් විකිණීම, ළමා ගණිකා වෘත්තිය සහ ළමා කාමුක දර්ශන සම්බන්ධ සියලුම ක්‍රියා අපරාධකරණය කිරීමට සහ ළමා වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට රාජ්‍ය පාර්ශවයන් බැඳී සිටිති.ලිංගික අනුමැතියේ නීත්‍යානුකූල වයස නොතකා, ලිංගික සූරාකෑමට ලක් වූ ළමයෙකු අපරාධකරුවෙකු ලෙස නොවන වින්දිතයෙකු ලෙස සැලකිය යුතු ය.

ළමයින් විකිණීම පිළිබඳ අමතර කෙටුම්පතමගින් එහි විධිවිධානවලට අනුකූලව පහත සඳහන් ක්‍රියාමාර්ග ද ඇතුළු ජාතික නීති සම්මත කර ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටියි :-

- ළමයින් විකිණීම, ළමා ගණිකා වෘත්තිය සහ ළමා කාමුක දර්ශන සම්බන්ධ ක්‍රියා අපරාධකරණය කිරීම.
- ළමයින් විකිණීම පිළිබඳ අමතර කෙටුම්පත මගින් ආවරණය වන වැරදි සම්බන්ධයෙන් දේශ සීමා වලින් පිටත අධිකරණ බලයන් ස්ථාපනය කිරීම සහ ද්විත්ව අපරාධකරණ නියමයන් අහෝසි කිරීම.
- ළමයින් විකිණීම පිළිබඳ අමතර කෙටුම්පත මගින් ආවරණය වන වැරදි උද්ර්පනීය වැරදි බවට සහතික කිරීම.
- නීත්‍යානුකූල පුද්ගලයින් වගකීමට බැඳී සිටින බව සහතික කිරීම.
- අපරාධ යුක්ති ක්‍රියාවලියේ සෑම අදියරකදීම වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අදහස්, අවශ්‍යතා සහ කනස්සලු සැලකිල්ලට ගනිමින්, ඔවුන්ගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව ඇතුළුව හිමිකම් සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- ළමයින්ගේ අයිතිවාසිකම්, උපරිම යහපත සහ අදාළ තීරණ ගැනීමේ දී සහ කාර්ය පටිපාටියවල දී ඔවුන්ගේ සහභාගීත්වය ආරක්ෂා කිරීම, සහ වින්දිත ළමයින්ට සුවපත් වීමට, නැවත සමාජගත වීමට සහ වන්දි ලැබීමට ඇති අයිතිය ඇතුළුව සුදුසු සහාය ලැබීම සඳහා අයිතිවාසිකම් සහතික කිරීම.
- ළමයින් විකිණීම පිළිබඳ අමතර කෙටුම්පත මගින් ආවරණය වන වැරදි වැළැක්වීමට සහ ඒවා ආමන්ත්‍රණය කිරීමට ළමයින් සමග සහ ළමයින් වෙනුවෙන් කටයුතු කරන වෘත්තිකයන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම.
- ළමයින් විකිණීම පිළිබඳ අමතර කෙටුම්පතෙහි සඳහන් වන වැරදි වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ එම වැරදිවල හානිකර බලපෑම් පිළිබඳ තොරතුරු, අධ්‍යාපනය සහ පුහුණුව තුළින් ළමයින් ඇතුළුව පුළුල් වශයෙන් මහජනතාව දැනුවත් කිරීම.
- ළමයින් විකිණීම පිළිබඳ අමතර කෙටුම්පත ක්‍රියාත්මක කිරීම සඳහා දේශාන්තර සහ ජාත්‍යන්තර සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය සහාය ප්‍රවර්ධනය කිරීම.
- ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවට වාර්තා කිරීම සඳහා සහ කමිටුවේ අවසාන නිරීක්ෂණවලට සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ විධි නියෝග දරන්නන්ගේ නිර්දේශවලට අදාළ පසු විපරම් කිරීම සඳහා ගරු කිරීමට රාජ්‍ය පාර්ශ්වයන්ට ඇති වගකීම ප්‍රවර්ධනය කිරීම.

**• ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ සන්නද්ධ ගැටුම්වලට ළමයින් සම්බන්ධ කිරීම පිළිබඳ අමතර කෙටුම්පත 2000**

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ සන්නද්ධ ගැටුම්වලට ළමයින් සම්බන්ධ කිරීම පිළිබඳ අමතර කෙටුම්පත මගින් ළමයින්ව බඳවා ගැනීමෙන් සහ එදිරිවාදිකම් වලදී භාවිතා කරනු ලැබීමෙන් ළමයින්ව ආරක්ෂා කිරීමට අරමුණු කරයි.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2000 මැයි මස 25 වෙනි දින මෙම අමතර කෙටුම්පත සම්මත කරන ලද අතර, 2002 පෙබරවාරි 12 දින සිට බලාත්මක විය.

**මෙම අමතර කෙටුම්පත පහත සඳහන් දේ සිදු කරන බවට වන පොරොන්දුවක් වේ:**

- රාජ්‍යයන් විසින් යුද බිමට යැවීම සඳහා වයස අවුරුදු 18ට අඩු ළමයින් බඳවා නොගනියි.
- රාජ්‍යයන් වයස අවුරුදු 18 ට අඩු ළමයින් අනිවාර්යයෙන් සොල්දාදුවන් ලෙස බඳවා නොගනියි.
- අවුරුදු 18ට අඩු ළමයින් බඳවා ගැනීම සහ එදිරිවාදිකම් වලට ඔවුන්ව යොදා ගැනීම තහනම් කිරීමට සහ අපරාධකරණය කිරීමට නීති සම්පාදනය කිරීම ඇතුළුව එවැනි බඳවා ගැනීම් වැලැක්වීම සඳහා රාජ්‍යයන් විසින් ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගත යුතු ය.
- අවුරුදු 18 ට අඩු, බලහත්කාරයෙන් බඳවාගෙන ඇති හෝ එදිරිවාදිකම් සඳහා යොදාගෙන ඇති ඕනෑම අයෙකු රාජ්‍යයන් විසින් ඉන් ඉවත් කරනු ලැබිය යුතු අතර ඔවුන් කායික සහ මානසික වශයෙන් සුවපත් කිරීමේ සේවා සපයා දෙමින් ඔවුන්ව නැවත සමාජගත කිරීමට කටයුතු කළ යුතු ය.
- රටක සන්නද්ධ හමුදාවන්ට වඩා වෙනස් වූ සන්නද්ධ කණ්ඩායම් විසින් කවර තත්වයක් යටතේ හෝ වයස අවුරුදු 18 ට අඩු කිසිවෙකු බඳවා ගැනීම හෝ එදිරිවාදිකම් සඳහා යොදා ගැනීම නොකළ යුතු ය.

**ලෝක කම්කරු සංවිධානයේ අංක 182 දරන ළමා ශ්‍රමයෙහි වඩාත්ම අනර්ථකාරී ස්වරූපයන් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය**

'ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූප පිළිබඳ සම්මුතිය' යනුවෙන් කෙටියෙන් හඳුන්වනු ලබන ළමා ශ්‍රමයේ වඩාත්ම අනර්ථකාරී ස්වරූපයන් තහනම් කිරීම සහතුරන් කිරීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ සම්මුතිය ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් 1999 වර්ෂයේ දී ලෝක කම්කරු සංවිධානයේ අංක 182 දරන සම්මුතිය ලෙස සම්මත කරගන්නා ලදී.

අංක 182 දරන මෙම සම්මුතිය අපරානුමත කිරීම මගින් රාජ්‍යයන් ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූප තහනම් කිරීම සහ තුරන් කිරීම සඳහා කඩිනම් පියවර ගැනීමට පොරොන්දු වෙයි.

3 වෙනි වගන්තිය - "ළමා ශ්‍රමයේ වඩාත්ම අනර්ථකාරී ස්වරූප" පහත සඳහන් ආකාරයට අර්ථ දක්වයි:

(අ) සන්නද්ධ ගැටුම් සඳහා ළමයින් බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් බඳවා ගැනීම ඇතුළුව, ළමයින් විකිණීම සහ වෙළෙඳාම් කිරීම, ණය දාසභාවය සහ වහල් මෙහෙය සහ බලහත්කාරයෙන් හෝ අනිවාර්ය ශ්‍රමය ලබා ගැනීම වැනි වහල්කමට සමාන සියලු ආකාරයේ වහල්භාවයන් හෝ භාවිතයන්;
(ආ) ගණිකා වෘත්තිය සඳහා, අසභ්‍ය දර්ශන නිෂ්පාදනය සඳහා හෝ අසභ්‍ය දර්ශනවල රඟපෑම සඳහා ළමයෙකු යොදා ගැනීම, ප්‍රසම්පාදනය කිරීම හෝ සපයා දීමට ඉදිරිපත්වීම;
(ඇ) නීති විරෝධී ක්‍රියාකාරකම් සඳහා,විශේෂයෙන්ම අදාළ ජාත්‍යන්තර ගිවිසුම්වල අර්ථ දක්වා ඇති පරිදි මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ ප්‍රවාහනය සඳහා ළමයෙකු භාවිතා කිරීම, ප්‍රසම්පාදනය කිරීම හෝ සපයා දීමට ඉදිරිපත්වීම;
(ඈ) යම් කාර්යයක ස්වභාවය හෝ එය සිදු කරන වාතාවරණයන් අනුව, ළමයින්ගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සදාචාරයට හානිකර විය හැකි කාර්යයන්.

**• අවම වයස පිළිබඳ ලෝක කම්කරු සංවිධානයේ 1973 සම්මුතිය (C138)**
මෙම සම්මුතිය මගින් රැකියාවට හෝ වැඩකිරීම ඇතුළත් කර ගත හැකි සාමාන්‍ය අවම වයස අවුරුදු 15 ලෙස (සැහැල්ලු වැඩ සඳහා අවුරුදු 13 ලෙස) සහ අන්තරායකර වැඩ සඳහා අවම වයස අවුරුදු 18 ලෙස (දැඩි කොන්දේසි යටතේ අවුරුදු 16 ලෙස) නියම කර තිබේ.

ජාතික නීති හෝ නියමයන් මගින් වයස අවුරුදු 13 සිට 15 දක්වා වන පුද්ගලයින් පහත සඳහන් ස්වභාවයේ සැහැල්ලු වැඩ සඳහා රැකියාව හෝ වැඩ කිරීමට යෙදවීම සඳහා අවසර දිය හැකි බව මෙම සම්මුතියේ 7 වෙනි වගන්තිය මගින් නියම කර තිබේ:

(අ) ඔවුන්ගේ සෞඛ්‍යයට හෝ සංවර්ධනයට හානිකර නොවන; සහ
(ආ) ඔවුන් පාසල් යාමට, නිසි බලධාරියා විසින් අනුමත කර ඇති වෘත්තීය හැඩගැස්වීමේ හෝ පුහුණු වැඩසටහන් සඳහා ඔවුන්ගේ සහභාගීත්වයට හෝ ලැබෙන උපදෙස්වලින් ප්‍රයෝජන ගැනීමට ඇති හැකියාවට අගතියක් සිදු නොකරන වැඩ.

**• රටවල් අතර ළමයින් දරුකමට හදා ගැනීම සම්බන්ධයෙන් ළමයින්ගේ ආරක්ෂාව සහ සහයෝගීතාවය පිළිබඳ හේග් සම්මුතිය 1993**

2001 සැප්තැම්බර් 27 වැනි දින නව සාමාජික රාජ්‍යයක් ලෙස පිළිගනු ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාව හේග් සමුළුවේ ප්‍රඥප්තිය පිළිගෙන, එම සංවිධානයේ 55 වැනි සාමාජික රාජ්‍යය බවට පත් විය.

දැනට රාජ්‍යයන් 89 ක (ළමයින් භාර ගන්නා ප්‍රධාන රාජ්‍යයන් සියල්ලෙහි ද ඇතුළුව) බලාත්මක වන 1993 හේග් සම්මුතිය, රටවල් අතර ළමයින් දරුකමට හදා ගැනීම නියාමනය කරන සහ ළමයින් දරුකමට හදා ගැනීමේ ක්‍රියාවලියට පෙර සහ ඒ අතරතුර ළමයින් සහ පවුල් ආරක්ෂා කරන ජාත්‍යන්තර නීති රාමුව ලෙස පිළිගනු ලැබේ.මෙම සම්මුතිය විසින් දරුකමට හදාගත හැකි ළමයින් පැහැර ගැනීම, විකිණීම, හෝ වෙළෙඳාම් කිරීම වැළැක්වීම සඳහා ආරක්ෂාවන් ස්ථාපනය කරන අතර,ළමයා උපන් රාජ්‍යයේ පවුලක් සමග තැබිය නොහැකි ළමයින් සඳහා ආරක්ෂක කාර්ය පටිපාටිය සහතික කිරීම පිණිස ජාත්‍යන්තර ප්‍රමිතීන් සපයා දෙයි. එම ආරක්ෂණ වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- ළමයා සැබවින්ම දරුකමට හදා ගත හැකි බවත්, දරුකමට හදා ගැනීම ළමයා සඳහා ඇති හොඳම විසඳුම බවත් සහතික කිරීම;
- ජීව විද්‍යාත්මක දෙමව්පියන් උපදේශනය ලබා ගැනීමෙන් පසුව සහ තමන්ගේ තීරණයේ ප්‍රතිඵල පිළිබඳව නිසි පරිදි දැනුවත් කරනු ලැබීමෙන් පසුව, කිසිදු ආකාරයක ගෙවීමක් හෝ වන්දියක් ලබා නොගෙන ඔවුන්ගේ ළමයා දරුකමට හදා ගැනීම සඳහා ලබා දීමට නිදහසේ ඔවුන්ගේ කැමැත්ත ලබා දී ඇති බව සහතික කිරීම;
- ළමයා සහ ළමයාගේ ජීව විද්‍යාත්මක දෙමව්පියන් පිළිබඳ තොරතුරු සංරක්ෂණය කිරීම;
- ළමයා දරුකමට හදා ගැනීමට අපේක්ෂා කරන දෙමව්පියන්ගේ සුදුසුකම් සහ යෝග්‍ය බව ඇගයීම;
- ළමයා සුදුසු පවුලක් සමග ගැළපීම;
- මධ්‍යම අධිකාරීන්, අධිකරණ සහ පරිපාලන අධිකාරීන් ඇතුළු රාජ්‍ය අධිකාරීන් සහ ප්‍රතීතනය ලත් ආයතන වැනි නිසි බලධාරීන් හරහා පමණක් දරුකමට හදා ගැනීම් ක්‍රියාවලි ගත කිරීම;
- 1993 හේග් සම්මුතියෙහි නීතිවලට අනුව බලයලත්, දරුකමට හදා ගැනීම සඳහා ප්‍රතීතනය ලත් ආයතන සමග කටයුතු කිරීම; සහ
- අනිසි මූල්‍ය ලාභ වැළැක්වීම සඳහා කාර්ය පටිපාටිය ස්ථාපනය කිරීම.

**මෙයට අමතරව, 1993 හේග් සම්මුතිය පහත දේ කිරීමට රාජ්‍ය පාර්ශවයන්ට අවසර දෙයි:**

- ඔවුන්ගේ සම්මුතියේ හවුල්කාර රාජ්‍ය පාර්ශවයන් මත ඉහළ ප්‍රමිතීන් හෝ නියමයන් පැනවීම;
- මූලාශ්‍ර රාජ්‍යවලට පීඩනයක් එල්ලවීම වැළැක්වීම සඳහා, දරුකමට හදා ගැනීමට අවශ්‍ය සැබෑ ළමයින් සංඛ්‍යාව අනුව තීරණය කරනු ලබන,රාජ්‍යයන් සහ පිළිගත් ආයතන සීමිත සංඛ්‍යාවක් සමග පමණක් කටයුතු කිරීමට තීරණය කිරීම මගින් දරුකමට හදාගැනීම් සංඛ්‍යාව පාලනය කිරීම;
- ළමයින් භාර ගන්නා රාජ්‍යයක් සම්මුතියට හෝ මූලාශ්‍ර රාජ්‍යයක නියමයන්ට අනුකූල නොවන්නේ නම් සහයෝගීතාවය අත්හිටුවීමට හෝ අවසන් කිරීමට තීරණය කිරීම; සහ
- ප්‍රතීතනය ලත් ආයතනවල ක්‍රියාකාරකම් සඳහා අවසර දීම හෝ නොදීම. [32]

**ශ්‍රී ලාංකීය නීතිය**

**• 2006 අංක 16 දරන ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත**

ශ්‍රී ලංකා රජය පුද්ගලයින් වෙළෙඳාම් කිරීම පිළිබඳ ගිවිසුමෙහි 'පුද්ගල වෙළෙඳාම ' යන්නෙහි නිර්වචනයට අනුකූල වන පරිදි 2006 වර්ෂයේ දී දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධන හඳුන්වා දුන්නේය.මෙම සංශෝධන පනත මගින් ප්‍රධාන වශයෙන් ම පුද්ගලයින් වෙළෙඳාම් කිරීම පිළිබඳ ගිවිසුමෙහි 'පුද්ගල වෙළෙඳාම' යන්නෙහි නිර්වචනයට අනුකූලව වන පරිදි පුද්ගලයින් වෙළඳාම් කිරීම පිළිබඳ වරද විස්තීර්ණ ලෙස නිර්වචනය කර ඇත.

**• 360(ඇ)(1) වෙනි වගන්තිය**

360(ඇ)(1) වගන්තිය මගින් සංක්ෂිප්ත ස්වරූපයකින් නිශ්චිත ලෙස පහත සඳහන් ක්‍රියා අපරාධකරණය කරයි:

(අ) මුදල් හෝ වෙනත් ප්‍රතිශ්‍යාවක් සඳහා යම් තැනැත්තකු මිලදී ගැනීම, විකිණීම, හුවමාරු කිරීම හෝ මිලදී ගැනීමට, විකිණීමට හෝ හුවමාරු කිරීමට වෙනත් තැනැත්තකු පෙළඹවීම.

(ආ) බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම හෝ සේවය ලබා ගැනීමේ, වහල් භාවයේ යෙදවීමේ, පරවශතාවයේ, ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ යෙදවීමේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා යොදා ගැනීමේ කාර්ය සඳහා තර්ජනය කිරීමෙන්, බලහත්කාරයෙන්, වංචාවෙන්, රැවටීමෙන්, පෙළඹ වීමෙන් හෝ වෙනත් තැනැත්තකුගේ පීඩාකාරී තත්ත්වයකින් අයුතු ප්‍රයෝජන ගැනීමෙන් යම් තැනැත්තකු බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, ස්ථානමාරු කිරීම, ආරක්ෂාව සලසා දීම, භාර ගැනීම; සහ

(ඇ) එකී සූරාකෑමේ කාර්යයන් සඳහා <u>ළමයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව</u> ළමයා බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, ස්ථානමාරු කිරීම, ආරක්ෂාව සලසා දීම, භාර ගැනීම හෝ වෙන යම් ක්‍රියාවක්,

ඉහත සාකච්ඡා කළ පරිදි, දණ්ඩ නීති සංග්‍රහයෙහි 'ළමා වෙළෙඳාම ' යන්න ජාත්‍යන්තර ගිවිසුමෙහි නිර්වචනයට අනුව අර්ථ දක්වා ඇත;

- 360(ඇ)(1)(ඇ) වෙනි වගන්තිය

"යම් ළමයකුගෙන් බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීමේ හෝ සේවය ලබා ගැනීමේ, එම ළමයා වහල් භාවයේ යෙදවීමේ පරවශතාවය හෝ ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ කාර්ය සඳහා හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා එම ළමයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව එම ළමයා සේවයට බඳවා ගන්නා. ප්‍රවාහනය කරන, මාරු කරන එම ළමයාට ආරක්ෂාව සලසා දෙන හෝ ළමයා භාර ගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදු කරන කවර හෝ තැනැත්තකු"

- 360(ඇ)(2) වෙනි වගන්තිය

"ළමයා" යන්නෙන් වයස අවුරුදු දහඅටට අඩු පුද්ගලයෙක් අදහස් වන්නේය යනුවෙන් විධිවිධාන සලසයි.

- 360(ඇ)(1)(ඇ) වෙනි වගන්තිය

මෙම වගන්තියට අනුව, වින්දිතයා ළමයෙක් වන්නේ නම්,වෙළෙඳාම් කිරීමේ 'ක්‍රමය' ඔප්පු කිරීමට අවශ්‍ය නොවේ. පුද්ගලයා වයස අවුරුදු දහඅටට අඩු වූ විට, සූරාකෑමේ 'ක්‍රියාව' සහ 'අරමුණ' ඔප්පු කිරීම පමණක් අවශ්‍ය වේ.

32 රටවල් අතර ළමයින් දරුකමට හදා ගැනීම සම්බන්ධයෙන් ළමයින්ගේ ආරක්ෂාව සහ සහයෝගීතාවය පිළිබඳ හේග් සම්මුතිය 1993, තොරතුරු පත්‍රිකාව, පුද්ගලික ජාත්‍යන්තර නීතිය පිළිබඳ හේග් සමුළුව, ස්ථිර කාර්යංශය, 2012

- 360(ඇ)(2) වෙනි වගන්තිය

තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ වරද සිදු කරන යම් තැනැත්තෙක් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය හැකි ය; තවද ළමයකු සම්බන්ධයෙන් එම වරද සිදු කරනු ලබන අවස්ථාවක. එම තැනැත්තාට අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය හැකි ය.

**ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයෙහි දක්වා ඇති අනෙකුත් වැරදි**

- 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

ප්‍රධාන ප්‍රඥප්තියේ 360(අ) වෙනි වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම
ප්‍රධාන ප්‍රඥප්තියේ 360(අ) වෙනි වගන්තිය අහෝසි කර, ඒ වෙනුවට කුට්ටනය කිරීමේ වරද සම්බන්ධයෙන් වන පහත සඳහන් වගන්තිය ආදේශ කරන ලදී.

- 360(අ) වෙනි වගන්තිය: කුට්ටනය

(1) කවර වුවද වයසක සිටින පුරුෂ හෝ ස්ත්‍රී යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ගණිකාවක් බවට පත් කිරීමට කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන;

(2) ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු සමග අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදීම අරමුණු කොට ගෙන වයස අවුරුදු දහසයට අඩු තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාව හැර යාමට කුට්ටනය කිරීම හෝ කුට්ටනය කිරීමට තැත් කරන හෝ, එකී කාර්යය සඳහා එවැනි යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාවෙන් ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන;

(3) කවර වුවද වයසක සිටින යම් තැනැත්තකු අන්‍ය දේශයක ගණිකා නිවාසයක නේවාසිකයකු හෝ ගණිකා නිවාසයක ගැවසෙන්නෙකු බවට පත් කිරීමේ චේතනාවෙන් (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ඒ තැනැත්තාට ශ්‍රී ලංකාව හැර යාමට කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන හෝ ඒ කාර්යය සඳහා එවැනි යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාවෙන් ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන;

(4) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු සමග අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදීම අරමුණු කොට ගෙන වයස අවුරුදු දහසයට අඩු යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ගෙන එන හෝ ගෙන ඒමට තැත් කරන;

(5) ගණිකා වෘත්තිය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ ගණිකා නිවාසයක නේවාසිකයකු හෝ ගණිකා නිවාසයක ගැවසෙන්නකු බවට පත් කිරීමේ චේතනාවෙන් කවර වුව ද වයසක සිටින යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාවේ ඒ තැනැත්තාගේ (ගණිකා නිවාසයක් නොවූ) සුපුරුදු වාසස්ථානය අතහැර යාමට කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන;

(6) යම් තැනැත්තකු අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ ලිංගික අපචාරයකට පාත්‍ර කිරීම අරමුණු කොට ගෙන ඒ තැනැත්තාගේ කැමැත්ත නොමැතිව යම් ගණිකා නිවාසයක රඳවා තබා ගන්නා.

යම් තැනැත්තකු "කුට්ටනය" කිරීමේ වරද සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේ අවුරුදු දෙකකට නොඅඩු වූද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් ඒ තැනැත්තාට දඬුවම් කළ යුතුය. තවද දඩයකින් ද ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය හැකිය.

- 360(ආ) වෙනි වගන්තිය: ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම

(අ) යම් ළමයකු ලිංගික අපයෝජනයට පාත්‍ර කිරීමේ කාර්යය සඳහා හෝ කවර වුව ද ආකාරයක ලිංගික ක්‍රියාවකට හෝ යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයකට නැතහොත් දර්ශනයකට ළමයකු සහභාගි කරවා ගැනීම සඳහා යම් පරිශ්‍රයක රැඳී සිටීමට දැන දැනම ඒ ළමයාට ඉඩ දෙන;

(ආ) ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වුවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයකු කුට්ටනය කරන්නකු වශයෙන් ක්‍රියා කරන;

(ඇ) මුද්‍රණ මාර්ගයෙන් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයකින් හෝ වාචිකව කරනු ලබන ප්‍රචාරක දැන්වීම් මගින් හෝ වෙනත් සමාන මාර්ගයකින් ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වුව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයකුගේ සේවාදායකයකු වීමට, යම් තැනැත්තකු පොළඹවන;

(ඇ)ළමයකු කෙරෙහි තමා දරන වගකීම, බලපෑම හෝ ළමයකු විෂයයෙහි තමාට ඇති ඥාති සම්බන්ධතාව ඒ ළමයා ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ කවර වුව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා කුට්ටනය කිරීම පිණිස ප්‍රයෝජනයට ගන්නා;

(ඉ) ළමයකු ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ කවර වුවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා ඒ ළමයා කුට්ටනය කිරීම පිණිස ඒ ළමයාට තර්ජනය කරන හෝ සාහසිකත්වය පාන;

(ඊ) යම් ළමයකු ලිංගික සංසර්ගයෙහි යෙදවීමේ හෝ කවර වුව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා වූ චේතනාවෙන් යුතුව ඒ ළමයාට හෝ ඔහුගේ දෙමව්පියන්ට මුදලින් ප්‍රතිෂ්ඨාවක්. භාණ්ඩ හෝ වෙනත් ප්‍රතිලාභ ලබා දෙන

කවර හෝ තැනැත්තකු ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වරද සිදු කරනු ලබන අතර ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහකට නොඅඩු වූද අවුරුදු විස්සත් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු ය. තව ද දඩයකින් ද ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය හැකිය.

(2) මේ වගන්තියේ “ළමයා” යන්නෙන් වයස අවුරුදු දහ අටකට අඩු තැනැත්තෙක් අදහස් වේ.

**1998 අංක 29 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත**

- 288 වෙනි වගන්තිය: ළමයින්ට සිඟාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම
  (1) සිඟා කෑමේ හෝ දන් ලැබීමේ හෝ දන්දීමට පෙළඹවීමේ කාර්යය සඳහා (යම් සිංදු කීමේ, ක්‍රීඩා කිරීමේ, රංගනයේ යෙදීමේ, යම් දෙයක් විකිණීමට ඉදිරිපත් කිරීමේ හෝ වෙනත් ආකාරයක ව්‍යාජයක් ඇතත් නැතත්) යම් වීදියක, ස්ථානයක හෝ තැනක සිටීමට ළමයකුට සලස්වන හෝ කුට්ටනය කරන කවර හෝ තැනැත්තෙක් වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකට ද යටත් විය යුතුය.

  (2) මේ වගන්තියේ ”ළමයා” යන්නෙන් වයස අවුරුදු දහ අටකට අඩු තැනැත්තෙක් අදහස් වේ.

- 288(අ) වෙනි වගන්තිය: ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියකු වශයෙන් ක්‍රියාකිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම
  (1) නීති විරෝධී ලිංගික සංසර්ගය සඳහා යම් තැනැත්තකු කුට්ටනය කිරීමට දැන දැනම ළමයකු කුලියට ගන්නා, සේවයේ යොදවන, කැමති කරවා ගනු ලබන, යොදවන, පොළඹවන හෝ එම ළමයාට බල කරන කවර හෝ තැනැත්තෙක් වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකට ද යටත් විය යුතු ය.

  (2) මේ වගන්තියේ “ළමයා” යන්නෙන් වයස අවුරුදු දහ අටකට අඩු තැනැත්තෙක් අදහස් වේ.

- 288(ආ) සීමිත භාණ්ඩ වෙළෙඳාම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම

  (1) යම් සීමිත භාණ්ඩයක් වෙළෙඳාම් කිරීමට දැන දැනම ළමයකු කුලියට ගන්නා, සේවයේ යොදවා ගන්න, කැමති කරවා ගන්නා, පොළඹවන, යොදවන හෝ එම ළමයාට බල කරන කවර හෝ තැනැත්තෙක් වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු හතකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකට ද යටත් විය යුතුය.

  (2) මේ වගන්තියේ “ළමයා” යන්නෙන් වයස අවුරුදු දහ අටකට අඩු තැනැත්තෙක් අදහස් වේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 360(අ) වෙනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:**

(1) එම වගන්තියේ (5) වන උපවගන්තියේ "ශ්‍රී ලංකාවේ ඒ තැනැත්තාගේ සුපුරුදු වාසස්ථානය හැර යාමට" යන කොටසේ සිට එම ඡේදය අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:

(2) එම වගන්තියේ (6) වන උපවගන්තියේ "නීති විරෝධී ලිංගික සංසර්ගයේ යෙදීමේ හෝ ලිංගික අපයෝජනය සිදු කිරීමේ චේතනාවෙන් කිසියම් ගණිකා නිවාසයක" යන වචන ඉවත් කර ඒ වෙනුවට "නීති විරෝධී ලිංගික සංසර්ගයේ යෙදීමේ හෝ ලිංගික අපයෝජනය සිදු කිරීමේ චේතනාවෙන් ඕනෑම පරිශ්‍රයක" යන වචන ආදේශ කිරීමෙන්.

**1999 අංක 32 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත**

- 163(අ) වෙනි වගන්තිය - වීඩියෝ පටිගත කිරීම
  163(අ) යනුවෙන් නව වගන්තියක් ඇතුළත් කිරීම මගින් ළමා අපචාරවලට අදාළ වරදක් සම්බන්ධ අධිකරණ කටයුතු වලදී වීඩියෝ පටිගත කිරීම් පිළිගැනීම හඳුන්වා දෙන ලදී. තවද, මෙම වගන්තිය යටතේ, සාක්ෂි වශයෙන් ලබා දී ඇති ළමා සාක්ෂිකරු විසින් කරන ලද ප්‍රකාශයේ ඕනෑම වීඩියෝ පටිගත කිරීමක්, සහ එම වීඩියෝ පටයේ හෙළිදරව් කර ඇති කරුණු ළමා සාක්ෂිකරු විසින් ලබා දී ඇති ඔහුගේ/ඇයගේ ඍජු වාචික සාක්ෂි ලෙස සලකනු ලැබේ.

  මෙම වගන්තිය යටතේ 'ළමා අපයෝජනයට අදාළ වරදක්' යන්නෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 286(අ), 308(අ), 360(අ), 360(ආ),360(ඇ), 363, 364(අ), 365, 365(අ), හෝ 365(ආ) යටතේ ළමයෙකු සම්බන්ධයෙන් සිදු කරන ලද වරදක් අදහස් කෙරෙයි;

  **"ළමයෙකු"** යනු මූලික සම්මුඛ සාකච්ඡාව වීඩියෝ පටිගත කරන අවස්ථාව වන විට වයස අවුරුදු දහඅටට අඩු පුද්ගලයෙක් අදහස් කෙරෙයි.

  **"වීඩියෝ පටිගත කිරීමක්"** යන්නෙන් චලනය වන රූපයක් ඕනෑම ආකාරයකින් නිපදවිය හැකි සහ ඒ සමග ඇති ශබ්ද පථය ඇතුළත් වන ඕනෑම මාධ්‍යයක පටිගත කිරීමක් අදහස් කෙරෙයි.

**1998 අංක 28 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය (සංශෝධන) පනත**

- **V වෙනි කොටස: වැරදි විමර්ශනය කිරීම**

ප්‍රධාන පනතේ 2 වෙනි වගන්තිය සංශෝධනය කර ඇති අතර 'ළමා අපයෝජනය' පිළිබඳ පහත දී ඇති අර්ථ දැක්වීම ඇතුළත් කර ඇත;

**"ළමා අපයෝජනය"** යන්නෙන් පහත සඳහන් කවර හෝ වගන්තියක ඇති විධිවිධානයකට පටහැනි වන, ළමයෙකු සම්බන්ධයෙන් වන ඕනෑම ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අදහස් කෙරෙයි.

- (අ)දණ්ඩ නීති සංග්‍රහයේ 286(අ), 288, 288(අ), 288(ආ), 308(අ). 360(අ), 360(ආ), 360(ඇ), 363, 364(අ), 365, 365(අ), හෝ 365(ආ);
- (ආ)ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත;
- (ඇ)ළමයින් හා තරුණ තැනැත්තන් ආඥාපනත; හෝ
- (ඈ) අධ්‍යාපන ආඥාපනත යටතේ සාදන ලද අනිවාර්ය අධ්‍යාපනයට අදාළ නියෝග, සහ ළමයාගේ ජීවිතයට අනතුරක් විය හැකි හෝ ළමයාට කායිකව හෝ චිත්තවේගීය වශයෙන් හානියක් සිදුවීමට ඉඩ ඇති සන්නද්ධ ගැටුමකට ළමයකු සම්බන්ධ කර ගැනීම ද එයට ඇතුළත් වේ.

- 2021 අංක 01 දරන අන්තරායකර වෘත්තීන් පිළිබඳ නියෝග (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රය*, අංක 2254/35)
- 2021 අංක 2 ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ (සංශෝධන) පනත

**ඇමුණුම 4 - මහජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිණිස නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් සඳහා වන ශ්‍රේෂ්ඨාධිකරණයේ මාර්ගෝපදේශ (ශ්‍රේෂ්ඨාධිකරණය (මූ.අ.) අයදුම අංක 677/2012 - 11/06/2019)**

1. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් මානව ගරුත්වයට ගරු කර ආරක්ෂා කළ යුතු අතර, සියලු පුද්ගලයන්ගේ මානව හිමිකම් පිළිගෙන ආරක්ෂා කළ යුතු වේ.

2. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් නීත්‍යානුකූලභාවය, අවශ්‍යතාවය, වෙනස්කොට නොසැලකීම, සමානුපාතිකත්වය සහ මනුෂ්‍යත්වය යන මූලධර්මවලට ගරු කළ යුතු ය.

3. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සෑම විටම නීතියේ සමාන ආරක්ෂාව වෙනස්කොට සැලකීමකින් තොරව ආරක්ෂා කර ප්‍රවර්ධනය කළ යුතු ය. සියලුම පුද්ගලයන් නීතිය ඉදිරියේ සමාන වන අතර, වෙනස්කොට සැලකීමකින් තොරව, නීතියේ සමාන ආරක්ෂාව ලැබීමට සියලු පුද්ගලයන්ට හිමිකම් ඇත.

4. ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, භාෂාව, වර්ණය, දේශපාලන මතය, ජාතික සම්භවය, දේපළ, උපත හෝ වෙනත් තරාතිරමක් මත ඔවුන්ට නීති විරෝධී ලෙස වෙනස් කොට සැලකීම නොකළ යුතු ය.

5. ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුව,කාන්තාවන්ගේ (ගර්භනී කාන්තාවන් සහ අලුත උපන් දරුවන් සිටින මව්වරුන් ඇතුළුව), බාලවයස්කරුවන්ගේ, රෝගීන්ගේ, වයස්ගතවූවන්ගේ, සහ විශේෂ ප්‍රතිකාර අවශ්‍ය අනෙකුත් අයගේ විශේෂ තත්ත්වයන් සහ අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කර ඇති ඇතැම් විශේෂ ක්‍රියාමාර්ග බලාත්මක කිරීම නීති විරෝධී සැලකීමක් හෝ වෙනස් කොට සැලකීමක් ලෙස නොසැලකිය යුතු ය.

6. වැඩිහිටියන්ට තිබිය යුතු බවට සහතික කර ඇති සියලුම මානව හිමිකම් වලින් ළමයින්ට ද ප්‍රතිලාභ ලැබිය යුතු ය. එයට අමතරව, ළමයාට සමාජ සංකලනය වීමට පහසුකම් සැලසෙන සහළමයාගේ උපරිම යහපත පිළිබිඹු කෙරෙන පරිදි; සහ එම වයසේ පුද්ගලයෙකුගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ළමයින්ගේ අභිමානය සහ වටිනාකම පිළිබඳ හැඟීම ප්‍රවර්ධනය වන ආකාරයෙන් සැලකිය යුතු ය.

7. ළමයින් රඳවා තබා ගැනීම හෝ සිරගත කිරීම අවසාන පියවරේ ආන්තික ක්‍රියාමාර්ගය විය යුතු අතර, රඳවා තබා ගැනීම කෙටිම කාලයක් සඳහා විය යුතු ය.

8. ළමයින් වැඩිහිටි රැඳවියන්ගෙන් වෙන් කර රඳවා තැබිය යුතු ය.

9. රඳවා සිටින ළමයින් බැලීමට පවුලේ සාමාජිකයන්ගේ පැමිණීමට සහ ඔවුන් සමග සන්නිවේදනයට අවස්ථා ව තිබිය යුතු ය.

10. රජයේ නිලධාරීන් හෝ පෞද්ගලික පුද්ගලයන් විසින් නිවසේ දී, ප්‍රජාව තුළ හෝ නිල ආයතන තුළ සිදු කරනු ලබන කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහි සියලු ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමට, විමර්ශනය කිරීමට සහ වරදකරුවන් අත්අඩංගුවට ගැනීමට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් නිසි උද්‍යෝගයෙන් කටයුතු කළ යුතු ය.

11. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් කාන්තාවන් වින්දිතභාවයට පත්වීම වැළැක්වීම සඳහා දැඩි නිල ක්‍රියාමාර්ග ගත යුතු අතර, පොලීසියේ නොකරහැරීම් හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී නොවන බලාත්මක කිරීමේ පිළිවෙත් හේතුවෙන් නැවත වින්දිතභාවයට පත්වීම සිදු නොවන බවට සහතික විය යුතු ය.

12. අත්අඩංගුවට ගත් හෝ රඳවාගෙන සිටින කාන්තාවන් වෙනස් කොට සැලකීමකට ලක් නොවිය යුතු අතර ඔවුන් සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් ගෙන් හෝ සූරාකෑම් වලින් ආරක්ෂා විය යුතු ය.

13. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් කවර තත්වයක් යටතේ හෝ වධහිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි භාවිතා නොකළ යුතු ය.

14. කිසිම පුද්ගලයෙකු ඔහුගේ හෝ ඇයගේ ගෞරවයට හෝ කීර්තියට හානි වන ආකාරයේ නීති විරෝධී ප්‍රහාරවලට ලක් නොකළ යුතු ය.

15. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සෑම විටම වින්දිතයින්ට සහ සාක්ෂිකරුවන්ට අනුකම්පාව දක්වමින් සහ අවධානය යොමු කරමින් සැලකිය යුතු ය.

16. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් අත් අඩංගුවට ගනු ලබන ඕනෑම අයෙකුට එසේ අත් අඩංගුවට ගැනීමට හේතුව වහාම දැනුම් දිය යුතු ය.

17. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් සිදු කරනු ලබන සෑම අත්අඩංගුවට ගැනීමක් පිළිබඳවම නිසි වාර්තාවක් පවත්වා ගෙන යා යුතු ය. මෙම වාර්තාවට පහත සඳහන් තොරතුරු ඇතුළත් විය යුතු ය: අත්අඩංගුවට ගැනීමට හේතුව; අත්අඩංගුවට ගත් වේලාව; අත්අඩංගුවට ගත් පුද්ගලයා රැඳවුම් ස්ථානයකට මාරු කරන ලද වේලාව; අධිකරණ බලධාරියෙක් වෙත ඉදිරිපත් කරනු ලබන වේලාව; අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ වූ නිලධාරීන්ගේ අනන්‍යතාවය; අත්අඩංගුවේ තබාගෙන සිටින ස්ථානය පිළිබඳ නිවැරදි තොරතුරු; සහ ප්‍රශ්න කිරීම් පිළිබඳ විස්තර.

18. අත් අඩංගුවට ගන්නා ඕනෑම අයෙකුට ඔහු හෝ ඇය අත්අඩංගුවට ගැනීමේ හෝ රඳවා තබා ගැනීමේ නීත්‍යානුකූලභාවය ප්‍රමාදයකින් තොරව සමාලෝචනය කරනු ලැබීමේ කාර්යය සඳහා අධිකරණ බලධාරියෙක් ඉදිරියේ අප්‍රමාදව පෙනී සිටීමට අයිතිය ඇත.

19. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හැකිතාක් දුරට වැඩිහිටියන්ගෙන් බාල වයස්කරුවන්;පිරිමින්ගෙන් කාන්තාවන්; සහ වැරදිකරුවන්ගෙන් වැරදිකරුවන් නොවන පුද්ගලයින් වෙන් කර රඳවා තැබීමට හැකි සෑම පියවරක්ම ගත යුතු ය.

20. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සෑම විටම නීතිය පිළිපදින බවට සහ නීතිය සහ මෙම රීති ආරක්ෂා කරන බවට සහතික විය යුතු ය.

EOG 07 - 0383

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.